1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත
1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත
2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත
2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත

එස්. ඩී. පී. ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්,
පෙබරවාරි, 2020.

පෙරවදන

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ භාවිතය උදෙසා සකස්කර ඇති "දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි" නැවත සංස්කරණය (හයවන සංස්කරණය) කිරීමේදී බද්ධ නිවාස අයිතිකම් පනතට අනුකූලවන පරිදි, සහාධිපත්‍ය පිඹුරු පිළියෙල කිරීම සම්බන්ධව වූ විධිවිධානයන්ද එයට ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනු අතර, ඒ සඳහා බද්ධ නිවාස අයිතිකම් පනත සම්පූර්ණයෙන්ම අධ්‍යයනය කිරීමට සිදුවිය. කෙසේ නමුත් 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතේ බොහෝමයක් වගන්ති, 1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් සංශෝධන පනත සහ 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් සංශෝධන පනත මගින් සංශෝධනයට ලක් වී තිබීමත් ඒ සියලු සංශෝධන එක් ලේඛනයකට අන්තර්ගතවී නොතිබීමත් හේතුවෙන් ප්‍රධාන පනත ගැඹුරින් අධ්‍යයනය කිරීම අපහසු බව නිරීක්ෂණය විය. එකී අපහසුතාවය මගහරවා ගනිමින් මෙම සහාධිපත්‍ය නිතීය පරිශීලනය කිරීමේ පහසුව අරමුණු කරගෙන ප්‍රධාන පනත වන 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතට, 1982 අංක 45 සහ 2003 අංක 39 දරන බද්ධ නිවාස අයිතිකම් සංශෝධන පනත් මගින් සිදු කරන ලද සියලු සංශෝධන ඇතුළත් කොට එක් ලියවිල්ලක් ලෙස මෙම ග්‍රන්ථය සකස්කරන ලදී. තවද 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනතද වෙනම අතිරේකයක් ලෙස ඇතුලත් කරන ලදී. මෙය කිසිසේත් පාර්ලිමේන්තු පනතක පුනර් මුද්‍රණයක් නොවන බවත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසිවල සහාධිපත්‍ය දේපල මැනුම් පරිච්ඡේදය (දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හයවන සංස්කරණයේ XVIII වැනි පරිච්ඡේදය) සඳහා අවශ්‍ය වන්නාවූ නීතිමය ප්‍රතිපාදන පිළිබඳ දැනුම ලබාදීම පිණිසම සකස් කරන ලද උපදෙස් ග්‍රන්ථයක් පමණක් බවත් අවධාරණය කරමි.

එස්. ඩී. පී. ජේ. දාම්පෙගම
සර්වේයර් ජනරාල්,
පෙබරවාරි, 2020.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන
බද්ධ නිවාස අයිතිවාසිකම් පනත

1982 අංක 45 දරන බද්ධ නිවාස
අයිතිවාසිකම් (සංශෝධන) පනත

2003 අංක 39 දරන බද්ධ නිවාස
අයිතිවාසිකම් (සංශෝධන) පනත

"ගොඩනැගිලි වල සභාධිපත්‍ය කොටස්වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම සඳහාද, ගොඩනැගිල්ල අනුබද්ධ පොදු අංගෝපාංග ඇති සභාධිපත්‍ය කොටස්වලට නැවත බෙදා වෙන් කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහාද, එම කොටස්වලට වෙන් වෙන් වශයෙන් අයිතිය ලබා ගැනීමට හැකි වීම පිණිස සහ ඒවායේ හිමිකම් බැහැර කිරීමට හැකි වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුශංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි." [§ 2003 අංක 39, (2)]

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය**

2. (අ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදිකරන ලද සහ (මෙහි මින් මතු "සභාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස් වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගෙඩනැගිල්ලකට; **පනත අදාල වීම** [§ 2003 අංක 39, (3)]

(ආ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත ඉදි කිරීමට යෝජිත සහ (මෙහි මින් මතු "තාවකාලික සහාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) කොටස්වලට නැවත බෙදා වෙන් කිරීමේ හැකියාව ඇති යම් ගොඩනැගිල්ලකට;

(ඇ) එක් ඉඩම් කොටසක් ලෙස දරනු ලබන අන්සතු ඉඩමක් මත අර්ධ වශයෙන් ඉදිකරනු ලැබ ඇති වූ ද මනුෂ්‍ය වාසය සඳහා සුදුසු (මෙහි මින් මතු "අර්ධ සහාධිපත්‍ය දේපළ" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්පූර්ණ කරන ලද සහාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලකට,

මේ පනත අදාල විය යුතු ය.

"සහාධිපත්‍ය පිඹුරක්, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම"
[§ 2003 අංක 39, (4)]

3. (1) අවස්ථාවෝචිත පරිදි යම් සහාධිපත්‍ය දේපලක හෝ යම් තාවකාලික සහාධිපත්‍ය දේපළක හෝ යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය පිඹුරක් හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා, නියමිත ආකෘති පත්‍රයේ වූ ඉල්ලීමක්, නියමිත ගාස්තුව සමග රෙජිස්ට්‍රාර් වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) 2 වන වගන්තිය යටතේ නැවත බෙදා, වෙන්කළ හැකි වූ ද පදිංචිය සඳහා හෝ භාවිතය සඳහා යෝග්‍ය බවට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයා විසින් සහතික කරනු ලැබුවා වූ ද සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් පිහිටා ඇති යම් ඉඩම් කොටසක අයිතිකරු විසින්, කවර හෝ අවස්ථාවක ඔහු විසින් විකුණා

ඇත්නම් හෝ විකිණීමට එකඟ වී ඇත්නම්:-

(අ) එසේ පළමු විකිණීමේ හෝ විකිණීමට එකඟවීමේ දින සිට මාස දහ අටක් ඇතුළත හෝ ඒ ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයට පෙර;

(ආ) ගොඩනැගිල්ලේ යම් කොටසක් පළමුවරට විකිණීම හෝ විකිණීමට එකඟවීම සිදු වූයේ එම ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දිනයට පසුව නම්, එම ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීමේ දින සිට මාස හයක් ඇතුළත,

අවස්ථාවෝචිත පරිදි (අ) හෝ (ආ) ඡේද වල නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත, නියමිත ගාස්තුව සමග නියමිත අකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් රෙජිට්‍රාර් වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සභාධිපත්‍ය පිඹුර ඒ ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව දීර්ඝ කිරීම සඳහා අයිතිකරු විසින්, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ අයිතිකරු විසින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, සාමාන්‍යාධිකාරීවරයා විසින්, රෙජිස්ට්‍රාර්වරයා විමසා මාස හයකට නොවැඩි කාලසීමාවක් තව දුරටත් ලබා දිය හැකිය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තෙක් අවස්ථාවෝචිත පරිදි වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමේදී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද සිදු කරන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් දහස බැගින් වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.''

''සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම''
[§ 2003 අංක 39, (5)]

3 අ. (1) (අ) සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ ''මුල් පිටපත'' සහ ''දෙවන පිටපත'' රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ''තුන්වන පිටපත සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් සමගම :-
(අ) නියමිත ගාස්තුව;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිල්ලේ සැලැස්මේ පිටපත් තුනක්;

(ඇ) 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් සභාධිපත්‍ය පිඹුරේ පිටපත් තුනක්;

(ඈ) අවසරය ලබා දුන් සැලැස්මට සහ පිරිවිතර වලට අනුකූලව ගොඩනැගිල්ල සාදනු ලැබූ බවටත් එම අවසරය ලබා දුන් දිනයන්, එම

අවසරයේ යොමු අංකයන් සඳහන් කරමින් සුදුසුකම්ලත් වාස්තු විශේෂඥයකු හෝ සුදුසුකම්ලත් සිවිල් සේවා ව්‍යුහ ඉංජිනේරුවකු විසින් නිකුත් කරන ලද සහතිකයක්;

(ඉ) (i) ඉඩමේ යම් බෙදීමකට;

(ii) සම්පූර්ණ ඉඩමේ හෝ එහි කොටසක බද්දකට;

(iii) එවැනි බද්දක යම් බෙදීමකට; හෝ

(iv) එම ඉඩම හෝ එම බද්ද සම්බන්ධ වූ යම් ඇපයකට;

යම් තැනැත්තෙකුට හිමිකම් ඇත්නම් එම තැනැත්තාගේ ලිඛිත කැමැත්ත;

(ඊ) ඉඩම පිහිටා ඇත්තේ සහ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට බලය ඇත්තේ යම් පළාත් පාලන අධිකාරියකට ද එම පළාත් පාලන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ අනුකූලතා සහතිකයක්;

(උ) ඉඩම් කොටස සඳහා වූ හිමිකම් සහතිකය;

එසේ වුව ද, ඉඩම් කොටසේ හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයෙහි නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයෙහි ඇති අවස්ථාවක එම හිමිකම් රෙජිස්ට්‍රාර් වරයා වෙත භාර දීම සඳහා සහතිකයේ පිටපතක් ඉල්ලීම් සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස එම අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් එම ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතු ය.

(ඉ) (i) ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන සහාධිපත්‍ය දේපළෙහි උකසක් ඇති අවස්ථාවකදී :-

(අ) සහාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් ලබා ගත් මුදල සහ එම මූල්‍ය ආයතනයේ නම;

(ආ) ඉහත කී උකස යටතේ ණයට ගත් සම්පූර්ණ මුදල සහ ලියාපදිංචි කිරීමට යෝජිත එක් එක් සහාධිපත්‍ය කොටසට එරෙහිව ලබා ගත් මුදල,

සම්බන්ධයෙන් විස්තර සඳහන් කරමින් ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක්;

(ii) ලියාපදිංචි කිරීමට යෝජිත සහාධිපත්‍ය දේපළ මත කිසිදු උකසක් නොමැති අවස්ථාවක අයිතිකරු විසින් ඒ පිළිබඳ ප්‍රකාශයක්;

(ඊ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුභසාධනය සහ සපයා ඇති පොදු පහසුකම් පිළිබඳව සෑහීමට පත්විය හැකි බවටත් සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් යොදා ඇති වැඩ පිළිවෙළ පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවටත් සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක්;

(ඒ) ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කරනු ලබන්නා වූ ද, ඉල්ලුම්කරු විසින් කරනු ලබන්නා වූ ද, ප්‍රකාශයක පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය :-

(i) ගොඩනැගිල්ල සාදා ඇති සහ හිමිකම ඉදිරිපත් කරන ඉඩම් කොටසේ කැඩැස්තර සිතියම උපයෝගී කර ගනිමින් එම ඉඩමේ මායිම්, ප්‍රමාණය සහ පිහිටීමද, එම ඉඩම් කොටස පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය, ගම, නාගරික කොට්ඨාසය, පත්තුව, කෝරළය හෝ වෙනත් කොට්ඨාසයක් හෝ දිස්ත්‍රික්කයක් සඳහන් කරමින් එම ඉඩමේ පිහිටීම පිළිබඳ විස්තරයක් සහ ඉඩම් කොටස පිහිටා ඇත්තේ යම් නගරයක නම් එම ඉඩම පිහිටි වීථියේ නම සහ වරිපනම් අංකය;

(ii) සභාධිපත්‍ය කොටසේ අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ නම සහ ලිපිනයන්;

(iii) හිමිකම් ඉදිරිපත් කිරීම සනාථ කිරීමේදී ඉල්ලුම්කරු විසින් විශ්වාසය තබා ඇති ඔප්පුවල, සාධන පත්‍රවල හෝ වෙනත් ලේඛන වල විස්තර සහ හිමිකම් පිළිබඳ වෙනත් සාක්ෂි;

(iv) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන

යටතේ හිමිකම ලියාපදිංචි කර ඇති කොටස, වෙළුම සහ පත්තිරුව පිළිබඳ සඳහනක් සහ ඉඩම් කොටස ලියාපදිංචි කර නැත්නම් ඉඩම් කොටස එසේ ලියාපදිංචි කර නොමැති බවට වූ ප්‍රකාශයක්;

(v) ඉල්ලුම්කරුගේ දැනීම අනුව ඉඩම් කොටසට බලපාන සෑම බැඳීමක්ම, විනිශ්චයට භාජනය වී ඇති නඩුවක් තහනමට ගැනීමක්, ආඥාවක් සේ තීන්දු ප්‍රකාශයක් පිළිබඳ විස්තර;

(vi) මහල් ගණන සහ පතුල් මහල් ගණන සහ සහාධිපත්‍ය කොටස් ප්‍රමාණය සඳහන් කරමින් ගොඩනැගිල්ල පිළිබඳ විස්තරයක්;

(vii) එක් එක් සහාධිපත්‍ය කොටස හඳුනා ගැනීමේ අංකයක් හෝ අන් සංකේතයක් සහ එහි පිහිටීම බිමෙහි වර්ගඵලය කාමර සංඛ්‍යාව, එයින් පිවිසිය හැකි ළඟම ඇති යම් පොදු ප්‍රදේශයක් සහ උපකාරක කොටසට අදාළ අනුරූප තොරතුරු ඇතුළු හඳුනා ගැනීමේ කාර්ය සඳහා වූ වෙනත් යම් තොරතුරු;

(viii) සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග පිළිබඳ විස්තරයක්;

(ix) උපකාරක කොටස් නිශ්චිත සහාධිපත්‍ය කොටස් වලට සම්බන්ධ වූවද එසේ නැති වූවද එය නොතකා අනුබද්ධව සිටින සහාධිපත්‍ය කොටස් නිශ්චිතව දක්වමින් සහාධිපත්‍ය දේපළේ උපකාරක කොටස් පිළිබඳ විස්තරයක්;

(x) සභාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග වලට එක් එක් සභාධිපත්‍ය කොටසේ ඇති නොබෙදූ හිමිකම් වටිනාකම;

(xi) එක් එක් සභාධිපත්‍ය කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංග වල නොබෙදූ හිමි කොටස් වල ප්‍රතිශතය;

(xii) ගොඩනැගිල්ල සහ එක් එක් සභාධිපත්‍ය කොටස භාවිත කිරීම සම්බන්ධයෙන් අදහස් කරනු ලබන සහ සීමා කරනු ලබන කාර්යයන් පිළිබඳ ප්‍රකාශයක්;

(xiii) අනාගත මිලදී ගන්නන්ගෙන් දැනටමත් ලබා ගෙන ඇති අත්තිකාරම් මුදල් පිළිබඳ ගිණුම් ප්‍රකාශයක් සහ සභාධිපත්‍ය පිඹුරෙහි සභාධිපත්‍ය කොටස් වෙන් කිරීම සඳහා ඔවුන්ගේ නම්;

(xiv) මේ නීතියට අනුකූලව සභාධිපත්‍ය දේපළට අදාළව ඉදිරිපත් කිරීම අවශ්‍යය යයි ඉල්ලුම්කරු විසින් සළකනු ලබන තවදුරටත් වූ තොරතුරු;

(xv) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ සැපයිය යුතු බවට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු;

(xvi) සභාධිපත්‍ය දේපළේ අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ අත්සන්;

(ඕ) අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචිය සිදු වන්නේ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් වන විට යොමු අංකය,

ඉදිරිපත් කළ යුතු ය.

"තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ලියාපදිංචි සඳහා වූ ඉල්ලීම."

3ආ. (1) (අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ලියාපදිංචිය සඳහා වූ සෑම ඉල්ලීමක්ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ "මුල් පිටපත" සහ "දෙවන පිටපත"රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර, " තුන්වන පිටපත" සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් සමඟම -

(අ) නියමිත ගාස්තුව;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මේ පිටපත් තුනක්;

(ඇ) 5 ආ වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් තාවකාලික සහාධිපත්‍ය පිඹුර;

(ඈ) (i) ඉඩම යම් බැඳීමකට;

(ii) ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් බද්දකට;

(iii) එවැනි බද්දක යම් බැඳීමකට; හෝ

(iv) ඒ ඉඩම පිළිබඳ ඇපයක් හෝ එවැනි බඳුදීමක

යම් තැනැත්තෙකුට හිමිකම් ඇත්නම්, එවැනි සෑම තැනැත්තෙකුගේම ලිඛිත කැමැත්ත;

(ඉ) ඉඩම් කොටස සඳහා හිමිකම් සහතිකය:

එසේ වුවද ඉඩම් කොටස සඳහා හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයෙහි නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තෙකුගේ සන්තකයෙහි ඇති අවස්ථාවක , හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දීම සඳහා සහතිකයේ පිටපතක් ඉල්ලීමේ සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් අයිතිකරු විසින් අනෙක් තැතැත්තා 'වෙත' කරනු ලබන ඉල්ලීමක පිටපතක් එම ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) (i) යෝජිත ගොඩනැගිල්ලට සැලැස්විය යුතු පොදු පහසුකම් සඳහා අවශ්‍ය විධි විධාන, අනුමත ගොඩනැගිලි සැලැස්මෙහි සලසා ඇති බවට;

(ii) කළමනාකරණ සංස්ථාව විසින් පොදු අංගෝපාංග යථා පරිදි පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හෝ කළමනාකරණය කිරීම සහතික කිරීම පිණිස යෝජිත ගොඩනැගිලි සැලැස්මෙහි යෝජිත ගොඩනැගිල්ලෙහි පොදු අංගෝපාංග නිසි පරිදි සැලසුම් කර ඇති බවට,

සහතික කරමින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක්;

(උ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මූල්‍යාධාර තිබෙන බව සඳහන් කරමින් පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබා ගත්

සහතිකයක් මගින් සනාථ කරනු ලබන එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අරමුදල් තිබෙන බවට;

(ii) තාවකාලික සහාධිපත්‍ය දේපළ උකස් කිරීමෙන් දැනටමත් උපයා ගෙන ඇති හෝ උපයා ගැනීමට අදහස් කරන මුදල් පිළිබඳ තොරතුරු සහ එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස හෝ කොටස්වලට එරෙහිව ලබා ගත් හෝ ලබා ගැනීමට නියමිත මුදල සහ පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබා ගත් සහතිකයක් මගින් සනාථ කරනු ලබන ඒ මූල්‍ය ආයතනයේ නම පිළිබඳව,

ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයක්;

(ඍ) සුදුසුකම් ලත් ප්‍රමාණ මිනින්දෝරුවරයකු හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු විසින් සත්‍යායනය කරනු ලබන ඉදි කිරීම් පිළිබඳ වියදම් ස්ථිර කිරීමේ මූල්‍ය වාර්තාවක්;

(එ) අවස්ථාවෝචිත පරිදි සුදුසුකම් ලත් වාස්තු විද්‍යාඥයකු හෝ සුදුසුකම් ලත සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් සනාථ කරනු ලබන පහත දැක්වෙන එක් එක් ඉදි කිරීම් කටයුත්ත ආරම්භ කිරීමට යෝජිත දිනය සඳහන් කරමින් සම්පූර්ණ ඉදි කිරීම පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම:-

(i) අත්තිවාරම් කණු;

(ii) බිත්ති ඉදිකිරීම;

(iii) මහල් ඉදිකිරීම;

(iv) වහල ඉදිකිරීම;

(v) මනුෂ්‍ය වාසය සඳහා සුදුසු ප්‍රමාණයට අවසාන ඉදිකිරීම් කටයුතු කිරීම;

(ඒ) 3අ වගන්තියේ (2) උප වගන්තියේ (ඒ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවය ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්,

ඉදිරිපත් කළ යුතු ය. ”

“අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

3ඇ. (1) (අ) අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම පිටපත් තුනකින් යුක්තව නියමිත ආකෘති පත්‍රයේදී ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඒ ඉල්ලීමේ “මුල් පිටපත” සහ “දෙවන පිටපත” රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර “තුන්වන පිටපත” සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් සමඟම -

(අ) නියමිත ගාස්තුව;

(ආ) සැලසුම් අධිකාරිය විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මේ පිටපත් තුනක්;

(ඇ) 5 ආ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් අර්ධ සහාධිපත්‍ය පිඹුර;

(ඈ) (i) ඉඩම් යම් බද්දකට;

(ii) සම්පූර්ණ ඉඩමේ හෝ එහි යම් කොටසක බද්දක;

(iii) එවැනි බද්දක යම් බැඳීමකට; හෝ

(iv) එම ඉඩම හෝ එවැනි යම් බද්දක් පිළිබඳ ඇපයක,

යම් තැනැත්තෙකුට හිමිකම් ඇත්නම්, එවැනි සෑම තැනැත්තෙකුගේම ලිඛිත කැමැත්ත;

(ඉ) ඉඩම් කොටසේ හිමිකම් සහතිකයක්: එසේ වුවද ඉඩම් කොටස හිමිකම් සහතිකය අයිතිකරුගේ සන්තකයේ නොමැති අවස්ථාවක සහ වෙනත් යම් තැනැත්තෙකුගේ සන්තකයේ ඇති අවස්ථාවක හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීම් සඳහන් දින සිට දින දාහතරක් ඇතුලත සහතිකය ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් එම අයිතිකරු විසින් අනෙක් තැනැත්තා වෙත කරනු ලබන ඉල්ලීමක පිටපතක් ම ඉල්ලුම් පත්‍රයට අමුණා තිබිය යුතු ය.

(ඊ) සහධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය සහ සුභසාධනය සඳහා සපයනු ලබන පොදු පහසුකම් පිළිබඳව සෑහීමකට පත් විය හැකි බවටත් සහධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංගවල පාලනය, පරිපාලනය, නඩත්තුව සහ කළමනාකාරිත්වය පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවටත් සහතික කරමින් සහධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක්;

(උ) ඉඩම පිහිටා ඇත්තේ සහ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට බලය පැවරී ඇත්තේ යම් පළාත් පාලන අධිකාරියට ද ඒ පළාත් පාලන අධිකාරියෙන් ලබා ගත් අනුකූලතා සහතිකයක් ;

(ඌ) අර්ධ සහධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කර ඇති සම්පූර්ණ කරන ලද සහධිපත්‍ය

කොටස් සහ තාවකාලික සහධිපත්‍ය කොටස් අනුමත සැලසුම් සහ පිරිවිතර වලට අනුකූලව ඇද ඇති බවට එම සැලසුම් සහ පිරිවිතර අනුව අවසරය ලබා දුන් බවටත් එම අවසරය ලබා දුන් දිනය සහ එහි යොමු අංකය සඳහන් කරමින් අවස්ථාවෝචිත පරිදි සුදුසුකම්ලත් වාස්තු විද්‍යාඥයකුගෙන් හෝ සුදුසුකම් ලත් වෘත්තීයමය සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු ගෙන් ලබාගත් සහතිකයක් ;

(එ) අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචිය සිදු වන්නේ අර්ධ සභාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුරක වනවිට යොමු අංකය;

(ඒ) (i) උගසක් ඇති අවස්ථාවක ඉල්ලුම්කරු විසින්-

(අ) සභාධිපත්‍ය දේපල උගස් කිරීමෙන් දැනටමත් ලබාගෙන ඇති මුදල් සහ ඒ මූල්‍ය ආයතනයේ නම;

(ආ) ඉහත කී උගස යටතේ ණයට ගත් සම්පූර්ණ මුදල සහ ලියාපදිංචි කිරීමට යෝජිත එක් එක් සහධිපත්‍ය කොටසට එරෙහිව ලබාගත් මුදල,

පිළිබඳ ප්‍රකාශයක්;

(ii) ලියාපදිංචි කිරීමට යෝජිත සහධිපත්‍ය දේපල පිළිබඳව කිසිම උගසක් නොමැති අවස්ථාවක අයිතිකරු විසින් එම කරුණ පිළිබඳ ප්‍රකාශයක්;

(ඔ) 3ආ වගන්තියේ (2) උපවගන්තියේ (ඒ) ඡේදයේ අවශ්‍යතා අඩංගුව ඇති ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන

ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්,
ඉදිරිපත් කළ යුතු ය.

"ඉඩම් වලට බලපාන සාධන පත්‍රයක් බව."

4. සහධිපත්‍ය පිඹුරක් හෝ නැවත බෙදා වෙන් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක් හෝ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ කාර්යයන් සඳහා ඉඩම් වලට බලපාන සාධනපත්‍රයක් ලෙස සැලකිය යුතු ය.

"සහාධිපත්‍ය පිඹුර"
[§ 1982 අංක 45, (4)]

[§ 2003 අංක 39, (6)]

5. (1) සහාධිපත්‍ය පිඹුරකට, බලයලත් මිනින්දෝරුවරයකු හෝ මිනුම්පති වරයාගේ අධිකාරිය මගින් හෝ එය යටතේ සකස් කොට අදිනු ලැබූ මිනුම් පිඹුරක් හෝ පිඹුරු ඇතුලත් විය යුතු අතර-

(අ) සහාධිපත්‍ය දේපලේ මතුපිට මායිම් සහ මායිම් සලකුණු සහ ඒ මත පිහිටා ඇති එක් එක් නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ල මතුපිට මායිම් වලට අදාළව පිහිටීම රූප රේඛනය කළ යුතු ය;

(ආ) ඉඩම් කොටස ලියා පදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම සහ පත්‍රිරුව එසේම එහි මනින ලද ප්‍රදේශයද නිශ්චිතව දැක්විය යුතු ය.

(ඇ) (i) එක් එක් මහලේ බිම් ප්‍රමාණය සහ සීලිම ද;
(ii) එක් එක් මහලේ උසද,

පෙන්නුම් කරමින් එක් එක් නැවත බෙදා වෙන්කරන ලද ගොඩනැගිල්ලේ සිරස් කොටසක් ඇතුළත් විය යුතු ය;

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය දරන බලධරයා

විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන් කිරීමේ සැලසුම් වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලක් ලෙස සහාධිපත්‍ය දේපල ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් පැතිකඩක් සහ එහි දිග සහ පළල ද ඇතුළත් විය යුතු ය;

(ඉ) එක් එක් සහධිපත්‍ය කොටසේ (2) සහ (3) උප වගන්තිවල විධිවිධාන වලට යටත් ව රූප රේඛනය කළ යුතු අතර යම් දිගාංශයන් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, තිරස් දිග සහ පළල පෙන්නුම් කරමින් බිමේ ප්‍රමාණය සහ බිත්ති පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතු ය;

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන්කර ඇති සහධිපත්‍ය කොටස් හඳුනා ගතයුතු අතර වරිපනම් අංක, අංක හෝ වෙනත් සලකුණු මගින් එම කොටස් වෙන්කොට දැක්විය යුතු ය;

(උ) සහාධිපත්‍ය දේපළේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනාගැනීමේ ප්‍රලේඛන අකුරක් මගින් එක් එක් මහල වෙන්කොට දැක්විය යුතු අතර එක් එක් මහලේ අංකයට අදාලව ඒ මහලේ ඇති සහාධිපත්‍ය කොටස් දැක්විය යුතු ය; [§ 1982 අංක 45, (4)]

(ඌ) එක් එක් සහාධිපත්‍ය කොටසෙහි ආසන්නතම බිම් ප්‍රමාණය පෙන්විය යුතු ය;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත් කාලයෙහි බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදා වෙන් කළ සැලසුම්වලට අනුකූලව සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන්කළ ගොඩනැගිල්ලක් ලෙස සහාධිපත්‍ය දේපළ ඇතුළත ඉදිකරනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලේ යම් දිගාංශයක් පෙන්වීමේ අවශ්‍යතාවයක් නොමැතිව, බාහිර මායිම් රූප රේඛනය කොට ඒවායේ තිරස් දිග, පළල පෙන්නුම් කළ යුතු ය;

(ඒ) සහාධිපත්‍ය දේපළෙහි පොදු අංගෝපාංග නිර්ණය කළ යුතු ය;

(ඔ) සහාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති ගොඩනැගිල්ල සහාධිපත්‍ය දේපළෙහි බාහිර තිරස් මායිම් ඇතුළත පිහිටා ඇති බවට එය පිළියෙල කරන තැනැත්තා විසින් කරනු ලබන සටහනක් තිබිය යුතු ය;

(ඕ) එහි පෙන්වා පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් සහාධිපත්‍ය දේපළ මත පිහිටා ඇති සහාධිපත්‍ය කොටස්ම බවට ලියා පදිංචි වාස්තු විද්‍යාඥයකු හෝ ලියා පදිංචි වෘත්තීයමය සිවිල් ව්‍යුහ ඉංජිනේරුවකු විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එයට අමුණා තිබිය යුතු ය;

(ක) 20අ වගන්තියේ විධිවිධානවලට අනුකූලව සැලැස්මෙහි ඇති එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම ඇතුළත් කළ යුතු ය;

(ග) සහාධිපත්‍ය දේපළේ බාහිර මතුපිට මායිම්වලට අදාළව සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති සියලු ගොඩනැගිලි සහ සියලු සහාධිපත්‍ය කොටස් සහාධිපත්‍ය දේපල ඇතුළත පිහිටා ඇති බවටද ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි සැලසුම් සහ උප බෙදීමේ සැලසුම් වලට අනුකූල වන බවටද බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මගින් කරන ලද සටහනක් තිබිය යුතු ය;

(ච) එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම සම්පූර්ණ සංඛ්‍යාවලින්ද සියලුම සහාධිපත්‍ය කොටස්වල මුළු හිමිකම් වටිනාකමේ අයිතිය සමාන සංඛ්‍යාවක් ද පෙන්නුම් කළ යුතු ය;

(ජ) 20ග වගන්තියට අනුකූලව කළමනාකාර සංස්ථාව වෙත ලේඛන භාරදිය හැකි ලිපිනය එහි සටහන් කර තිබිය යුතු ය; සහ

(ට) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ඇතුළත් විය යුතු ය;

(2) උපකාරක කොටසක ගොඩනැගිල්ලකින් සහ බාහිර බිත්ති කීපයකින්, බිමකින් සහ සිවිලිමකින් සමන්විත වන අවස්ථාවක ඒ උපකාරක කොටසේ දිග පළල සහ මායිම් (1) උප වගන්තියේ නියමයන්ට අනුකූලව සහාධිපත්‍ය පිඹුරෙහි පෙන්නුම් කළ යුතු ය.

(3) උපකාරක කොටසක් ගොඩනැගිල්ලකින් සමන්විත නොවන අවස්ථාවක-

(අ) ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයෙහි වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් සහ නැවත බෙදන ලද සැලසුම්වලින් උපකාරක කොටස්වල බාහිර මායිම් දැනගත යුතු අතර, සහාධිපත්‍ය දේපල වෙනත් කොටසක් මගින් බිම් මට්ටමට ඉහතින් වූ යම් දීර්ඝ කිරීමකට හෝ බිම් මට්ටමකට පහළින් වූ ප්‍රසර්පණයක ප්‍රමාණයට හැර උපකාරක කොටසේ සිරස් දිග පළල සීමා රහිත විය යුතු ය; සහ

(ආ) සහාධිපත්‍ය පිඹුරෙහි (අ) ඡේදයෙහි සඳහන් අනුමත සැලසුම් මත පෙන්වා ඇති සමාන දිග පළල ඇති උපකාරක කොටස්වල රූපසටහන් පෙන්නුම් කළ යුතු ය.

(4) සහාධිපත්‍ය පිඹුරෙහි අන් ආකාරයකින් නියම කර ඇත්නම් මිස, වෙනත් සහාධිපත්‍ය කොටසක හෝ පොදු අංගෝපාංගයක් සමග ගත් කල යම් සහාධිපත්‍ය පිඹුරක හෝ මායිම් විය යුත්තේ අවස්ථාවෝචිත පරිදි බිම් ප්‍රමාණයේ බිත්තිවල හෝ සිවිලිමේ මධ්‍යස්ථානයේ ය.

"තාවකාලික සහාධිපත්‍ය පිඹුර."
[§ 2003 අංක 39, (7)]

5. **අ.** තාවකාලික සහාධිපත්‍ය පිඹුර බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට අඳිනු

ලැබිය යුතු අතර එම සැලැස්මට පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය:-

(අ) යෝජිත සභාධිපත්‍ය දේපළෙහි බාහිර මතුපිට මායිම් සහ මායිම් සලකුණු රූප රේඛනය කළ යුතු අතර මතුපිට මායිම්වලට අදාළව එය මත ඉදිකිරීමට අපේක්ෂිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තත්ත්වය;

(ආ) ඉඩම් කොටස ලියාපදිංචි කර ඇති කොට්ඨාශය, වෙළුම සහ පත්ඉරුව සහ එහි මනින ලද ප්‍රදේශය දැක්විය යුතු ය;

(ඇ) (i) එක් එක් මහලෙහි බිම් ප්‍රමාණය සහ සීලිම ද; සහ

(ii) එක් එක් වහලයේ උස පෙන්නුම් කරමින් ඉදිකිරීමට යෝජිත එක් එක් නැවත බෙදන ලද ගොඩනැගිල්ලේ තිරස් කොටසක් විය යුතු ය;

(ඈ) ගොඩනැගිලි අනුමත කිරීම සඳහා වගකිවයුතු තත්කාලය සඳහා වූ අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුලත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ විස්තරයක් සහ ඒ ගොඩනැගිල්ලේ සිරස් කොටසක් සහ දිග පළල;

(ඉ) 5 වන වගන්තියේ (2) සහ (3) උප වගන්ති වල විධිවිධාන වලට යටත් ව එක් එක් යෝජිත සභාධිපත්‍ය කොටස ආලේඛනය කළ යුතු අතර, යම් පිහිටීමේ

ස්වභාවය පෙන්නුම් කිරීමක් නොමැතිව දිග සහ පළල නිසා පෙන්නුම් කරමින් බිම් ප්‍රමාණය සහ බිත්තින් පිළිබඳව සඳහන් කරමින් එහි මායිම් නිර්ණය කළ යුතු ය;

(ඊ) එක් එක් යෝජිත සහාධිපත්‍ය කොටස් හඳුනාගත යුතු අතර වරිපනම් අංක වලින්, අංක වලින් හෝ වෙනත් සංකේත වලින් එම කොටස් පැහැදිලිව පෙන්නුම් කළ යුතු ය;

(උ) කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මගින් එක් එක් යෝජිත මහල වෙන් වශයෙන් හඳුනා ගත යුතු අතර, එක් එක් මහලේ අංකයට අදාල එක් එක් මහලේ පිහිටි යෝජිත සහාධිපත්‍ය කොටස නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය;

(ඌ) එක් එක් යෝජිත කොටසෙහි ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම කළ යුතු ය;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයේ වගකිව යුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ඉදිකිරීමට යෝජිත එක් එක් ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව බාහිර මායිම් ආලේඛනය කොට තිරස් මිමි පෙන්නුම් කළ යුතු ය;

(ඒ) තාවකාලික සහාධිපත්‍ය දේපළින් තාවකාලික පොදු අංගෝපාංග නිර්ණය කළ යුතු ය;

(ඔ) එක් එක් යෝජිත සහාධිපත්‍ය පිඹුරේ තාවකාලික හිමිකම් වටිනාකම් සම්පූර්ණ අංකවලින් පෙන්නුම් කළ යුතු අතර, සියලුම යෝජිත සහාධිපත්‍ය කොටස්වල තාවකාලික හිමිකම් වටිනාකම්වල මුළු එකතුව සමාන අංක වලින් ද පෙන්නුම් කළ යුතු ය;

(ඕ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ල ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල වන බවට එකී සැලැස්ම පිළියෙල කළ තැනැත්තා විසින් සටහනක් කර තිබිය යුතු ය.

“අර්ධ සහාධිපත්‍ය පිඹුර”

5.ආ. (1) අර්ධ සහාධිපත්‍ය පිඹුරක් බලයලත් මිනින්දෝරුවරයකු විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ සකස් කොට ඇඳිය යුතු අතර එහි පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය:-

(අ) අර්ධ සහාධිපත්‍ය දේපළෙහි බාහිර භූතල මායිම් සහ මායිම් සලකුණු ද භූතල මායිම්වලට අදාළව ඒ මත පිහිටා ඇති එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලේ පිහිටීම ද භූතලමායිම් වලට අදාළව ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා වන අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ

ඉතිරි කොටසේ පිහිටීමද ආලේඛනය කිරීම;

(ආ) ඉඩම් කොටස ලියා පදිංචි කර ඇති කොට්ඨාසය, වෙළුම, සහ පිටුව සහ එහි මනින ලද ප්‍රදේශය නිශ්චිතවම දැක්වීම;

(ඇ) (i) එක් එක් වහලේ ගෙබිම සහ සීලිම; සහ
(ii) එක් එක් මහලේ උස පෙන්නුම් කරමින් එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද නැවත බෙදා වෙන් කළ ගොඩනැගිල්ලේ සිරස් කඩක්;

(ඈ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටසෙහි ඉදිකරන ලද අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ විස්තරයක් සහ එහි සිරස් කඩක් සහ දිග පළල ද එසේ ම එම ඉඩම් කොටස මත ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසේ සිරස්කඩක් සහ දිග පළල ද ඇතුළත් කළ යුතු ය;

(ඉ) 5 වන වගන්තියේ (2) සහ (3) උප වගන්ති වල විධිවිධානවලට යටත්ව අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැඟිල්ලේ එක් එක් සහාධිපත්‍ය කොටස් රූප රේඛනය කළයුතු අතර දිගංශයන් පෙන්වීමේ අවශ්‍යතාවක් නොමැතිව තිරස් මාන දැක්වෙන පරිදි ගෙබිම සහ බිත්ති වලට අනුව එහි මායිම් නිර්ණය කිරීම;

(ඊ) එක් එක් ගොඩනැගිල්ල බෙදා වෙන් කිරීමට අදහස් කරනු ලබන අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සහාධිපත්‍යය කොටස් හඳුනාගැනීම සහ වරිපනම් අංක වලින්, අංක වලින් හෝ වෙනත් සලකුණු වලින් එක් එක් කොටස වෙන් වශයෙන් හඳුනා ගැනීම;

(උ) කැඩැස්තර සිතියමේ ඉඩම් කොටස් අංකයට අදාළව හඳුනාගැනීමේ අකුරක් මගින් එක් එක් මහල වෙන් වශයෙන් හඳුනාගැනීම සහ එම මහලේ අංකයට අදාළව එක් එක් මහලෙන් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස නිශ්චිතව දැක්වීම;

(ඌ) එක් එක් කොටසේ ආසන්නතම බිම් ප්‍රමාණය දැක්වීම;

(එ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා තත්කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට අනුකූලව ඉඩම් කොටස ඇතුළත ද ඉදිරි කරන ලද එක් එක් අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ පිහිටීම පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැතිව බාහිර මායිම් හා ආලේඛනය කිරීම සහ තිරස් දිග පළල පෙන්නුම් කිරීම;

(ඒ) අර්ධ සහාධිපත්‍ය දේපළෙහි පොදු අංගෝපාංග නිර්ණය කිරීම;

(ඔ) අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැඟිල්ලේ එක් එක් සහාධිපත්‍ය කොටසේ සහ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ

කිරීමට ඇති ගොඩනැගිල්ලේ ඉතිරි කොටසෙහි එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටසේ සම්පූර්ණ සංඛ්‍යා වල හිමිකම් වටිනාකම පෙන්වීම සහ සියලුම සහාධිපත්‍ය කොටස්වල සහ එක් එක් සහාධිපත්‍ය කොටසේ හිමිකම් වටිනාකම් වල මුළු එකතුවට සමාන අංකයක්ද පෙන්නුම් කිරීම;

(ඕ) අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති අර්ධ වශයෙන් සම්පූර්ණ කළ ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා තත්කාලයේ බලය දරන බලධරයා විසින් අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලැස්මට අනුකූල බව එකී සැලැස්ම පිළියෙල කළ තැනැත්තා විසින් සටහනක් කර තිබිය යුතු ය.

"සහාධිපත්‍යය පිඹුරු ඒකාබද්ධ කිරීමේ හෝ නැවත බෙදා වෙන්කිරීමේ පිඹුරු ලියා පදිංචි කිරීම සහ එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට විරුද්ධ අභියාචනා."
[§ 2003 අංක 39, (8)]

6. (1) සහාධිපත්‍යය පිඹුරක් හෝ "තාවකාලික සහාධිපත්‍යය පිඹුරක්" හෝ "අර්ධ සහාධිපත්‍ය පිඹුරක්" ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන කිසියම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ සංශෝධන පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8ආ වගන්තිය යටතේ ඉල්ලීමක් හෝ නැවත බෙදන ලද පිඹුරක් හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 12 වන වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් හෝ සංකලන

පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා 8අ වගන්තිය යටතේ වන යම් ඉල්ලීමක් ලැබීමෙන් පසු, රෙජිස්ට්‍රාර් විසින්, අවස්ථාවෝචිත පරිදි සභාධිපත්‍යය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකලන පිඹුරු ඇතුළුව ඒ ඉල්ලීම හා කැඩැස්තර සිතියම් සහතික කිරීම සඳහා මිනින්දෝරු වරයා වෙත යොමු කළ යුතු ය.

[§ 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත මගින් හඳුන්වාදෙන ලද ව්‍යතිරේක සඳහා එම පනත අතිරේක කොටසක් ලෙස පිටු 155-161 දක්වා ඇතුලත් කරන ලදී.]

(2) අවස්ථාවෝචිත පරිදි සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍යය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ සංශෝධන පිඹුර හෝ නැවත බෙදන ලද පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ සංකලන පිඹුර මේ පනතේ විධිවිධානවලට හා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූල වන බවට මිනින්දෝරුවරයා සෑහීමකට පත්වන අවස්ථාවක සර්වේයර් ජනරාල්වරයා වෙනුවට ඒ පිඹුර ඔහු විසින් සහතික කරනු ලැබිය යුතු අතර:-

(අ) හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා භාවිත වන කැඩැස්තර සිතියමට අනුව, සුදුසු සඳහන් කිරීම් දැක්වීමෙන් පසුව හා අවශ්‍ය සංශෝධන හෝ වෙනස් කිරීම් හෝ අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් හෝ සංයුක්ත කිරීම් වලින් පසුව අවස්ථාවෝචිත පරිදි සභාධිපත්‍යය පිඹුරු හෝ තාවකාලික සභාධිපත්‍යය පිඹුරු හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරු හෝ සංශෝධන පිඹුරු හෝ නැවත බෙදන ලද පිඹුරු හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරු හෝ සංකලන

පිඹුරු මුල්පිටපත් ගොනු කළ යුතු ය; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය සඳහන් කිරීම් හෝ සංශෝධන නැතහොත් අතුරු බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් සිදුකිරීමෙන් පසුව කැඩැස්තර සිතියම සමග ඒ පිඹුරේ සහ ඉල්ලීමේ අනුපිටපත් නිසි රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මිනින්දෝරු වරයා විසින් නිසි ලෙස සහතික කරන ලද කැඩැස්තර සිතියමක් ලැබීමෙන් පසු, ඒ ඉල්ලීම මේ පනතේ විධිවිධානවලට සහ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින්:-

(අ) ඉල්ලීම, සභාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී-

(i) සභාධිපත්‍ය පිඹුරේ අනුපිටපත සභාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය;

(ii) සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් හිමිකම් නාම ලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාම ලේඛනයේ සහ ඉඩම් කොටස් ලියාපදිංචි කර ඇත්තාවූ නාම ලේඛනයේ හා තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ මීට පෙර ලියා පදිංචි කර තිබෙන්නේ නම් එම තාවකාලික සභාධිපත්‍ය පිඹුර

හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇත්තාවූ නාම ලේඛනයේ සුදුසු හරස් විමසුම් යොමු සටහන් යෙදිය යුතු ය;

(iii) නාම ලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයේ දේපළ කොටසේ සටහන් කළ යුතු ය;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරබයා පවතින උසස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදුදීම්, විකිණීම සඳහා වූ ගිවිසුම් විනිශ්චයට භාජනයවීම, තහනමකට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී ලෙසින් සහාධිපත්‍යය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එවැනි එක් එක් සහාධිපත්‍යය කොටස් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතික පත්‍ර කොටසේ සටහන් කළ යුතු ය;

(v) (මෙහි මින් මතු, "ලියාපදිංචිකළ සහාධිපත්‍ය පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) එම සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයත් සමග අදාළ නාම ලේඛන වල යොමු අංක පිළිබඳ වද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය;

(vi) නියමිත ගාස්තු ලැබුණු පසු තනි පුද්ගලික සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(vii) (ආ) ඉල්ලීම, තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී:-

(i) තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපත තාවකාලික සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය;

(ii) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් නාම ලේඛනය තුළ අලුත් තාවකාලික හිමිකම් නාමලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර ඒ ඉඩම් කොටස් ලියාපදිංචි කර තිබෙන්නාවූ නාම ලේඛනය තුළ වූ එම නාම ලේඛනය සුදුසු හරස් විමසුම් යොමු සටහන් යෙදිය යුතු ය;

(iii) නාම ලේඛනයෙහි ඇතුළත් වන ඉඩම් වල පොදු දේපළ පමණක් අඩංගු වන බව, ඉඩම් කොටසට අදාළ වන්නාවූ නාම ලේඛනයේ දේපළ කොටසේ සඳහන් කළ යුතු ය;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරබයා පවතින උසස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදු දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී

ලෙසින් සහාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ බැඳුම් සහතිකපත්‍ර කොටසේ සටහන් කළ යුතු ය;

(v) (මෙහි මින් මතු, "ලියාපදිංචිකළ තාවකාලික සහාධිපත්‍ය පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) එම තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයත් සමග අදාළ නාම ලේඛනවල යොමු අංක පිළිබඳවද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය;

(vi) නියමිත ගාස්තු ලැබුණු පසු පුද්ගලික තාවකාලික සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඇ) ඉල්ලීම, අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී:-

(i) අර්ධ සහාධිපත්‍ය අනු පිටපත අර්ධ සහාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය;

(ii) අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාම ලේඛනයේ අලුත් හිමිකම් නාම ලේඛන ගොනුවක් විවෘත කළ යුතු අතර එම නාම ලේඛනයේ සහ ඉඩම් කොටස් ලියාපදිංචි කර තිබෙන්නාවූ නාමලේඛනය හා

තාවකාලික සහාධිපත්‍ය පිඹුර මීට පෙර ලියාපදිංචි කර තිබෙන්නේ නම් ඒ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර තිබෙන්නාවූ ලේඛනයේ සුදුසු හරස් විමසීම් යොමු සටහන් යෙදිය යුතු ය;

(iii) නාම ලේඛනයේ ඇතුළත් වන ඉඩම්වල පොදු දේපළ පමණක් අඩංගු වන බව ඉඩම් කොටසට අදාළ වන්නා වූ නාම ලේඛනයෙහි දේපල කොටසේ සඳහන් කළ යුතු ය;

(iv) එක් එක් සහාධිපත්‍ය කොටස් අරබයා පවතින උසස් කිරීම් සහ ඒ මත ලබාගත් මුදල් ප්‍රමාණයන් සහ බදු දීම්, විකිණීම සඳහා වූ ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමක්, නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ආදී ලෙසින් සහාධිපත්‍ය කොටස්වලට බලපාන කිසිවක් වේ නම් ඒ සියලු බැඳීම් පිළිබඳ විස්තර අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වූ නාමලේඛනයේ බැඳුම් සහතිකපත්‍ර කොටසේ සටහන් කළ යුතු ය;

(v) (මෙහි මින් මතු, "ලියාපදිංචිකළ අර්ධ සහාධිපත්‍ය පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) එම අර්ධ සහාධිපත්‍ය පිඹුරේ ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයත් සමග අදාළ නාම ලේඛන වල යොමු අංක පිළිබඳ

වද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය;

(vi) නියමිත ගාස්තු ලැබුණු පසු තනි පුද්ගලික සභාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් අර්ධ සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඇ) ඉල්ලීම, ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරක හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ සංශෝධනය කිරීමේ යම් පිඹුරක් හෝ නැවත බෙදන ලද යම් පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරක් හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරක් ඒකාබද්ධ කිරීම සඳහා වන කිසියම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී:-

(i) සංශෝධන පිඹුරේ හෝ නැවත බෙදන ලද පිඹුරේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරේ අනුපිටපත් අදාළ සභාධිපත්‍ය කොටස් ගොනුවේ ගොනු කළ යුතු ය;

(ii) ලියා පදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියා පදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති එක් එක් සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් වන අවශ්‍ය සඳහන් කිරීමේ නාම ලේඛනයේ සටහන් කළ යුතු අතර ලියාපදිංචි කරන ලද සභධිපත්‍ය පිඹුරේ මුල් පිටපතේ හෝ ලියා පදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ මුල් පිටපතේ අවශ්‍ය යොමු සටහන් යෙදිය යුතු ය;

(iii) ලියා පදිංචි කරන ලද සභධිපත්‍ය පිඹුරක හෝ ලියා පදිංචි කරන

ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරක ඇති එවැනි සංශෝධන හෝ නැවත බෙදීම් හෝ ඒකාබද්ධ කිරීම් ලියාපදිංචිකර තිබෙන්නා වූ බවට ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු අතර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වූ නිවේදනයත් සමග අදාළ නාම ලේඛන වල යොමු අංක පිළිබඳවද ඉල්ලුම්කරුට දැන්විය යුතු ය;

(iv) නියමිත ගාස්තු ලැබීමේදී, තනිපුද්ගල සහධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් නව සහාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඉ) ඉල්ලුම්පත්‍රය, ලියා පදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් සංශෝධනය කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී:-

(i) ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ අනුපිටපතක් අදාල තාවකාලික සහාධිපත්‍යය කොටස් ලිපි ගොනුවේ ගොනු කළ යුතු ය;

(ii) ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍යය කොටස් සම්බන්ධයෙන් තාවකාලික සහාධිපත්‍ය හිමිකම් ලේඛනයෙහි අවශ්‍ය සටහන් කළ යුතු අතර ලියා පදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ මුල් පිටපතේ අවශ්‍ය යොමු සටහන්ද කරනු

ලැබිය යුතු ය;

(iii) එක් එක් සංශෝධිත තාවකාලික සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් සහධිපත්‍ය කොටස් වලට බලපාන උකස් කිරීම සහ එක් එක් සභාධිපත්‍යය කොටසට එරෙහිව ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණයන් එසේම බදු, විකිණීම සඳහා ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමේ ආඥා හෝ තීන්දු ප්‍රකාශ ආදිය තිබේනම් ලේඛණයේ බැඳීම් කොටසේ සටහන් කළ යුතු ය;

(iv) ඉල්ලුම්කරුට ඒ ලියාපදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරේ සංශෝධනය කිරීම ලියාපදිංචි කරනු ලැබ ඇති බව දැනුම් දිය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිවේදනයක්ද සමග අදාළ ලේඛන යොමු අංක පිළිබඳවද ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය;

(v) නියමිත ගාස්තු ගෙවීමේ දී තනි පුද්ගල සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් අලුත් සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(ඊ) ඉල්ලීම ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ යම් පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන අවස්ථාවකදී:-

(i) ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරට එකතු කිරීමේ පිඹුරේහි අනු පිටපතක් අදාල

සහාධිපත්‍ය කොටසේ ලිපිගොනුවෙහි ගොනු කරනු ලැබිය යුතු ය;

(ii) ලියා පදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරේ පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් එක් සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් සහාධිපත්‍ය හිමිකම් ලේඛනයෙහි අවශ්‍ය සඳහන් කිරීම් කළ යුතු අතර ඉඩම් කොටස ලියාපදිංචිකර ඇති ලේඛනයෙහි සහ අර්ධ සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරනු ලැබ ඇති ලේඛන වල අවශ්‍ය යොමු සටහන් කළ යුතු ය;

(iii) ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතු කිරීමේ පිඹුරේහි පෙන්නුම් කර ඇති පසුව එකතු කරන ලද එක් එක් සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් සහ එක් එක් සහධිපත්‍ය කොටසට බලපාන උසස් කිරීමේ සහ එම සහාධිපත්‍ය කොටස් වලට එරෙහිව ලබාගත් මුදල් ප්‍රමාණයන් තිබීම පිළිබඳව ද , බදුදීම්, විකිණීම සඳහා ගිවිසුම්, විනිශ්චයට භාජනය වීම, තහනමට ගැනීමේ ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් තිබීම පිළිබඳව ලේඛනයේ බැඳීම් කොටසෙහි සටහන් කළ යුතු ය;

(iv) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ට ද පිටපතක් සහිතව,

එකී සභාධිපත්‍ය කොටස් අර්ධ සභාධිපත්‍ය පිඹුරේ ලියාපදිංචි කර ඇති බවට ඉල්ලුම්කරුට දැන්විය යුතු ය;

(v) නියමිත ගාස්තු ලැබුණු විට සභාධිපත්‍ය හිමිකම් සහතිකයක් එකී සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් නිකුත් කළ යුතු ය.

(4) ඔප්පු ලියා පදිංචි කිරීම සහ කැඩැස්තර සිතියම් පරික්ෂා කිරීම සහ ලේඛන වල සහ කැඩැස්තර සිතියම් වල සහතික පිටපත් නිකුත් කිරීම සහ සභාධිපත්‍ය කොටස හෝ කොටස්වල අයිතිවාසිකම් හෝ කැමති පත්‍රවල සහතිකපත්‍ර ලබාගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 1998 අංක 21 දරන ඔප්පු ලියාපදිංචි කිරීමේ පනතේ 34, 35 සහ37 වන වගන්ති යොදා ගනු ලැබිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයා විසින් “සභාධිපත්‍ය පිඹුර “ හෝ “තාවකාලික සභාධිපත්‍ය පිඹුර” හෝ “අර්ධ සභාධිපත්‍ය පිඹුර” හෝ “සංශෝධිත පිඹුර” හෝ “වෙන් කිරීමේ පිඹුර” හෝ “ඒකාබද්ධ කිරීමේ පිඹුර” හෝ “එකතු කිරීමේ පිඹුර” ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී ඔහු විසින් ප්‍රතික්ෂේප කිරීමේ නියමයක් කරනු ලැබිය යුතු අතර ඒ ප්‍රතික්ෂේප කිරීමේ නියමය සඳහා වූ හේතු නියමිත ලේඛනයක වාර්තා කරනු ලැබ අවස්ථාවෝචිත පරිදි “සභාධිපත්‍ය හිමිකම් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී” හෝ “තාවකාලික සභාධිපත්‍ය හිමිකම් ලියා පදිංචි කිරීම හෝ අර්ධ සභාධිපත්‍ය හිමිකම

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන ලදී” යන වචන සාධන පත්‍රවල සහ එවැනි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන තැනැත්තා විසින් කරනු ලබන ඒ ඉල්ලුම් පත්‍රය මත පිටසන් කරනු ලැබිය යුතු අතර එසේ වාර්තා කරනු ලබන හේතුවල පිටපතක් ඒ තැනැත්තා වෙත ගෙවීමකින් තොරව හෝ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතු ය.

(6) සභාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර හෝ සංශෝධිත පිඹුර හෝ වෙනස් කිරීමේ පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර හෝ එකතු කිරීමේ පිඹුර ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් රෙජිස්ට්‍රාර් වරයා විසින් කරනු ලබන සෑම නියමයක් සඳහාම අභියාචනය කිරීමක් කරනු ලැබීමේ හැකියාවක් තිබිය යුතු අතර ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 38 වන වගන්තියේ විධිවිධාන එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව යොදා ගනු ලැබිය යුතු ය.

“සාධනපත්‍ර තබා ගැනීමට සහ විනාශ කිරීම.”
[§ 1982 අංක 45, (5)]

[§ 2003 අංක 39, (9)]

7. රෙජිස්ට්‍රාර් වරයා විසින් පිළිගනු ලැබූ සහ සභාධිපත්‍ය කොටස් ලිපිගොනුවේ හෝ තාවකාලික සභාධිපත්‍ය කොටස් ලිපිගොනුවේ ගොනු කරනු ලැබූ සියලු සාධනපත්‍ර තබා ගැනීමට සහ විනාශ කිරීමට 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 53 වන වගන්තිය අවශ්‍ය වෙනස්කම් සහිතව යොදා ගනු ලැබිය යුතු ය.

7. **අ** (1) අවස්ථාවෝචිත පරිදි, සහාධිපත්‍ය පිඹුර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර, සහාධිපත්‍ය දේපලේ හෝ තාවකාලික සහාධිපත්ය දේපලේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපලේ අයිතිකරු විසින් ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති විට ඒ ඉල්ලුම්පත්‍රය වරයා විසින් අත්සන් කරනු ලැබ සහ මුද්‍රා තබනු ලැබ ඇති විට සහ සියළු අදාල හිමිකම් ලේඛන යථා පරිදි සකස් කරනු ලැබ ඇති විට, මේ පනතේ විධිවිධාන යටතේ ලියා පදිංචි කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

"සහාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම."
[§ 2003 අංක 39, (10)]

(2) අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය පිඹුරේ හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී , සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටසේ අයිතිකරු හෝ තාවකාලික සහාධිපත්‍ය දේපලේ තාවකාලික සහාධිපත්‍ය කොටසේ අයිතිකරු විසින් අදාළ ලේඛන බැඳීම් ලියාපදිංචි කර ඇත්නම් හෝ සටහන් කර ඇත්නම් ඒ බැඳීම්වලට යටත්ව ඔහුගේ පොදු කොටස් හෝ තාවකාලික පොදු කොටස් වල තමන්ගේ පංගුවේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

8. (1) ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය දේපළක යම් සහාධිපත්‍ය කොටසක අයිතිකරු විසින්, ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුර හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුර සංශෝධනය කරනු ලැබුවා වූ පිඹුර ලියාපදිංචි කිරීම සඳහා කරන ලබන

"සහාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර සංශෝධනය කිරීම."
[§ 2003 අංක 39, (11)]

ඉල්ලීමක් රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එවැනි පිඹුරක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් සමඟ:-

(අ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ "සංශෝධිත පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට පවතින ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියා පදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ සහධිපත්‍ය කොටසට කරනු ලබන අදාල වෙනස්කිරීම් පෙන්වමින් බලපත්‍රලත් මිනින්දෝරු වරයෙකු විසින් සකස් කරන ලද සහ අඳින ලද සහ පිටපත් තුනකින් ඉදිරිපත් කරනු ලැබූ මිනින්දෝරු පිඹුරක්;

(ආ) බිම පවතින තත්වය මිනින්දෝරු පිඹුරේ දක්වා ඇති වෙනස් කිරීම් වලට අනුකූල වන්නා වූ බවට තහවුරු කරමින් සුදුසුකම් ලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ගොඩනැගිලි ඉංජිනේරු වරයෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක්;

(ඇ) සහධිපත්‍ය කොටසට කරන ලද වෙනස් කිරීම්, සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ පොදු කොටස් පාලනය, පරිපාලනය, නඩත්තු කිරීම, සහ කළමනාකරණය හා සම්බන්ධ නියමයන්ට යම් අහිතකර බලපෑමක් ඇති නොකරන බවට සහතික කරමින්

සාමාන්‍යාධිකාරීවරයා ගෙන් ලබාගන්නා ලද සහතිකයක්;

(ඈ) අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරට බලපාන්නාවූ එවැනි වෙනස් කිරීම් සඳහා අදාල බලයලත් බලධරයා ගෙන් අනුමැතිය ලබාගත් සහතිකයක්;

(ඉ) ඒ සහාධිපත්‍ය කොටසට බලපාන්නාවූ එකී වෙනස් කිරීම් සඳහා යම් අදාළ උසස් හිමියකු ඇත්නම් ඒ අදාළ උසස් හිමියාගේ අභිමතය සඳහන් ප්‍රකාශනයක්,
ඉදිරිපත් කළ යුතු ය.

"ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද සහධිපත්‍ය කොටස්වල ලියාපදිංචි කිරීම."
[§ 2003 අංක 39, (12)]

8. අ. (1) ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද යම් සහාධිපත්‍ය කොටස්වල ලියාපදිංචි කිරීම සඳහා යම් අර්ධ සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන වගන්තිය යටතේ ලියා පදිංචි කිරීම සඳහා ඉදිරිපත්කරනු ලබන ඉල්ලුම්පත්‍රයක් නියමිත ආකෘති පත්‍රයක විය යුතු අතර එයට පහත සඳහන් දේ අඩංගු විය යුතු ය:-
(අ) නියමිත ගාස්තුව;

(ආ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ "එකතු කිරීම් කරන ලද පිඹුර" යනුවෙන් සඳහන් කරනු ලබන) මිනුම්පතිවරයාගේ බලය මගින්

හෝ ඒ යටතේ බලයලත් මිනින්දෝරුවෙකු විසින් සකස් කරන ලද සහ අදින ලද මිනින්දෝරු පිඹුර භාර දෙනු ලැබිය යුතු අතර ඒ පිඹුර මගින්:-

(i) ලියා පදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති, කොටසක් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ලට පසුව එකතු කරන ලද අදාළ සහාධිපත්‍ය කොටස් පෙන්වා දෙනු ලැබිය යුතු ය;

(ii) ඒ සහාධිපත්‍ය කොටස්වල අඩංගු පොදු අංගෝපාංග වල එක් එක් සහාධිපත්‍ය කොටසේ, තනිපුද්ගල කොටසේ නොබෙදූ කොටස් වටිනාකම සහ ප්‍රතිශතය පෙන්වා තිබිය යුතු ය;

(iii) කැඩැස්තර සිතියම් යොමු අංකය සහ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්වා ඇති එක් එක් සහාධිපත්‍ය කොටස්වල සහාධිපත්‍ය හිමිකම් සහතිකයේ පෙර ලියාපදිංචි අංකය ලබා දිය යුතු ය;

(ඇ) එකතු කිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් මගින් ඉඩමේ පවතින තත්වය තහවුරු කරන බවට සුදුසුකම් ලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු ගෙන් හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවෙකුගේ ලබාගත් සහතිකයක්;

(ඈ) එකතු කිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් මිනිස් වාසය සඳහා

යෝග්‍ය බවට සහ එකී කොටස් වන සපයා ඇති පොදු පහසුකම් සේවා පිළිබඳව සෑහීමකට පත් විය හැකි බවට සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකාර කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයාගෙන් ලබාගන්නා සහතිකය;

(ඉ) 3අ වගන්තියේ (2) උප වගන්තියේ (උ) ජේදයෙහි නිශ්චිතව දක්වා ඇති විධිවිධාන වලට යටත් ව අර්ධ සහාධිපත්‍ය හිමිකම් සහතිකය;

(ඊ) ලියා පදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ එකතුකිරීමේ පිඹුරේ පෙන්වා ඇති සහාධිපත්‍ය කොටස් නියෝග සමග අනුකූල වන බවට ගොඩනැගිලි පිඹුරු අනුමත කිරීමට බලය පවරා ඇති බලධරයා ගෙන් ලබා ගන්නා අනුකූලතා සහතිකය;

(උ) 3අ වගන්තියේ (2) උප වගන්තියේ ජේදයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන වලට අනුව ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශනය;

ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද සහ ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශනයේ:-

(i) ලියාපදිංචි අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය ද, සහාධිපත්‍ය කොටස් හා සම්බන්ධ සහාධිපත්‍ය හිමිකම් සහතික වලට අදාළ යොමු අංකය;

(ii) ලියා පදිංචි කරන ලද සභාධිපත්‍ය පිඹුරේ එකතු කළ පිඹුරේ පෙන්වා ඇති සභාධිපත්‍ය කොටස්වල අඩංගු පොදු අංගෝපාංග වල එක් එක් සභාධිපත්‍යය කොටසේ නොබෙදූ කොටසේ වටිනාකම සහ ඒ වටිනාකමේ ප්‍රතිශතය;

(iii) අර්ධ සභාධිපත්‍ය පිඹුරේ පෙර ලියාපදිංචියේ යොමු අංකය;

(iv) ලියාපදිංචි කරන ලද අර්ධ සභාධිපත්‍ය පිඹුරේ එකතු කළ පිඹුරේ පෙන්වා ඇති ඒ සභාධිපත්‍ය කොටස් වෙන් කිරීම සඳහා සිය නම් දෙනු ලැබූ අපේක්ෂිත ගැනුම්කරුවන්ගෙන් දැනටමත් ලබාගෙන ඇති අත්තිකාරම් මුදල් පිළිබඳව ගිණුම් ප්‍රකාශයක්;

(v) අර්ධ සභාධිපත්‍ය දේපළ් අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ අත්සන, අන්තර්ගත විය යුතු ය.

"තාවකාලික සභාධිපත්‍ය දේපළෙහි ලියා පදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය පිඹුරට කරනු ලබන සංශෝධනය."

8. ආ. යම් ලියා පදිංචි කරන ලද තාවකාලික සභාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් ලියාපදිංචි කරන ලද තාවකාලික සහ සභාධිපත්‍ය පිඹුරේ "සංශෝධන පිඹුර" ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

අයිතිකරු විසින් ඒ ලියාපදිංචිය සඳහා නියමිත ආකෘති පත්‍රයක කරනු ලබන ඉල්ලීම සමග පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතු ය.

(අ) (මෙහි මින් මතු ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ "සංශෝධන පිඹුර" යනුවෙන් හඳුන්වනු ලබන) ලියාපදිංචි කරන ලද තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ තාවකාලික සහාධිපත්‍ය කොටසට කරන ලද අදාල වෙනස්කම් පෙන්වමින් බලයලත් මිනින්දෝරුවෙකු විසින් සකස් කරන ලද හා අඳින ලද මිනින්දෝරු පිඹුරක් පිටපත් තුනකින් යුක්තව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) සුදුසුකම්ලත් ප්‍රමාණ තක්සේරුකරුවකු හෝ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරු වරයකු විසින් සත්‍යයනය කරන ද ලියාපදිංචි තාවකාලික සහ සහාධිපත්‍ය පිඹුර ට බලපාන සංශෝධන වලට අනුව ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම තහවුරු කරනු ලබන්නාවූ මූල්‍ය වාර්තාවක් ද සමඟ ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්; සහ

(i) යෝජනා ක්‍රමය සඳහා අරමුදල් සැපයීමට ඇති කැමැත්ත පෙන්නුම් කරමින් පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබාගත් සහතිකයක් මගින් සනාථ කරනු ලබන්නාවූ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අරමුදල් ඇති බව;

(ii) තාවකාලික සහාධිපත්‍ය දේපල උගස් කිරීමෙන් දැනටමත් ලබාගත් හෝ ලබාගැනීමට ඇති අරමුදල් පිළිබඳ සහ එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස හෝ කොටස් වලට එරෙහිව ලබාගත් හෝ ලබාගැනීමට ඇති

මුදල් පිළිබඳ විස්තර සහ පිළිගත් මූල්‍ය ආයතනයෙන් ලබාගත් සහතිකයක් මගින් සනාථ කරන්නාවූ මූල්‍ය ආයතනයේ නම;

(ඈ) පහත දැක්වෙන එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ දිනය සහ සම්පූර්ණ කිරීමේ දිනය පෙන්නුම් කරමින් සම්පූර්ණ ඉදිකිරීම් පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සහ එය සනාථ කරන සුදුසුකම්ලත් වාස්තු විද්‍යාඥයන් ගෙන් හෝ සුදුසුකම් ලත් වෘත්තීයමය සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවකු ගෙන් ලබාගත් සහතිකයක්:-

(i) අත්තිවාරම සහ යකඩ කණු,
(ii) බිත්ති ඉදිකිරීම,
(iii) තට්ටුව ඉදිකිරීම,
(iv) වහල ඉදිකිරීම,
(v) මනුෂ්‍ය වාසය සඳහා සුදුසු මට්ටමට අවසාන ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම.

(ඇ) තාවකාලික සහාධිපත්‍ය කොටසට කරන ලද වෙනස් කිරීම් මගින් කළමනාකරණ සංස්ථාවේ පොදු අංගෝපාංග පාලනය කිරීම, පරිපාලනය කිරීම, නඩත්තු කිරීම හා කළමනාකරණය පිළිබඳ අවශ්‍යතා වලට යම් අහිතකර බලපෑමක් ඇති නොවන බවට සහතික කරමින් සාමාන්‍යාධිකාරීවරයා විසින් කරනු ලබන සහතිකය;

(ඉ) අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරට බලපාන්නාවූ එවැනි වෙනස් කිරීම් සඳහා අදාළ බලධරයා ගේ අනුමැතිය ලබාගත් ප්‍රකාශනයක්.

"සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ බලපෑම."
[§ 1982 අංක 45, (6)]

[§ 2003 අංක 39, (13)]

9. (1) සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී සභාධිපත්‍ය දේපළේ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි පෙන්නුම් කර ඇති එක් එක් ගොඩනැගිල්ල හෝ අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇති ගොඩනැගිල්ල ඒකක වලට බෙදා ඇති ලෙසත් එහි එලෙස හඳුනා ගෙන ඇති බවටත් සලකනු ලැබිය යුතු අතර, ඉන්පසු සභාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ අදාළ හිමිකම් කොටස්වලට සමානුපාතිකව ද ඔවුන් විසින් දරනු ලබන අදාල සභධිපත්‍ය කොටස්වල නියමයන්ට සහ භුක්තිය අනුවද එම සභධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් විසින් නිවැසියන් වශයෙන් පොදු අංගෝපාංග දරනු ලැබිය යුතු ය.

(2) සභධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ දී රෙජිස්ට්‍රාර් වරයා විසින් සභධිපත්‍ය කොටසේ පොදු අංගෝපාංග වල අයිතිකරුගේ කොටස සහතික කරනු ලැබිය යුතු ය.

(3) සභාධිපත්‍ය කොටසේ පොදු අංගෝපාංග වල එක් එක් අයිතිකරුගේ කොටස් අගය, අවස්ථාවෝචිත පරිදි වාණිජ හෝ නේවාසිකව හෝ වෙනත් ආකාරයේ වුවද, සභාධිපත්‍ය කොටස පාවිච්චි කරන්නාට අනුව දෙනු ලැබිය යුතු ය.

(4) වෙනත් යම් නීතියට පටහැනිව කුමක් සඳහන් වූවද, එය නොතකා සහ මේ පනතේ විධිවිධාන වලට යටත්ව, සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් පසුව එහි අඩංගු

පොදු අංගෝපාංග ද සමඟ එහි පෙන්වා ඇති යම් සහාධිපත්‍ය කොටසක් යම් ඉඩමක ආකාරයට දරනු ලැබීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කරනු ලැබිය හැකිය.

(5) සහාධිපත්‍ය පිඹුරක් අර්ධ සහාධිපත්‍ය පිඹුරක් හෝ ලියාපදිංචි කිරීමෙන් පසු එහි දැක්වෙන එක් එක් සහාධිපත්‍ය කොටස එයට අනුබද්ධ පොදු අංගෝපාංග සමග ඒ සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ අයිතිකරු හෝ අයිති කරුවන් වශයෙන් ඒ පිඹුරේ විස්තර කරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සම්පූර්ණයෙන්ම අත්කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත්, ඒ ලියාපදිංචි කිරීමට පෙර යම් තැනැත්තෙකුට එම සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ පිළිබඳ ව තිබුණු යම් උගසක්, විකිණීම සඳහා වූ ගිවිසුමක් හෝ සම්බන්ධතාවයක් කෙරෙහි ඇතිවූ අහිතකර බලපෑමක ප්‍රතිඵලයක් වශයෙන් දැරීමට සිදු යම් පාඩුවක් වෙනුවෙන් යම් උගසකට අදාළ නීතිය ප්‍රකාරව පරාමේ බලය ක්‍රියාවේ යෙදවීමට උගස්කරු ට ඇති අයිතියට හෝ මුදල් වන්දි ලබාගැනීමට ඔහුට ඇති අයිතියට නැතහොත් මුදල් වන්දි ලබාගැනීමට වෙනත් යම් තැනැත්තෙකුට ඇති අයිතියට ඉන් හානියක් නොවිය යුතු ය.

“තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමේ ඇති බලපෑම.”

9. **අ**. තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසු එහි දැක්වෙන එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස එයට අනුබද්ධ පොදු අංගෝපාංග සමග

ඒ තාවකාලික සහාධිපත්‍ය දේපලේ අයිතිකරු හෝ වශයෙන් ඒ පිඹුරේ විස්තර කරනු ලැබූ යම් තැනැත්තකු විසින් සම්පූර්ණයෙන්ම අත්කර ගනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ඔහු විසින් පහත දැක්වෙන සීමා කිරීම් වලට යටත්ව ඒ අයිතිය ක්‍රියාත්මක කළ යුතු ය:- [§ 2003 අංක 39, (14)]

(අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමට පෙර හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් පසු හෝ යෝජිත ගොඩනැගිල්ල ඉදිරි කිරීමට අපේක්ෂිත ඉඩම් කොටස ලබා ගනිමින් යම් උකසක් ඇති අවස්ථාවක, එවැනි එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස්වලට ව්‍යාප්ත විය යුතු අතර, උකස්හිමියා හෝ උකස්හිමියන්ගේ කැමැත්ත නොමැතිව වෙනත් යම් පාර්ශවයකගේ වාසියට තාවකාලික සහාධිපත්‍ය කොටස් හෝ ඉඩම් කොටස සම්බන්ධයෙන් යම් සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට කිසිඳු අයිතියක් නොතිබිය යුතු ය;

(ආ) රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර ඇති එක් එක් තාවකාලික සහාධිපත්‍ය කොටස සඳහා වූ යම් විකිණීමේ ගිවිසුමක් තිබීම, එකී විකිනීමේ ගිවිසුමට පාර්ශවකරුවකු වන අපේක්ෂිත මිලදී ගන්නා ගේ අයිතිවාසිකම් වලට හානියක් නොමැතිව, පරම අයිතිය පිළිබඳ බැඳීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති වූද ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරනු ලැබ ඇති වූද ඉඩම් කොටස, එකී ගොඩනැගිල්ල අර්ධ වශයෙන් සම්පූර්ණ කරන තුරු සහ "අර්ධ

සහාධිපත්‍ය දේපළක්” ලෙස රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන තුරු එම ඉඩම් කොටස එහි අයිතිකරු විසින්, උකසක් මගින් හැර, විකිණීම, බද්දට දීම, කුලියට දීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය. මේ විධිවිධාන උල්ලංඝනය කරමින් අයිතිකරු විසින් උකස් කිරීමක් හැර ඔහු විසින් ලියා අත්සන් කරනු ලබන යම් විකිණීමක්, බදු දීමක්, කුලියට දීමක් හෝ අන් ආකාරයකින් බැහැර කිරීමක් ශූන්‍ය සහ බලරහිත විය යුතු අතර එයට නීතියෙහිලා කිසිදු බලයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය.

එසේ වුව ද වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව උකස් බැඳුම්කරයක් මත හෝ විකිණීම සඳහා ගිවිසුමක් මත අයවිය යුතු මුදල් ආපසු අයකර ගැනීම සඳහා යම් අධිකාරියක් විසින් එකී දේපල විකිණීම වළක්වන ලෙස මේ විධිවිධාන වල සඳහන් කිසිවක් සලකනු නොලැබිය යුතු ය.

“සහාධිපත්‍ය කොටසකට බලපාන සාධන පත්‍රයක් ලියා පදිංචි කිරීම.” [§ 2003 අංක 39, (15)]

10. (1) ලියාපදිංචි සහාධිපත්‍ය දේපළක හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය දේපළක යම් සහාධිපත්‍ය කොටසක අයිතිය හෝ සම්බන්ධතාවය හෝ ප්‍රතිලාභ හෝ අත්කරගන්නා කිසිම තැනැත්තෙකුට එම අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියා පදිංචි කරනු ලැබ ඇත්නම් මිස එම අයිතිය හෝ සම්බන්ධතාව හෝ ඔහුට හිමි නොවිය යුතු ය.

(2) සභාධිපත්‍ය කොටසකට අයිතිය හෝ සම්බන්ධතාව හෝ ප්‍රතිලාභ පැවරීම සඳහා යම් සාධනපත්‍රයක් ලියාපදිංචි කිරීමට භාරගැනීමෙන් පසු, රෙජිස්ට්‍රාර් වරයා විසින් නියමිත ආකාරයට අදාල සභාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් හිමිකම් ලේඛනයෙහි එම අයිතිය හෝ සම්බන්ධතාවය හෝ ප්‍රතිලාභය ලියාපදිංචි කල යුතු අතර ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුර හෝ ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුර පිළිබඳව එහි සුදුසු යොමු සටහනක් කළ යුතු ය.

(3) ලියාපදිංචි සභාධිපත්‍ය කොටසකට අදාළව පසුව කරනු ලබන ගනුදෙනුවක් සම්බන්ධයෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 40, 41, 42, 43, 44, 45, 46, 47, 48 සහ 49 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතු ය.

"දේපළෙහි පොදු අංගෝපාංග වල කොටස්."

[§ 1982 අංක 45, (7)]

[§ 2003 අංක 39, (16)]

11. ලියාපදිංචි සභාධිපත්‍ය දේපළක හෝ ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංගවල කිසිදු කොටසක් එම දේපලේ සභාධිපත්‍යය කොටසට අනුබද්ධිත ලෙස හැර බැහැර කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් ක්‍රියා කිරීම සිදු නොකළ යුතු අතර, ඒ සභාධිපත්‍ය කොටස පිළිබඳ යම් අන්සතු කිරීමට අදාළ සාධන පත්‍රයේ හෝ ඔප්පුවේ කිසිඳු විශේෂිත සඳහනක් නැති වුවද, එම අන්සතු කිරීම මගින් එම සභාධිපත්‍යය කොටසට අනුබද්ධිත අංගෝපාංගවල අයිතිකරුගේ නොබෙදූ

කොටස් පවරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

"අතිරේක කොටස්." [§ 2003 අංක 39, (17)]

11. අ. (1) අදාළ ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ හෝ අදාළ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කර ඇති වූද සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත වූ ද කිසිදු අතිරේක කොටසක් හෝ එහි අන්තර්ගත යම් කොටසක් හෝ බූදලයක් හෝ සම්බන්ධතාවයක් සහාධිපත්‍ය කොටසට පරිබාහිරව ඒ අතිරේක කොටස සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(2) ලියාපදිංචි අදාළ සහාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි අදාළ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ අනුබද්ධිත ලෙස පෙන්නුම් කර ඇති ඇතිවූ යම් අතිරේක කොටසක් එම සහාධිපත්‍ය කොටසට අනුබද්ධ නොකර එම අතිරේක කොටස හෝ යම් කොටසක්, දේපළක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ස්වාධීනව ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) (1)වන උප වගන්තියේ විධිවිධාන කඩ කරමින් සිදුකරන ලද යම් රක්ෂණයක් මේ නීතිය යටතේ ලියාපදිංචි නොකළ යුතු අතර, එවැනි යම් ලියාපදිංචි කිරීමක් ශූන්‍ය සහ බල රහිත විය යුතු අතර, අතිරේක කොටසේ යම් මුදලකට හෝ සම්බන්ධතාවයකට එය බල නොපෑ යුතු ය.

(4) යම් රක්ෂණය කිරීමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක රෙජිස්ට්‍රාර් වරයා විසින් එය සොයා ගැනීමේ දී ඔහු විසින් එය අවලංගු කරන ලැබිය යුතු අතර, එවැනි අවලංගු කිරීමක් බලපාන කිසිදු තැනැත්තෙකුට යම් වන්දියක් ලබා ගැනීම සඳහා අයිතියක් නොතිබිය යුතු ය.

"සභාධිපත්‍ය කොටස් නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම."
[§ 1982 අංක 45, (8)]

[§ 2003 අංක 39, (18)]

12. (1) සභාධිපත්‍ය දේපළක හෝ අර්ධ සභාධිපත්‍ය දේපළක සභාධිපත්‍ය කොටසේ යම් අයිතිකරුවකු හෝ අයිතිකරුවන් විසින්, සභාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුරෙහි හෝ ලියා පදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරෙහි එහි "නැවත බෙදා වෙන් කිරීමේ පිඹුර" හෝ "ඒකාබද්ධ කිරීමේ පිඹුර" ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) (1)වන උප වගන්තිය යටතේ වූ ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග:-

(අ) නියමිත ගාස්තුව;

(ආ) බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් හෝ සර්වේයර් ජනරාල් වරයාගේ අධිකාරිය යටතේ සකස් කොට අඳින ලද (මෙහි මින් මතු ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුරේ හෝ ලියා පදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරේ නැවත බෙදා වෙන් කිරීමේ පිඹුර හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුර යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද)

(i) නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීමට ඇති ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ හෝ ලියාපදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරේ දැනට පවත්නා සහාධිපත්‍ය කොටසට හෝ කොටස්වලට සිදුකරනු ලබන අදාල වෙනස්කම් පෙන්වන;

(ii) නැවත බෙදා වෙන්කරන ලද සේ ඒකාබද්ධ කරන ලද සහාධිපත්‍ය කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංග වල එක් එක් සහාධිපත්‍ය කොටසේ නොබෙදූ හිමිකම් වටිනාකම සහ තනි පුද්ගල හිමිකම සීයට ප්‍රමාණය පෙන්නුම් කරන;

(iii) එක් එක් සහාධිපත්‍යය කොටසේ සහාධිපත්‍ය හිමිකම පිළිබඳ සහතිකයේ කලින් ලියාපදිංචි අංකය සහ කැඩැස්තර සිතියම් යොමු අංකය ලබා දෙන,

පිටපත් තුනකින් යුත් මානක සැලැස්මක්;

(ඈ) නැවත බෙදා වෙන් කිරීමේ පිඹුරේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරේ පෙන්නුම් කර ඇති නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම ඉඩමේ ඇති පිහිටීමට අනුකූල වන බවට සුදුසුකම්ලත් වාස්තු විද්‍යාඥයකුගෙන් සහ සුදුසුකම් ලත් සිවිල් හෝ ව්‍යුහ ඉංජිනේරුවරයකු ගෙන් ලබාගත් සහතිකයක්;

(ඇ) සහාධිපත්‍යය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග වල පාලනය, පරිපාලනය, නඩත්තුව සහ කළමනාකරණය පිළිබඳ අවශ්‍යතාවලට

නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම මගින් හානියක් සිදු නොවන බවට සහතික කරමින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාගෙන් ලබාගත් සහතිකයක්;

(ඉ) අනුමත ගොඩනැගිලි සැලැස්ම සිදුකිරීමට යන නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම සඳහා අදාල අධිකාරියේ අනුමැතිය;

(ඊ) සහාධිපත්‍ය කොටසට සිදුකිරීමට යන නැවත බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳව අදාළ උගස් හිමියකු සිටීනම් ඔහුගේ කැමැත්ත;

(උ) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක්;
ඒ ප්‍රකාශයේ පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතු ය:-

(i) නැවත බෙදා වෙන් කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට යෝජිත අදාල සහාධිපත්‍ය කොටසේ හෝ කොටස්වල ලියාපදිංචි අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ඔවුන්ගේ ලිපිනය සහ සහාධිපත්‍ය හිමිකම් පිළිබඳ සහතිකයට අදාල යොමු අංක;

(ii) නැවත බෙදා වෙන්කළ හෝ ඒකාබද්ධ කළ එක් එක් කොටසේ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන්

ලබාදෙමින් අයිතිය පිළිබඳව සිදුකරනු ලබන වෙනස්කම් සඳහා විශ්වාසය තබන සාධන පත්‍ර හෝ ලේඛන වල ස්වභාවය;

(iii) එම නැවත බෙදා වෙන් කිරීම සහ ඒකාබද්ධ කිරීමට පෙර සහ පසුව එක් එක් සහාධිපත්‍ය කොටසේ සහ ඊට අනුබද්ධිත පොදු අංගෝපාංගවල නොබෙදූ හිමිකම් වටිනාකම සහ ඒ වටිනාකම් වල සීයට ගණන;

(iv) සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළෙහි සහාධිපත්‍ය කොටසේ හෝ කොටස් වල අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ අත්සන්

ඉදිරිපත් කළ යුතු ය.

[§ 1982 අංක 45, (9)]
[§ 2003 අංක 39, (19)]

13. (1) එක් එක් කොටස සම්බන්ධයෙන් :-

(අ) කොටසක අයිතිකරුට වාසිදායක ව සහ ඒ කොටසට අනුබද්ධිතව පොදු අංගෝපාංග වලින් හා ආධාරක ලබාදිය හැකි සෑම කොටසකින්ම යටි යාබද හා පාර්ශවික ආධාරකයක් සඳහා පරවශතාවක්;

(ආ) එක් එක් කොටසේ අයිතිකරුට එරෙහිව සහ කොටස යටත් වන කොටසට එරෙහිව පොදු අංගෝපාංග වලට සහ ආධාරකය ලැබීමට පිළිවන් වන වෙනත් සෑම කොටසකටම යටි යාබද හා පාර්ශවික ආධාරකයක් සඳහා පරවශතාවක්;

(2) (1)වන උප වගන්තියෙන් ඇති කරන ලද ආධාරක පරවශතාවලින් ප්‍රබල

ගෙපතේ අයිතිකරුට යම් ආධාරකයක් නැවත යෙදීම, අලුත් කිරීම හෝ නැවත පිහිටුවීම සඳහා පරවශ ගෙපතට ඇතුලුවීමට හිමිකම් ඇත්තේ ය.

(3) කොටසක සෑම අයිතිකරුවෙකුටම අනු කොටස් වලට බෙදූ ගොඩනැගිල්ලේ, ආවරණය සැලසිය හැකි සියලුම අනිත් කොටස් වලින් සිය කොටස ආවරණය කර ගනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(4) (3)වන උප වගන්තියෙන් ඇතිකළ අයිතිවාසිකම, කොටස්වලට බෙදූ ගොඩනැගිල්ලේ කොටස් යටත් වන පරවශතාවක් විය යුතු ය.

(5) මේ වගන්තියෙන් ඇති කරන ලද ආවරණය පිළිබඳ පරවශතාවයෙන්, ප්‍රබල ගෙපතේ අයිතිකරුට, යම් ආවරණයක් නැවත යෙදීම අලුත් කිරීම හෝ නැවත පිහිටුවීම සඳහා පරවශ ගෙපතට ඇතුළුවීමට හිමිකමක් ඇත්තේ ය.

(6) එක් එක් කොටස සම්බන්ධයෙන්:-
(අ) කිසියම් නල, කම්බි, කේබල් හෝ ප්‍රණාල තුළින් හෝ ඒවා මාර්ගයෙන් ජලය, මළනාළිකා, ජලාපවහනය, ගෑස්, විදුලිය, කැලිකසල, කෘතිම ලෙස උණුසුම් කළ හෝ සිසිල් කළ වායුව සහ (ටැලිෆෝන් ගුවන් විදුලි හා රූපවාහිනී සේවාවන් ඇතුළුව) අනෙකුත් සේවාවන්, එකී මළ නාළිකා, නල, කම්බි, කේබල් හෝ ප්‍රණාල, කොටස භුක්ති විඳීම

සම්බන්ධයෙන් පාවිච්චියට ගත හැකි ප්‍රමාණයට කොටසක අයිතිකරුට වාසි වන අන්දමට හා ඊට අනුබද්ධිත වන ආකාරයට ගමන් කරවීම හෝ විධිවිධාන ඇති කිරීම සඳහා පරවශ්‍යතාවක්ද;

(ආ) කිසියම් මළනාළිකා, නල, කම්බි, කේබල් හෝ ප්‍රණාල තුළින් හෝ ඒවා මාර්ගයෙන් ජලය, මළනාළිකා, ජලාපවාහනය, ගෑස්, විදුලිය, කැලිකසල, කෘතිම ලෙස උණුසුම් කළ හෝ සිසිල් කළ වායුව සහ (ටැලිෆෝන් ගුවන් විදුලි හා රූපවාහිනී සේවාවන් ඇතුළුව) අනෙකුත් සේවාවන් පොදු අංගෝපාංග වලට අනුබද්ධිත ලෙස සහ එවැනි පරවශතාවන් භුක්ති විඳීමට හැකියාව ඇති අනෙකුත් සෑම කොටසකටම අනුබද්ධිත ලෙස, කොටසක අයිති කරුට එරෙහිව සහ කොටසට යටත් වන ආකාරයට ගමන් කරවීම හෝ විධිවිධාන ඇති කිරීම සඳහා වූ පරවශ්‍යතාවක් ද
ව්‍යංජිත විය යුතු ය.

(7) එක් එක් කොටස සහ පොදු අංගෝපාංග සම්බන්ධයෙන් ප්‍රබල ගෙපතෙහි අයිතිකරුට වාසි වන අන්දමට සහ පරවශ ගෙපතේ අයිතිකරුට එරෙහිව:-
(අ) අදාළ සහධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරන දිනයේ දී තිබුණු සහ භුක්ති විඳිනු ලැබූ යම් ජනේලවලට, දොරවල්වලට, හෝ වෙනත් විවරවලට බාධක විරහිත ප්‍රවේශය සහ ඒවා සඳහා ආලෝකය ලැබීමට පරවශ්‍යතාවක්; සහ
(ආ) අදාළ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරන දිනයේ දී තිබුණු ඉහලින් එල්ලන අගු සහ වෙනත් නෙරීම් පවත්වාගෙන

යාමේ සහ පාවිච්චි කිරීමේ අයිතිය
ව්‍යංජිත විය යුතු ය.

(8) පොදු අංගෝපාංග වලට අනුබද්ධව සහ බලපා ඇති යම් කොටසකට පරවශව:-
(අ) යම් කොටසක වූ සවි කිරීම් තුළින් යම් සේවාවක් සඳහා විධිවිධාන ඇති කිරීම පිණිසවූ පරවශ්‍යතාවක් සහ
(ආ) ආධාරකය සලස්වා දිය හැකි යම් කොටසකින් ආධාරකය සඳහා පරවශ්‍යතාවක්
ව්‍යංජිත විය යුතු ය.

(9) මේ පනතින් ඇති කරන ලද හෝ ව්‍යංජිත කරන ලද පරවශතා, සහාධිපත්‍ය දේපළ ලේඛණයේ පත් ඉරුවල කරනු ලබන යම් සඳහනක් හෝ නිවේදනය කිරීමක් හෝ නොමැතිව ම ක්‍රියාත්මක විය යුතු අතර, ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

“අනුයාත අයිතිවාසිකම් හා බැඳීම් ගම්‍යමාන බව.”
[§ 1982 අංක 45, (10)]

14. ප්‍රබල ඉඩමක අයිතිකරුට කළමනාකරණ සංස්ථාවේ අවසරය ඇතිව ඉඩමකට ඇතුළු වී ඔහුට ප්‍රයෝජනය ලැබීමේ හිමිකම් ඇති යමක් ප්‍රතියෝජනය කිරීමේ, අලුත් කිරීමේ හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ අයිතිය ඇතුළු පරවශතා ක්‍රියාත්මක කිරීමට යුක්ති සහගත ලෙස අවශ්‍ය සියලු අනුයාත අයිතිවාසිකම් හා බැඳීම් මේ පනතින් හෝ යටතේ පරවශතා ඇති කරනු ලැබූ හෝ ව්‍යංජිත කරනු ලැබූ කල්හි, ව්‍යංජිත විය යුතු ය.

“පරවශතා ප්‍රදාන ලියා අත්සන් කිරීම ආදිය.”
[§ 1982 අංක 45, (11)]

15. (1) කළමනාකාර සංස්ථාව විසින් කැඳවන ලද රැස්වීමකදී ඒකමතික යෝජනා සම්මතයක් මගින් සියලුම කොටස්වල අයිතිකරුවන් විසින්:-

[§ 2003 අංක 39, (20)]

(අ) ඔවුන් වෙනුවෙන් පරවශතා ප්‍රදානයක් හෝ සහාධිපත්‍ය දේපල ට බරක් වන සීමාකාරී ප්‍රතිඥප්තියක් ලියා අත්සන් කිරීමට; හෝ

(ආ) ඔවුන් වෙනුවෙන් පරවශතා ප්‍රදානයක් හෝ සහාධිපත්‍ය දේපල ට ප්‍රයෝජනවත් වන සීමාකාරී ප්‍රතිඥප්තියක් පිළිගැනීමට සංස්ථාවට විධාන කරනු ලැබිය හැකි ය.

(2) ඒ යෝජනා සම්මතය නිසියාකාරව සම්මත වී ඇති බවටත්, යෝජිත නියාදනයෙහි සඳහන් කර ඇති සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් වූ සම්බන්ධතා ඇති කරනු ලැබූ ආකාරය ගැන, සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි කළ සම්බන්ධතා ඇති සියලු තැනැත්තන් විසින් ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර ඇති බවටත් කළමනාකරණ සංස්ථාව සෑහීමකට පත්ව ඇත්තේ නම්, ඒ නියමිත සාධන පත්‍රය සංස්ථාව විසින් ලියා අත්සන් කළ යුතු ය; ඒ සාධන පත්‍රය, සහාධිපත්‍ය දේපළෙහි සම්බන්ධතාවයක් ඇති යම් තැනැත්තකු විසින් ලියා අත්සන් කිරීමක් නොමැතිවම වලංගු හා බල සහිත විය යුතු අතර, කළමනාකරණ සංස්ථාවට, සාධන පත්‍රය යටතේ ගෙවිය යුතු වන මුදල් සඳහා වූ කළමනාකරණ සංස්ථාවේ ලදු පත ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය; එමෙන්ම, සාධන පත්‍රය යටතේ ලබාගන්නා තැනැත්තා මුදල් යෙදවීම ගැන සොයා බැලීමෙන් හෝ එසේ ලැබුණේ යැයි ප්‍රකාශිත මුදල් නැතිවීමත් සඳහා හෝ සාවද්‍ය යෙදවීමක් සඳහා වගකීමෙන් නිදහස් විය යුතු ය.

(3) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද, පරවශතා හෝ සීමාකාරී ප්‍රතිඥප්ති ඇති කරන ලද සෑම සාධනපත්‍රයක් ම යෝජනා සම්මතය නිසියාකාරව සම්මත වූ බවටත් අවශ්‍ය සියලුම කැමැත්ත ප්‍රකාශ කිරීම් දී ඇති බවටත් කළමනාකාර සංස්ථාවේ මුද්‍රාව යටතේ පිටසන් කිරීමකින් යුක්තව හෝ ඒ බවට වූ සහතිකයක් ඊට ඈඳා හෝ තිබිය යුතු අතර, මිලට ගන්නාගේ හා රෙජිස්ට්‍රාර්ගේ වාසියට වූ සහතිකය එහි සඳහන් කරනු ලැබූ කරුණු සඳහා තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(4) පරවශතා හෝ සීමාකාරී ප්‍රතිඥප්ති ඇති කරන ලද සාධන පත්‍රය, ලියාපදිංචි කළ සහාධිපත්‍ය පිඹුරේ සටහන් කිරීමෙන් එය, රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරනු ලැබිය යුතු ය.

"පොදු අංගෝපාංග වල කොටස් පැවරීම."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (21)]

16. (1) කළමනාකරණ සංස්ථාව විසින් කැඳවන ලද රැස්වීමකදී සම්මත කරගන්නා ලද විශේෂ යෝජනා සම්මතයක් මගින් පොදු අංගෝපාංග වලින් කොටසක් පවරන ලෙස සියලුම කොටස්වල අයිතිකරුවන් විසින් සංස්ථාවට විධාන කරනු ලැබිය හැකි ය.

(2) යෝජනා සම්මතය නිසියාකාරව සම්මත වූ බවටත්, සහාධිපත්‍ය දේපළේ ලියා පදිංචි කළ සම්බන්ධතා ඇති (සියලු කොටස්වල අයිතිකරුවන් හැර) සියලු තැනැත්තන් විසින්, යෝජිත පැවරීම

ඇතුළත් වන සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට ඇති සම්බන්ධතා මුදාහැරීමට ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කර ඇති බවටත්, යම් ඉඩමක් අනු කොටස් වලට බෙදීම සඳහා හා ඒකාබද්ධ කිරීම සඳහා වූ පිඹුරු අනුමත කිරීමට තත්කාලයේ බලය දරන අධිකාරිය විසින් සහ රෙජිස්ට්‍රාර් විසින්, පැවරීම ඇතුළත් වන ඉඩම අනු කොටස් වලට බෙදීම හා ඒකාබද්ධ කිරීමට බලපාන තාක් දුරට, යෝජිත පැවරීමට ලියවිල්ලකින් අනුමැතිය දී ඇති බවටත් කළමනාකරණ සංස්ථාව සෑහීමකට පත් වුවහොත්, කළමනාකාර සංස්ථාව විසින් නියමිත සාධන පත්‍රය ලියා අත්සන් කළ යුතු ය; පොදු අංගෝපාංග වලට සම්බන්ධතාවයක් ඇති යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් ලියා අත්සන් කිරීමක් නොමැතිවම සාධන පත්‍රය වලංගු සහ බලසහිත විය යුතු අතර, කළමනාකරණ සංස්ථාවට සාධන පත්‍රයේ යටතේ ගෙවිය යුතු වන මුදල් සඳහා වූ කළමනාකරණ සංස්ථාවේ ලදුපත ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය; එමෙන්ම, මුදල් යෙදවීම ගැන සොයා බැලීමෙන් හෝ මුදල් නැති වීමක් සඳහා හෝ සාවද්‍ය යෙදවීමක් සම්බන්ධයෙන් හෝ වගකීමෙන් ඒ මිලට ගන්නා නිදහස් විය යුතු ය.

(3) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති එවැනි පැවරීමක් පිළිබඳ සෑම සාධනපත්‍රයක් ම යෝජනා සම්මතය නිසියාකාරව සම්මත වූ බවටත් අවශ්‍ය සියලුම කැමැත්ත ප්‍රකාශ කිරීම් දී ඇති බවටත් කළමනාකාර සංස්ථාවේ මුද්‍රාව යටතේ වූ පිටසන් කිරීමකින් යුක්තව හෝ

ඒ බවට වූ සහතිකයක් සමග හෝ විය යුතු අතර, මිලට ගන්නාගේ සහ රෙජිස්ට්‍රාර්ගේ වාසියට වූ සහතිකය එහි සඳහන් කරුණු සඳහා තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර් විසින් පැවරීම ලියාපදිංචි කිරීමෙන් පසු පවරන ලද පොදු අංගෝපාංගවල කොටස, මේ පනත යටතේ ඇති කරන ලද හෝ ව්‍යංජිත වූ හෝ පවත්නා පරවශතාවලින් නිදහස් විය යුතු අතර රෙජිස්ට්‍රාර් විසින්:-

(අ) සහාධිපත්‍ය දේපළ අඩංගු වන ඉඩම් ලේඛනයේ පත්ඉරුවෙහි පැවරීම පිළිබඳ සටහනක් ඇතුලත් කළ යුතු ය; තවද

(ආ) පැවරීමට යෙදුණු පොදු අංගෝපාංග වල කොටස පෙන්නුම් කරන ආකාරයට, රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි කල්පනා කරන අන්දමට, ලියාපදිංචි කළ සහාධිපත්‍ය පිඹුර සංශෝධනය කළ යුතු ය.

"ඉඩම් සහ ඒකක පැවරීම."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (22)]

17. (1) කළමනාකරණ සංස්ථාව විසින් කැඳවන ලද රැස්වීමකදී සම්මත කරගන්නා ලද විශේෂ යෝජනා සම්මතයක් මගින්, සියලුම කොටස් වල අයිතිකරුවන් විසින්:-

(අ) කොටස් වල සියළුම අයිතිකරුවන්ගේ වාසියට වූ පොදු අංගෝපාංග වල කොටසක් බවට පත් වන සේ, ව්‍යවස්ථාපිත බැඳීම් වලින් හා පවත්නා පරවශතා වලින් හැරෙන්නට වෙනත් යම්

බැඳීම්වලින් නිදහස්ව යම් ඉඩමක් හෝ ඉන් කොටසක් පැවරීමක්; හෝ

(ආ) යම් කොටසක්, සියලුම කොටස්වල අයිතිකරුවන්ගේ හෝ එකී ලියාපදිංචි කළ සහාධිපත්‍ය පිඹුරේ දැක්වෙන අනෙකුත් කොටස්වල අයිතිකරුවන්ගේ වාසියට වූ පොදු අංගෝපාංග වල කොටසක් බවට පත්වන අයුරු, ඒ කොටසට අනුබද්ධිත පොදු අංගෝපාංග වල නො බෙදූ කොටස් ද ඇතුළුව ඒ කොටස ව්‍යවස්ථාපිත බැඳීම් හා පවත්නා පරවශතා හැරෙන්නට වෙනත් යම් බැඳීම්වලින් නිදහස් ව, පැවරීමක් පිළිගන්නා ලෙස කළමනාකරණ සංස්ථාවට විධාන කරනු ලැබිය හැකිය.

(2) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ පැවරීමට, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉඩම හෝ එහි කොටසක් හෝ පවරන ලද කොටස හෝ, පොදු අංගෝපාංග වල කොටසක් ලෙස ඇතුලත් කරන ලෙස රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලබන ඉල්ලීමක් අඩංගු විය යුතු ය.

(3) එවැනි පැවරීමක් ලියාපදිංචි කිරීමෙන් පසු රෙජිස්ට්‍රාර් විසින්:-

(අ) ඉඩම් ලේඛනයේ පත්ඉරුවේ සහ සහාධිපත්‍ය දේපළ අඩංගු වන ලියාපදිංචි කළ සහාධිපත්‍ය පිඹුරේ ඒ පැවරීම පිළිබඳව සටහනක් ඇතුලත් කළ යුතු ය; තවද

(ආ) පැවරීමට යෙදුන ඉඩම හෝ ඉන් කොටසක් හෝ පවරන ලද කොටස පොදු අංගෝපාංග වල කොටසක් බවට පත්වන

අන්දම සභාධිපත්‍ය පිඹුරේ පෙන්නුම් කෙරෙන පරිදි, සුදුසු යයි රෙජිස්ට්‍රාර් කල්පනා කරන ආකාරයකට, ලියාපදිංචි කළ සභාධිපත්‍ය පිඹුර සංශෝධනය කළ යුතු අතර, කොටස පවරනු ලැබූ අවස්ථාවක දී ලියාපදිංචි කළ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති, කොටසේ කොටස් වටිනාකම අත්හැරදැමීමද, ලියාපදිංචි කළ සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන මුළු කොටස් වටිනාකමේ එකතු සංඛ්‍යාව සංශෝධනය කිරීමෙන් එකතු කොටස් හිමිකමට සමානව, මුළු කොටස් වටිනාකමේ සංඛ්‍යාව අඩු කිරීම ද කරනු ලැබිය යුතු ය; තවද

(ඇ) එවැනි සංශෝධනයක් කිරීමෙන් පසු කොටසක එක් එක් අයිතිකරුගේ කොටස් හිමිකම් එකතුව සහ අනුශාංගික කොටස් හිමිකම, කළමනාකරණ සංස්ථාව වෙත දැනුම් දිය යුතු ය.

(4) ලියා පදිංචි කළ පැවරීමකින් පහත දැක්වෙන ප්‍රතිඵල ඇතිවිය යුතු ය:-

(අ) (3)වන උප වගන්තිය ප්‍රකාර සංශෝධනය කරන ලද සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන අයිතිකරුවන්ගේ පිළිවෙලින් වූ කොටස් වටිනාකමට සමානුපාතිකව ද, පැවරීම ලියාපදිංචි කිරීමට පෙරාතුව ම අයිතිකරුවන් විසින් දරන ලද කාල සීමාව සඳහා සහ එකී ප්‍රගතියක් ඇති ප්‍රතිඥප්ති, කොන්දේසි සහ බැඳීම්වලට යටත්ව ද සියලුම කොටස් වල අයිතිකරුවන් විසින්, (පවරන ලද ඉඩම හෝ කොටස ඇතුළුව) පොදු අංගෝපාංග, පොදු කුලී නිවැසියන් ලෙස දරනු ලැබිය යුතු ය; එවිට යම්

කොටසක් ලියාපදිංචි කරන ලද උගසකට, බැඳීමකට, බද්දකට හෝ උප බද්දකට නැතහොත් වෙනත් යම් බැඳීම්වලට යටත් වන අවස්ථාවක, එකී කොටසේ අයිතිකරු විසින් දරන ලද අතිරේක පොදු අංගෝපාංග සැදුනා වූ පවරන ලද ඉඩමේ හෝ පවරන ලද කොටසේ නොබෙදූ කොටස, යම් වැඩිමනත් සහතිකයක් නොමැතිව, සියලු ආකාරයෙන්ම එකී උගසට, බැඳීමට, බද්දට හෝ උප බද්දට නැතහොත් වෙනත් යම් බැඳීම්වලට යටත් විය යුතු ය; තව ද

(ආ) අවස්ථාවෝචිත පරිදි, පවරන ලද ඉඩමෙන් හෝ ඉන් කොටසකින් නැතහොත් පවරන ලද කොටසෙන් පොදු අංගෝපාංගවල කොටසක් සජ්ජිත විය යුතු අතර මේ වගන්තියෙන් වෙනස් කරන ලද පරිදි, පොදු අංගෝපාංග වලට අදාල වන මේ පනතේ වූ විධිවිධාන එකී පවරන ලද ඉඩමට හෝ කොටසකට අදාළ විය යුතු ය.

[§ 2003 අංක 39, (22)]

(5) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 40, 41, 42, 43, 44, 45, 46, 47, 48 සහ 49 වන වගන්ති වල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන යම් සාධනපත්‍ර ක්‍රියාවේ යෙදවීම සහ එම සාධනපත්‍ර ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව යොදා ගනු ලැබිය යුතු ය.

"පොදු අංගෝපාංග ආදිය ඒකාබද්ධ කිරීම."

18. (1) රෙජිස්ට්‍රාර් විසින් වෙනම සහාධිපත්‍ය පිඹුරු ලියාපදිංචි කිරීමෙන් පසු කලමනාකරණ සංස්ථා දෙකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටවනු ලැබූ අවස්ථාවක, (මින් මතු මේ වගන්තියේ "පැවරුම් කාර

කළමනාකරණ සංස්ථා" යනුවෙන් හැඳින්වෙන) කළමනාකරණ සංස්ථා වල සාමාජිකයන් වන්නාවූ සියලු කොටස් අයිතිකරුවන් විසින්, පැවරුම් කාර කළමනාකරණ සංස්ථාව විසින් කැඳවන ලද රැස්වීම්වලදී විශේෂ යෝජනා සම්මතයක් මගින්, සභාධිපත්‍ය දේපළ ඇතුළත එහි භුක්තියෙන් පැවරෙන අයිතිය ඇත්තාවූද පොදු පොලී නිවැසියන් වශයෙන් ඔවුන් විසින් නොබෙදූ පංගු වශයෙන් දරනු ලබන්නා වූ ද පොදු අංගෝපාංග ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා, එම පොදු අංගෝපාංග පිළිබඳ පැවරුම් සාධනපත්‍රයක්, පැවරීම් බලපාන තාක් දුරට, එම අංගෝපාංග, පොදු කුලී නිවැසියන් වශයෙන් සියලුම කොටස් අයිතිකරුවන්ට සතු වන පරිදි, ලියා අත්සන් කරන ලෙස අදාළ පැවරුම් කාර කළමනාකරණ සංස්ථාවට විධාන කළ හැකි අතර, ඒ පැවරුම් සාධන පත්‍රය ලියාපදිංචි කිරීමෙන් පසු, රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කිරීම් කරන ලද දිනයට කලින් සියලු කොටස් අයිතිකරුවන් විසින් පිළිවෙලින් ඔවුන්ගේ කොටස් සම්බන්ධයෙන් එවකට දරන ලද්දාවූ ප්‍රතිඥප්ති, කොන්දේසි සහ බැඳීම් වලටත්, එකී කාලයට සහ භුක්තියෙන් පැවරෙන අයිතියටත් යටත්ව, ඒ පොදු අංගෝපාංග ඒකාබද්ධ කර ඔවුන්ගේ පිළිවෙලින් වූ කොටස්, කොටස් වලට සමානුපාතික කොටස් වලින් දරනු ලැබිය යුතු ය. [§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (23)]

(2) එවැනි පැවරුමකින්, ඒ පැවරුණේ නම සඳහන් කරනු ලැබූ කොටසක එක් එක් අයිතිකරු විසින් දැරිය යුතු වූ නොබෙදූ

සමානුපාතික කොටස දක්වනු ලැබිය යුතු අතර, ඒ පැවරුම, අදාළ පැවරුම්කාර කළමනාකරණ සංස්ථාව විසින් ලියා අත්සන් කළ යුතු ය.

(3) 16වන වගන්තියේ (2)වන (3)වන හා (4)වන උප වගන්තිවල සඳහන් කරන ලද ක්‍රියාමාර්ගය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පැවරුම්කාර කළමනාකරණ සංස්ථාවලට හා මේ වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමට යෙදෙන සහාධිපත්‍ය දේපළ වල සියළු කොටස් වල අයිතිකරුවන්ට අදාළ විය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර් විසින් පැවරුම් ලියාපදිංචි කිරීමෙන් ඉක්බිති පොදු අංගෝපාංග ඒකාබද්ධ කිරීමෙන් පසු:-

(අ) පැවරුම් කාර කළමනාකරණ සංස්ථා (මින් මතු මේ වගන්තියේ "පැවරුම්ලාභී කළමනාකරණ සංස්ථාව" යනුවෙන් හැඳින්වෙන) තනි කළමනාකරණ සංස්ථාවකට ඒකාබද්ධ කළ යුතු අතර, ඒ තනි කළමනාකරණ සංස්ථාව අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිලිවල කළමනාකරණය පිළිබඳව හා ඒවාට අදාළ වන්නා වූ පොදු අංගෝපාංග වල කළමනාකරණය පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ආ) පැවරුම්කාර කළමනාකරණ සංස්ථාවේ සියලු සාමාජිකයන් පැවරුම්ලාභී කළ කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයන් විය යුතු ය;

(ඇ) පැවරුම්ලාභී කළමනාකරණ සංස්ථාව

සඳහා අළුත් කළමනාකරණ සභාවක් තෝරා පත් කර ගන්නා තෙක් පැවරුම් කාර කළමනාකරණ සංස්ථාවල කළමනාකරණ සභාවල සියලු සාමාජිකයන්, පැවරුම්ලාභී කළමනාකරණ සංස්ථාවේ කළමනාකාර සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) පැවරුම් කාර කළමනාකරණ සංස්ථාවේ සියලූ දේපල පැවරුම්ලාභී කළමනාකරණ සංස්ථාවට පැවරුණු හා අයිති වූ ලෙසත් පැවරුම් කාර කළමනාකරණ සංස්ථාවල සියලු බැරකම් පැවරුම්ලාභී කළමනාකරණ සංස්ථාවට පැවරුණු ලෙස හා එහි බැරකම් බවට පත්වූ ලෙසත් සලකනු ලැබිය යුතු ය; තව ද

(ඉ) පැවරුම් කාර කළමනාකරණ සංස්ථා විසින් පවරනු ලැබ හෝ ඒවාට එරෙහිව පවරා ඇති සියලූ නඩු කටයුතු පැවරුම් ලාභී කළමනාකරණ සංස්ථාව විසින් දිගටම පවත්වාගෙන යාම හෝ ඊට එරෙහිව පවත්වාගෙන යනු ලැබීම කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ:-

(අ) “බැරකම්” යන්නට කළයුතු කාර්ය ඇතුළත් වේ, තවද

(ආ) “දේපල” යන්නට සෑම වර්ගයකම අයිතිවාසිකම් සහ බලතල ඇතුළත් වේ.

“අධිකරණය වෙත කෙරෙන ඉල්ලීම.”

19. (1) 16 වන, 17 වන සහ 18 වන වගන්ති වල විධිවිධාන වල කුමක් සඳහන් වුවද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (24)]

හෝ කොටසක අයිතිකරුවකු විසින්, ලියා පදිංචි කළ සභාධිපත්‍ය දේපල පිහිටියා වූ දිස්ත්‍රික්කයේ (මින් මතු මේ වගන්තියෙ 20ඉ වන වගන්තියේ, 20ක වන වගන්තියේ සහ 20ට වන වගන්තියේ "අධිකරණය" යනුවෙන් හඳුන්වනු ලබන) දිසා අධිකරණය වෙත පහත දැක්වෙන අන්දමේ ආඥාවක් සඳහා, එනම්:-

(අ) පොදු අංගෝපාංග වල කොටසක් පවරන ලෙස;

(ආ) යම් ඉඩමක් හෝ ඉන් කොටසක් හෝ යම් කොටසක් පොදු අංගෝපාංගවල කොටසක් බවට පත් වන පරිදි ඒ ඉඩම හෝ ඉන් කොටසක් හෝ ඒ කොටස පිළිබඳ පැවරීම පිළිගන්නා ලෙස; හෝ

(ඇ) කළමනාකරණ සංස්ථා දෙකක හෝ වැඩි ගණනක පොදු අංගෝපාංග ඒකාබද්ධ කරන ලෙස

කළමනාකරණ සංස්ථාවට හෝ කළමනාකරණ සංස්ථාවලට විධානය කිරීමේ ආඥාවක් සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උප වගන්තිය ප්‍රකාර අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ කල්හි විශේෂ යෝජනා සම්මතයක් අනුමතකර ගැනීම සඳහා රැස්වීමක් කැඳවීම ක්‍රියාත්මක නොකළ හැකි බවටත්, සියලු කොටස් වල අයිතිකරුවන්ගේ සහ සමස්තයක් වශයෙන් ගත් කල පොදු අංගෝපාංග වල ලියාපදිංචි කළ සම්බන්ධතා ඇති

තැනැත්තන්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා සියල්ල සැලකිල්ලට ගනිමින්:-

(අ) පොදු අංගෝපාංග වල කොටසක් පැවරීම; හෝ

(ආ) යම් ඉඩමකින් හෝ ඉන් කොටසකින් හෝ කොටසකි පොදු අංගෝපාංග වල කොටසක් සජ්ජිත වීම; හෝ

(ඇ) කළමණාකාර සංස්ථා දෙකක හෝ වැඩි ගණනක පොදු අංගෝපාංග ඒකාබද්ධ කිරීම.

සාධාරණ හා යුක්ති සහගත බවටත් අධිකරණය සෑහීමට පත්වූ විට, පොදු අංගෝපාංග වල ඒ කොටස පවරන මෙන්ද ඉඩම හෝ ඉන් කොටස හෝ කොටස පැවරීම පිළිගන්නා මෙන් ද නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, සභාධිපත්‍ය දේපළ පොදු අංගෝපාංග වලට බලපාන තරමට, ඒ සභධිපත්‍ය දේපල, පොදු කුළී නිවැසියන් වශයෙන් සියලු කොටස්වල අයිතිකරුවන් වෙත එක් සභාධිපත්‍ය දේපළක් වශයෙන් පැවරෙන ආකාරයට සභාධිපත්‍ය දේපල දෙකක හෝ වැඩි ගණනක පැවරුම සඳහා සාධන පත්‍රයක් ලියා අත්සන් කරන මෙන්ද පැවරීම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කරන මෙන්ද කළමනාකරණ සංස්ථාවට හෝ කළමනාකරණ සංස්ථා වලට විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන ලද එවැනි සෑම පැවරුම් සාධනපත්‍රයක් ම,

නැතහොත් පැවරීම පිළිගැනීමේ සෑම සාධනපත්‍රයක් ම, ඒ පැවරීම හෝ පැවරීම පිළිගැනීම සඳහා විධාන කරමින් අධිකරණය විසින් දෙන ලද ආඥාවේ සහතික කල සත්‍ය පිටපතක් සමඟ එවනු ලැබිය යුතු ය.

(4) රෙජිස්ට්‍රාර් විසින් පැවරීම ලියාපදිංචි කිරීමෙන් පසු:-

(අ) පොදු අංගෝපාංග සියල්ලේ හෝ ඉන් කොටසක නියාදනයක් සම්බන්ධයෙන් වන විට සියළු කොටස් වල අයිතිකරුවන් ද පොදු අංගෝපාංග වල ලියාපදිංචි කළ සම්බන්ධතා ඇති අනෙකුත් තැනැත්තන්ද අධිකරණයේ ආඥාවේ නියමයන් පිළිගැනීමට බැඳී සිටින අතර 16 වන වගන්තියේ (4)වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ පැවරීමට අදාල විය යුතු ය;

(ආ) පොදු අංගෝපාංග වලට කෙරෙන යම් එකතු කිරීමක් සම්බන්ධයෙන් වන විට, 13 වගන්තියේ (3) වන හා (4) වන උප වගන්ති වල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ පැවරීමට අදාල විය යුතු ය; තවද

(ඇ) කළමනාකරණ සංස්ථා දෙකක හෝ වැඩි ගණනක පොදු අංගෝපාංග ඒකාබද්ධ කරනු ලැබූ විටෙක, 16 වන වගන්තියේ (4) වන උපවගන්තිය සහ 18 වන වගන්තියේ (2) වන, (4) වන, හා (5) වන උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ඒකාබද්ධ කිරීමට අදාළ විය යුතු ය.

20. කොටස් දෙකක හෝ වැඩි ගණනක භුක්තිය එකතු වීමෙන් මේ පනතින් ව්‍යංජිත වූ හෝ ඇති කරන ලද පරවශතා හෝ සීමා කිරීම් විනාශවීම නොසිදුවිය යුතු නමුත්, ඒ එකමුතුව නතර වූ විට ඒවා, කිසි විටෙක භුක්තියේ එකමුතුවක් නොවූ සේ දිගටම පූර්ණ බලාත්මක වහා ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

"එකමුතු භුක්තිය." [§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (25)]

20. අ. (1) සහාධිපත්‍ය පිඹුරක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සෑම පිඹුරකම දක්වනු ලබන ඇති (කොටස් වටිනාකමක් වෙන් කර දෙනු නොලැබූණ අතිරේක කොටසක් සම්බන්ධයෙන් හැරෙන්නට) එක් එක් කොටසේ, කොටස් වටිනාකම කොටස් ඒකක වශයෙන් ගත යුතු ය.

"කොටස් ඒකක." [§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (26)]

(2) කොටස් ඒකක අනුව:-

(අ) සියලු කොටස්වල අයිතිකරුවන්ගේ ඡන්දය දීමේ අයිතිවාසිකම්;
පොදු අංගෝපාංග ඒකකයක එක් එක් අයිතිකරුගේ නොබෙදූ කොටස් ප්‍රමාණය;
සහ

20උ වගන්තියට අනුව කළමනාකරණ සංස්ථාව විසින් අය කරනු ලබන්නාවූ ද කොටසක එක් එක් අයිතිකරු විසින් ගෙවනු ලැබිය යුතු වූ ද දායක මුදල් වල අනුපාතිකය
නිශ්චය කරනු ලැබිය යුතු ය.

[§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (27)]

20. ආ සහධිපත්‍ය පිඹුර හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කරනු ලැබූ විට මේ පනත ප්‍රකාර සහාධිපත්‍ය කොටස් වල

"කළමනාකරණ සංස්ථාවල සංයුතිය යනාදිය."

අයිතිකරුවන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාගත මණ්ඩලයක් වන අතර, එය "කළමනාකරණ සංස්ථාව" වශයෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(2) (අ) කළමනාකරණ සංස්ථාව විසින් එළඹෙන ලද යම් ගිවිසුමක් මත එය විසින් සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය;

(ආ) පොදු අංගෝපාංග වලට බලපාන යම් කරුණක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාව විසින් සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය;

සියලු සහාධිපත්‍ය කොටස් වල අයිතිකරුවන් එක්ව බැඳී ඇත්තේ යම් සහධිපත්‍ය දේපළක් හෝ අර්ධ සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් ද ඒ සහාධිපත්‍ය දේපළ හා සම්බන්ධ වූ යම් කරුණක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාව විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ප්‍රකාරව කළමනාකරණ සංස්ථාව පිහිටුවීමෙන් පසු වහාම, මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන වලට යටත් ව, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් එසේ පිහිටුවීමේ දින සිට මාස තුනකට(3) නොවැඩි කාලයක් ඇතුළත කළමනාකරණ සංස්ථාවේ පළමු වන වාර්ෂික මහා සභා රැස්වීම කැඳවනු ලැබිය යුතු අතර, පළමුවන සභාව තෝරා පත්කරගත යුතු ය; තව ද ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී එම අධිකාරිය ධූර දැරීම අවසන් විය යුතු ය. පළමුවන උපලේඛනයේ විධිවිධාන වලට යටත්ව

පළමුවන සභාව තෝරා පත්කර ගැනීමෙන් පසු එම සභාව විසින් කළමනාකරණ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කළ යුතු අතර කළමනාකරණ සංස්ථාව වෙනුවෙන් එහි කටයුතු පවත්වාගෙන යා යුතු ය.

(4) මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන, කළමනාකරණ සංස්ථාව සහ එහි සභාවට අදාළව බල පැවැත්විය යුතු ය.

(5) මේ පණතේ පළමු උපලේඛනයේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක නියම කිසිවකට අනුකූලව කටයුතු කිරීම හෝ ඒ විධිවිධාන මගින් එයට නියම කෙරුණු කාර්යය කිරීම හෝ කළමනාකරණ සංස්ථාව විසින් පැහැර හරිනු ලැබුවහොත්, කළමනාකරණ සංස්ථාව සහ ඒ කඩ කිරීමට හෝ පැහැර හැරීමට දැන දැනම පාර්ශවකරුවකු වන එහි සභාවේ සෑම සාමාජිකයෙකුම හෝ සභධිපත්‍ය කොටසක සෑම අයිතිකරුවකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(6) මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන අතුරෙන් කිසිවකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයක නියම කිසිවෙකුට කිසිවකට අනුකූලව කටයුතු කිරීම හෝ ඒ විධි විධාන මඟින් නියම කෙරුණු කාර්යයක් කිරීම හෝ පැහැර හරින කළමණාකරන සභාවේ යම්

සාමාජිකයකු සහ සහධිපත්‍ය කොටසක යම් අයිතිකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(7) මේ වගන්තියේ "සියලුම ඒකක වල අයිතිකරුවන්" යන්නට 20ට වගන්තිය අනුව අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල කඩා දැමූ විට සහාධිපත්‍ය දේපළට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළට හිමිකම ලැබූ තැනැත්තන් ඇතුළත් වේ.

[§ 2003 අංක 39, (27) 6]

(8) සහාධිපත්‍ය දේපළක්, සහාධිපත්‍ය දේපළ බවට පරිවර්තනය කර රෙජිස්ටාර්වරයා විසින් එය සහාධිපත්‍ය දේපළක් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව ලියා පදිංචි කළ අර්ධ සහාධිපත්‍ය දේපළේ කළමනාකරණ සංස්ථාව ලියා පදිංචි කරන ලද සහාධිපත්‍ය දේපළේ ද කළමනාකරණ සංස්ථාව ලෙස දිගටම කටයුතු කළ යුතු ය.

"කලමණාකරණ සංස්ථාවල කාර්ය ආදිය."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (28)]

20. ඇ (1) කළමනාකරණ සංස්ථාවේ කාර්යය වලට පහත දැක්වෙන කාර්යය ඇතුළත් විය යුතු ය:-

(අ) පොදු අංගෝපාංග කළමනාකරණය කර, නිසි අයුරින් පවත්වාගෙන යාම සහ ඒවා සේවයට ගත හැකි මනා තත්ත්වයෙන් තබා ගැනීම;

(ආ) ඒකමතික යෝජනා සම්මතයකින් අන්‍යාකාරයකින් විධාන කරතහොත් මිස, අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල රක්ෂණය කිරීම සහ ගිනි සහ මේ පනත යටතේ නියම කරනු ලැබිය

හැකි වෙනත් යම් අනතුරු සම්බන්ධයෙන්, ඒ ගොඩනැගිල්ලේ ප්‍රතිස්ථාපන අගයට සරිලන පරිදි එය රක්ෂණ කර තබා ගැනීම;

(ඇ) එසේ අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල නීතියෙන් නියම කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අන්දමකට රක්ෂණය කිරීම; [§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (29)]

(ඈ) සියලුම සභාධිපත්‍ය කොටස් වල අයිතිකරුවන් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් විධාන කරනු ලැබිය හැකි වෙනත් යම් අනතුරු සම්බන්ධයෙන් රක්ෂණය කිරීම;

(ඉ) අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලකට සිදුවූ අලාභ හානි සම්බන්ධයෙන් ලැබුණු රක්ෂණ මුදල්, නීත්‍යානුකූලව කළ හැකි තාක් දුරට, ඒ ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම සඳහා, නොපමාව යෙදවීම;

(ඊ) සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් මත වූ වාරික ගෙවීම;

(උ) පොදු අංගෝපාංග වලට සිදුකෙරෙන යම් පීඩාවක් නතර කිරීමට නියම කරමින් සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ හි පොදු අංගෝපාංග වූ යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් කළ යුතු අලුත්වැඩියා කිරීම් හෝ වෙනත් වැඩ නැතහොත් වෙනත් වැඩිදියුණුකිරීම් නියම කෙරෙමින් ආඥාවේ, හෝ පොදු හෝ

ව්‍යවස්ථාපිත අධිකාරයක් විසින් කරනු ලබන යම් දැන්වීමක් හෝ ආඥාවක් අනුව කටයුතු කිරීම;

[§ 2003 අංක 39, (28) 2]

(උඋ) අනුමත ගොඩනැගිලි සැලැස්ම උල්ලංඝනය කරමින් සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ ට බලපාන්නාවූ යම් අනවසර ඉදිකිරීමක් ඉවත් කරන ලෙස නියම කරමින් රජය විසින් හෝ රජයේ බලධරයෙක් විසින් කරනු ලබන දැන්වීමකට හෝ නියමයකට අනුකූලව කටයුතු කිරීම සහ එවැනි ඉවත් කිරීමක් සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ නාගරික සංවර්ධන අධිකාරියට හෝ පළාත් පාලන ආයතනයකට සහාය වන ලෙස ඉල්ලා සිටීම;

(ඌ) සභාධිපත්‍ය කොටස් අතුරෙන් යම් සභාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් දෙන ලද හෝ කරන ලද (උ) ඡේදයෙහි සඳහන් යම් දැන්වීමක් හෝ නියමයක් අනුව කටයුතු කිරීම, යුක්ති සහගත කාලයක් ඇතුළත සභාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් පැහැර හැරියහොත් ඒ දැන්වීමට හෝ නියමයට අනුකූල ව ක්‍රියා කිරීම;

(එ) අනුකොටස්වලට බෙදන ලද ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ යම් ඉඩමක් මතද ඒ ඉඩම සම්බන්ධයෙන් වූ කුලියක් වෙතොත්, ඒ කුලිය ගෙවීම.

(2) කළමනාකාර සංස්ථාවේ බලතල වලට පහත දැක්වෙන බලතල ඇතුළත් විය යුතු ය:-

(අ) (1) වන උප වගන්තියෙහි (ඌ)

ඡේදයේ සඳහන් පරිදි යම් දැන්වීමකට හෝ ආඥාවකට අනුකූලව යම් අයිතිකරුවකු ගේ සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී කළමනාකාර සංස්ථාව විසින් වැය කරන ලද යම් මුදලක් ඒ අයිතිකරුගෙන් අයකරගැනීමට නීත්‍යානුකූල පියවර ගැනීම;

(අඅ) ගොඩනැගිල්ලේ සහාධිපත්‍ය කොටස් සියල්ල සඳහා ජලය, විදුලි බලය සහ වෙනත් උපයෝගිතාවයන් සැපයීම සඳහා ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතන, වෙනත් යම් බලමණ්ඩල හෝ වෙනත් යම් බලපත්‍රලාභීන් සමඟ ගිවිස ගැනීම සහ එම පරිභෝජනය සඳහා සේවා ගාස්තු සහ මාසික ගාස්තු අය කර ගැනීම මත සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් සියල්ලටම එම සේවාවන් සැපයීම; [§ 2003 අංක 39, (28) 3]

(අආ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින්, හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ පළාත් පාලන ආයතන විසින් හෝ වෙනත් බල මණ්ඩලයක් හෝ බලපත්‍ර ලාභියෙක් විසින් සපයන ලද ජලය, විදුලි බලය සහ වෙනත් උපයෝගීතාවයන් පරිභෝජනයේදී වූ මාසික ගාස්තු අය කර ගැනීමට ජලය හෝ විදුලි බලය හෝ වෙනත් උපයෝගිතාවයන් සඳහා වන පුද්ගලික සම්බන්ධතාවයන් විසන්ධි කිරීම මාර්ගයෙන් සහ සහාධිපත්‍ය කොටසේ හෝ කොටස්වලට අයිතිකරුවන් හෝ අයිතිකරුවන් විසින් කළමනාකරණ [§ 2003 අංක 39, (28) 3]

සංස්ථාවට අදාල ගාස්තු ගෙවන තෙක් එම සහාධිපත්‍ය කොටස්වලට ලබාදෙන ඒ සැපයුම දිගටම විසන්ධි කර තැබීමට සියලු පියවර ගැනීම;

[§ 2003 අංක 39, (28) 3]

(ආ) සියලු සහාධිපත්‍ය කොටස් වල අයිතිකරුවන් විසින් පොදු අංගෝපාංග භුක්ති විඳීම සම්බන්ධයෙන්, ඔවුන්ගේ පාවිච්චිය සඳහා වංචල දේපළ මිලට ගැනීම, කුලියට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම;

(ආආ) 20උෟ වගන්තියේ සඳහන් කරන ලද කාර්ය සඳහා, අදාල සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ කොටස්වල පංගුවට ප්‍රමානුකූලව සහාධිපත්‍ය කොටස් සියල්ලේම අයිතිකරුවන්ගෙන් මාසික දායක මුදලක් අයකිරීම සහ සහාධිපත්‍ය කොටස් සියල්ලම අයිතිකරුවන්ගෙන් එම දායක මුදල් අය කර ගැනීම;

(ඇ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි හෝ එහි කාර්යය ඉටු කිරීමේලා එයට අවශ්‍ය මුදල් ණයට ගැනීම;

(ඈ) සංස්ථාව විසින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සහ ඒ මත වූ පොලිය ගෙවීම ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් මගින් හෝ එවකටත් නියම කර තිබුණේ වුවද නොවුවද කලමනාකාරණ අරමුදලට නොගෙවන ලද දායක මුදල් විෂයෙහි වූ වැය භාරයක් මගින් සුරක්ෂිත කිරීම; සහ

(ඉ) මේ පනත යටතේ සංස්ථාවේ කාර්යය කිරීම සඳහා සහ මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථා

බලගැන්වීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගැනීම;

(ඊ) සහතික කරන ලද ගොඩනැගිලි පිඹුරට පටහැනිව සහධිපත්‍ය දේපළකට හෝ අර්ධ සහාධිපත්‍ය දේපළකට බලපාන අනවසර ඉදිකිරීම් සියල්ල වැළැක්වීමට සහ ඉවත් කිරීමට සියලු පියවර ගැනීම සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ නාගරික සංවර්ධන අධිකාරියට හෝ පළාත් පාලන අධිකාරියට එකී අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙසට ඉල්ලා සිටීම හෝ සහාය දීම.

(3) කළමණාකරන සංස්ථාවකට:-

(අ) (1) වන උප වගන්තියේ (ආ) හෝ (ඇ) ඡේද යටතේ යම් රක්ෂණයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලක, එහි ප්‍රතිස්ථාපන අගයට සමාන රක්ෂණය කළ හැකි අයිතිවාසිකමක් තිබිය යුතු ලෙස; සහ

(ආ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ යම් රක්ෂණයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, රක්ෂණයට විෂය වූ කාරණයෙහිලා රක්ෂණ අයිතිවාසිකමක් තිබිය යුතු ලෙස
සලකනු ලැබිය යුතු ය.

(4) අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ කළමනාකරණ සංස්ථාව විසින් ගනු ලැබූ රක්ෂණ ඔප්පුවක්, එම අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මේ

වගන්තිය යටතේ ම ගනු ලැබූ වෙනත් ඔප්පුවක් නම් මිස, වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් සමග දායකත්වයට යටත් නොකළ යුතු ය.

(5) කළමනාකාර සංස්ථාව විසින් යම් අලුත්වැඩියා කිරීමක්, වැඩක් හෝ ක්‍රියාවක් (ඒ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියාව කරන ලද්දේ ආණ්ඩුවේ යම් අධිකාරියක් හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් සංස්ථාව වෙත යම් දැන්වීම හෝ නියමයක් භාර දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වුවද නොවුවද) කරනු ලබන අවස්ථාවක සහ, අළුත්වැඩියා කිරීම්, වැඩ, හෝ ක්‍රියාව සම්පූර්ණයෙන්ම හෝ සාරානුකූලවම සහාධිපත්‍ය කොටසක පමණක් අයිතිකරුගේ බැදීම හෝ වගකීම වන්නාවූ හෝ, සම්පූර්ණයෙන්ම හෝ සාරානුකූලවම සහාධිපත්‍ය කොටස් කීපයකට පමණක් ප්‍රතිලාභය උදෙසා වන්නාවූ හෝ, සම්පූර්ණයෙන්ම හෝ සාරානුකූලවම සහාධිපත්‍ය කොටස් කිහිපයක පමණක් අයිතිකරුවන්ගේ බැදීම හෝ වගකීම වන්නාවූද අවස්ථාවක, ඒ අලුත්වැඩියා කිරීම වැඩ හෝ ක්‍රියාව කිරීමෙහිලා කළමනාකාර සංස්ථාව විසින් වැය කරනු ලබන යම් මුදලක්:-

(අ) ඒ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියාව සම්පූර්ණයෙන්ම හෝ සාරානුකූලවම සහධිපත්‍ය කොටස් කිහිපයක පමණක් ප්‍රතිලාභය සඳහා වන්නා වූ හෝ, සම්පූර්ණයෙන්ම හෝ සාරානුකූලවම සහාධිපත්‍ය කොටස් කීපයක පමණක් අයිතිකරුවන්ගේ බැදීම් වගකීම් වන්නා වූ

අවස්ථාවක:-

(i) ඒ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියාව කරනු ලැබූ අවස්ථාවේදී එවැනි එක් එක් සහාධිපත්‍ය කොටසක අදාළ අයිතිකරුගෙන්; සහ

(ii) නඩුව ආරම්භ කරනු ලැබූ අවස්ථාවේදී එවැනි එක් එක් සහාධිපත්‍ය කොටසක අදාළ අයිතිකරුගෙන්

නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක පවරනු ලබන නඩුවක් මගින් කළමනාකරණ සංස්ථාව විසින් සංස්ථාවට අයවිය යුතු ණයක් වශයෙන්, එක්ව සහ වෙන් වෙන්ව, අය කර ගනු ලැබිය යුතු ය.

යම් අයිතිකරුවෙකු සහ කලින් අයිතිකරුවකු විසින් යම් සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල, සහාධිපත්‍ය කොටසේ කොටස් ඒකකය, ඒ සියලු සහාධිපත්‍ය කොටස්වල සහාධිපත්‍ය කොටස් ඒකක එකතුවට එවකට දරණ ණය අනුපාතිකයට වැඩි නොවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියා යම් සහාධිපත්‍ය ඒකකයක කරනු ලැබූ අවස්ථාවේදී ඒ සහාධිපත්‍ය කොටසේ අයිතිකරු නොවූ අයිතිකරුවකු විසින්, සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් එකී උප වගන්තිය යටතේ කළමනාකරණ සංස්ථාවට අයවිය යුතු මුදලක් වෙතොත්,

ඒ මුදල ගැන විමසා ලියවිල්ලකින් වූ ඉල්ලීමක් ඒ සහාධිපත්‍ය කොටසේ හිමිකම හෝ සම්බන්ධතාවය ඔහු විසින් අත්කර ගනු ලැබූ දින හෝ එදිනට පෙර දින විසිඑකක් ඇතුළත කවර වූ හෝ විටකදී කළමනාකරණ සංස්ථාව වෙත කරනු ලැබූ ඇත්නම් සහ, කළමනාකරණ සංස්ථාව විසින්:-

(අ) (5) වන උප වගන්තියට අනුව ඒ සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාව විසින් එවකට අයකර ගනු ලැබිය යුතු වූ කිසිම මුදලක් නොතිබුණු බවට සහතික කරනු ලැබ ඇත්නම්; හෝ

ඉල්ලීම භාර දුන් දිනයේ සිට දින දාහතරක් ඇතුලත කවර වූ හෝ විටෙකදී සංස්ථාව විසින් ඉල්ලීමට පිළිතුරක් දෙනු නොලැබ ඇත්නම්;

එකී වගන්තිය යටතේ කිසිදු මුදලක් කලමනාකාර සංස්ථාවට ගෙවීමට ඔහු බැඳී නොසිටී. තවද, (5)වන උප වගන්තිය යටතේ වූ යම් මුදලක් කළමනාකරණ සංස්ථාව විසින් සහතික කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ අයිතිකරුගේ බැඳීම එසේ සහතික කරනු ලැබූ මුදලට සීමා විය යුතු ය.

(7) කලමනාකරණ සංස්ථාව විසින් වියදම් කිසිවක් දරනු ලබන්නා වූ හෝ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියා කිසිවක් කරනු ලබන්නා වූ අවස්ථාවක (දරනු ලැබූ වියදම හෝ කරනු ලැබූ අළුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියා ආණ්ඩුවේ යම් අධිකාරියක් හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් සංස්ථාව

වෙත භාර දෙනු ලැබූ යම් දැන්වීමක හෝ ආඥාවක ප්‍රතිඵලයක් වශයෙන් කරන ලද්දේ වුවද නොවුවද) ඒ වියදම හෝ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියා, යම් තැනැත්තෙකු හෝ ඔහුගේ කුලී නිවැසියෙකු, බදු ගැනුම්කරුවෙකු, බලපත්‍ර ලාභියෙකු හෝ ආරාධිතයකු විසින් ඕනෑකමින්ම කළ ක්‍රියාවක හෝ නොසැලකිලිමත් ක්‍රියාවක හෝ නොකර හැරීමක හේතුවෙන් හෝ කළමනාකරණ සංස්ථාවේ අතුරු ව්‍යවස්ථාවල යම් විධිවිධානයක් කඩ කිරීමක් හේතුවෙන් අවශ්‍ය වූයේ වී නම්, ඒ අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියා කිරීමේදී සංස්ථාව විසින් වැය කරන ලද වියදම් ප්‍රමාණය හෝ වියදම් කළ මුදල නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක පවරනු ලැබූ නඩුවක් මගින් අය කර ගනු ලබන ආකාරයෙන් සංස්ථාව විසින් ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(8) කළමනාකරණ සංස්ථාව මත තීරු බද්දක් පැනවීමේ බලයක් පිරිනැමෙන මේ පනතේ වෙනත් යම් විධාන වලින් මේ වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවිය යුතු ය.

20. ඇ. (1) අනුකොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවත්නා යම් රක්ෂණ ඔප්පුවක් තිබුණේ වුවද යම් සහාධිපත්‍ය කොටසක් විෂයෙහි පවත්නා උසස් ඔප්පුවක් මගින් ආරක්ෂිත වූ ද ඒ සහාධිපත්‍යය කොටසට අලාභයක් හෝ හානියක් සිදුවන අවස්ථාවේදී ගෙවීමට

"රක්ෂණ ඔප්පු."

ශේෂව තිබූ තිබුණා වූ ද මුදල් ප්‍රමාණයට සමාන වටිනාකමකින් යුත් රක්ෂණ ඔප්පුවක් තම සහාධිපත්‍ය කොටසට සිදුවන හානි සම්බන්ධයෙන් සහාධිපත්‍ය කොටසේ අයිතිකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් රක්ෂණ ඔප්පුවක් වලංගුව පවත්නා අවස්ථාවක:-

(අ) ලියාපදිංචි කරන ලද උකස්ලාභීන්ට ඔවුන්ගේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, ඔප්පුවේ නියම හා කොන්දේසි වලට යටත්ව රක්ෂක විසින්, ඒ ඔප්පුව යටතේ ගෙවීම් කරනු ලැබිය යුතු ය;

(ආ) ඔප්පුවේ නියම හා කොන්දේසි වලට යටත්ව:-

(i) ඔප්පුවෙහි ප්‍රකාශිත වටිනාකම;

(ii) අලාභයේ හෝ හානියේ ප්‍රමාණය; හෝ

(iii) අලාභය හෝ හානිය සිදු වූ දිනයෙහි සහාධිපත්‍ය කොටස මත වැය භාරයක් වූ උකස නිදහස් කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණය

යන මුදල් ප්‍රමාණ අතුරින් කවර හෝ අඩුම මුදල් ප්‍රමාණය, ඒ ඔප්පුව යටතේ ගෙවීමට රක්ෂක බැඳී සිටිය යුතු ය;

(ඇ) එසේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සහාධිපත්‍ය කොටස මත වැය බාරයක් වූ උකසක් නිදහස් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණ වලට සමාන වන විට, උකස පැවරීමකට රක්ෂක හිමිකම ලැබිය යුතු ය;

තවද

(ඇ) රක්ෂණයෙන් එසේ ගෙවනු ලැබූ මුදල සභාධිපත්‍ය කොටස මත වැය බාරයක් වූ උකස නිදහස් කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයට වඩා අඩු වූ විට, එසේ ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය (3)වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි එකඟ වූ නියම හා කොන්දේසි මත හෝ එකඟ වීමට අපොහොසත් වුවහොත්, උකසෙහි ඇතුළත් නියම හා කොන්දේසි මතම සුරක්ෂිත කිරීම රක්ෂක හිමිකම ලැබිය යුතු ය.

(3) (2)වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා, යම් රක්ෂකයෙකුට සහ උසස් ලාභියෙකුට යම් සභාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් රක්ෂණ ඔප්පුවක් ක්‍රියාත්මක කිරීමට පෙර හෝ පසුව කවර විටෙක දී වුවද, අතුරු උකසේ නියම හා කොන්දේසි සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹිය හැකි ය.

(4) ස්වකීය සභාධිපත්‍ය කොටසට සිදුවන අලාභයක් ාවන අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ කිරීම සඳහා යම් සභාධිපත්‍යය කොටසක අයිතිකරු සතු අයිතිවාසිකම් මේ වගන්තියේ අඩංගු කිසිවකින් සීමා නොවිය යුතු ය.

(5) මේ වගන්තියෙන් බලය ලැබුවා වූ ද ස්වකීය සභාධිපත්‍ය කොටසට සිදුවන අලාභය සම්බන්ධයෙන් යම් සභාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් ගනු ලැබුවා වූ

ද රක්ෂණ ඔප්පුවක්, එම සහාධිපත්‍ය කොටසටම සිදුවන අලාභය සම්බන්ධයෙන් ගනු ලැබූ වෙනත් ඔප්පුවක් හැර, වෙනත් යම් රක්ෂණ ඔප්පුවක් සමග දායකත්වයට පත්කිරීමට යටත් නොවන්නේය.

(6) රක්ෂණයට අදාළ යම් නීතියක විධිවිධාන නොතකා මේ වගන්තියේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

"අධිකරණය විසින් පරිපාලකයකු පත් කිරීම."

[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (30)]

20. ඉ. (1) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ හෝ කළමනාකරණ සංස්ථාවේ හෝ සහාධිපත්‍ය කොටසක අයිතිකරුගේ හෝ සහාධිපත්‍ය කොටසක ලේඛනගත අයිතියක් ඇති වෙන යම් තැනැත්තෙකුගේ හෝ පුද්ගලික මණ්ඩලයක හෝ ඉල්ලීම මත අධිකරණය විසින්, නියමිත හෝ අනියමිත කාල සීමාවක් සඳහා සහ පාරිශ්‍රමිකය පිළිබඳ යම් නියම හා කොන්දේසි මත හෝ සුදුසුයයි අධිකරණය සිතන ආකාරයකින් හෝ කළමනාකරණ සංස්ථාව පරිපාලකයෙකු පත් කරනු ලැබිය හැකිය.

(2) පරිපාලකගේ පාරිශ්‍රමිකය සහ වියදම් කළමනාකරණ සංස්ථාවේ කළමනාකරණ අරමුදලට වැය බරක් විය යුතු ය.

(3) කළමනාකරණ සංස්ථාව සතු බලයට බාහිරව, කළමනාකරණ සංස්ථාවේ කාර්යය හෝ ඒ කාර්යය අතුරෙන් අධිකරනය විසින් ආඥා කරනු ලැබිය හැකි කාර්ය කිසිවක් කිරීමේ බලය පරිපාලක සතු වේ;

එසේ වුවද පරිපාලක ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙනත් කෙනෙකු පත් කිරීම සඳහා (4) වන උප වගන්තිය යටතේ කළමනාකරණ සංස්ථාව විසින් ඉල්ලීමක් කරනු ලැබීමෙන් මේ උප වගන්තියේ විධිවිධාන වලින් කළමනාකරණ සංස්ථාව වැළැක්වීමක් සිදු නොවේ.

(4) පරිපාලක විසින් හෝ (1) වන උප වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමට හිමිකම ඇති යම් තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් පරිපාලක ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙනත් කෙනෙකු පත්වීම, කරනු ලැබිය හැකි ය.

(5) පරිපාලකයකු පත්කරනු ලැබූ වහාම, තමා ගේ පත්වීම කරනු ලැබූ අධිකරණ ආඥාවේ කාර්යාල පිටපතක් පරිපාලක විසින් රෙජිස්ටර් වෙත සහ සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) පරිපාලකයකු ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙනත් කෙනෙකු පත් කිරීම සඳහා යම් තැනැත්තෙකු වෙත අධිකරණ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, ඒ ඉවත් කිරීම හෝ වෙනත් කෙනෙකු පත් කිරීම පිළිබඳ කාර්යාල පිටපතක් සහ සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය වෙත වහාම තැන්පත් කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් මත සුදුසුයයි අධිකරණය

"පරිපාලක පත් කරනු ලබන තුරු කළමනාකරණ සංස්ථාවේ කාර්යය සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් කළ යුතු බව."

[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (31)]
[§ 2003 අංක 24, (3) (1)]

සලකන ගාස්තු ගෙවීම සඳහා වූ යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

20. ඊ (1) කළමනාකරණ සංස්ථාව විසින් ස්වකීය කාර්යය සතුටුදායක ලෙස නොකරනු ලබන බවට එහි කටයුතු සතුටුදායක ලෙස ඉටු නොකරනු ලබන බවට සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය සෑහීමකට පත් වන්නා වූ ද ඇතැම් කාර්යය නොපමාවම කර ගෙන යා යුතු යැයි හෝ කළමනාකරණ සංස්ථාවට සහ සියලුම සභාධිපත්‍ය කොටස් වල අයිතිකරුවන්ට අදාළ වන කරුණු සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියා කළ යුතු යැයි පොදු පහසුකම් මණ්ඩලයේ මතය වන්නා වූ අවස්ථාවක, 20ඉ වන වගන්තිය යටතේ පරිපාලකයකු පත්කරන තුරු කළමනාකරණ සංස්ථාවේ කාර්යය කිරීමට සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය බලය ඇති අතර, ඒ කටයුතු සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(2) කළමනාකරණ සංස්ථාව සඳහා සහ ඒ වෙනුවෙන් සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් දරන ලද වියදම් කළමනාකරණ සංස්ථාවේ කළමනාකරණ අරමුදලට වැය බරක් විය යුතු ය.

(3) සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ එය වෙත පැවරෙන බලතල ක්‍රියාවේ යොදවනු

ලැබූ විට, ඒ බව, අදාල කළමනාකරණ සංස්ථාව වෙත හෝ එහි සෑම සාමාජිකයෙකු වෙත හෝ අනු කොටස්වලට පෙරන ලද ගොඩනැගිල්ල සහ පොදු අංගෝපාංග කළමනාකරණය කිරීමේ ලා වගකිවයුතු තැනැත්තා වෙත, සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය විසින් හැකි තාක් ඉක්මනින් දන්වනු ලැබිය යුතු ය.

20. උ. (1) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක දක්වා ඇති අනු කොටස් වලට බෙදන ලද සෑම ගොඩනැගිල්ලක්ම සහ සහාධිපත්‍ය කොටස්වල සහ පොදු අංගෝපාංග වල පාලනය, කළමනාකරණය, පරිපාලනය, පරිහරණය සහ භුක්තිය සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා මගින් විධිමත් කරනු ලැබිය යුතු ය. [§ 1982 අංක 45, (11)] [§ 2003 අංක 39, (32)]

(2) ඒ අතුරු ව්‍යවස්ථා වලට මේ පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන අතුරු ව්‍යවස්ථා ඇතුලත් විය යුතු අතර ඒ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කළමනාකරණ සංස්ථාව විසින් නොකළ යුතු ය.

(3) සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක් ලියාපදිංචි කිරීමෙන් පසු, සියළු ගොඩනැගිලි අතුරු බෙදීම් වලට අදාල කාර්යයන් සඳහා මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථාව බලාත්මක කරනු ලැබිය යුතු ය.

(4) ආරක්ෂක හා සුරක්ෂිත පියවරවල් සඳහා සුරතල් සතුන් ඇති කිරීම, වාහන නවතා තැබීම සඳහා, භාවිතය තහනම් කර ඇත්තා වූ කිසියම් පොදු දේපළක් පිළිබඳ වූ කාරණා සඳහා, බිම් ආවරණයේදී, අපද්‍රව්‍ය බැහැර කිරීම් වලදී , ගෘහ නිර්මාණ ශිල්පයේදී සහ භූමි දර්ශනයේදී සහ සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් විසින් පිළිපැදිය යුතු නියමු උපදෙස් සහ සහාධිපත්‍ය කොටස්වල සහ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය පිඹුරට හෝ ලියාපදිංචි කරන ලද අර්ධ සහාධිපත්‍ය පිඹුරට අදාල සහාධිපත්‍ය දේපළ වන හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ වල පොදු උපාංගයන් ගේ කාර්යක්ශම කළමනාකරණයට යෝග්‍ය වෙනත් යම් කාරනා සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති අතුරු ව්‍යවස්ථාව අනුකූල නොවන විට, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, කළමනාකරණ සංස්ථාව විසින් විශේෂ යෝජනා සම්මතයකින් අතිරේක අතුරු ව්‍යවස්ථාවක් සාදනු ලැබිය හැකි ය;

(5) අනුකොටස් වලට බෙදන ලද ගොඩනැගිලි සම්බන්ධයෙන් තත්කාලයේ වලංගුව බලපවත්නා අතුරු ව්‍යවස්ථා වලින් කලමනාකාර සංස්ථාව සහ සියලුම සහධිපත්‍ය කොටස් වල අයිතිකරුවන්

(අ) කළමනාකාර සංස්ථාව සම්බන්ධයෙන් වන විට, සියලුම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් සමඟ; සහ

(ආ) සහාධිපත්‍ය කොටසක අයිතිකරු සම්බන්ධයෙන් වන විට කලමනාකාර සංස්ථාව සමඟ ද කළමනාකරණ සංස්ථාව සමඟ ද
යථා පරිදි ලියා අත්සන්කර කළ ගිවිසුම් මගින් බැඳීම් ඇති කළ පරිද්දෙන් සහ ඒ බැඳීම් වල ප්‍රමාණයට ඒ සංස්ථාව සහ ඒ අයිතිකරුවන් වෙත බැඳීම් ඇති කරනු ලැබේ.

(6) කළමනාකරණ සංස්ථාව සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින්:-
(අ) කලින් කලට බලපවත්වන්නාවූ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය;

(ආ) බලපවත්නාවූ අතුරු ව්‍යවස්ථාවක පිටපතක් සඳහා, සහාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් හෝ සහාධිපත්‍ය කොටසක අයිතිකරු වෙනුවට ඉල්ලුම් කිරීමට නිසි බලයලත් තැනැත්තෙකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබුණු පසුව එකී අයිතිකරුට හෝ නිසි බලයලත් තැනැත්තාට සාධාරණ මිලකට අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ලබා දිය යුතු ය.

(7) කිසිම අතුරු ව්‍යවස්ථාවක්:-

(අ) යම් සහාධිපත්‍ය කොටසක රක්ෂණය තහනම් කිරීමේ හෝ සීමා කිරීමේ ලා;

(ආ) නැතහොත් මේ පනතින් හෝ මේ

පනත යටතේ ප්‍රකාශිතව හෝ ව්‍යංජිතව ඇති කරන ලද යම් පරවශතාවක් විනාශ කිරීමේ හෝ සුළු වශයෙන් වෙනස් කිරීමේලා
ක්‍රියාත්මක නොවිය යුතු ය.

(8) කළමනාකරණ සංස්ථාව විසින් සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවකම සහ තත්කාලයේ බලපවත්නා යම් අතුරු ව්‍යවස්ථාවක සෑම සුළු වෙනස් කිරීමකම හෝ සංශෝධනය කළ පිටපතක්, කළමනාකරණ සංස්ථාවේ මුද්‍රාව යටතේ සත්‍ය පිටපතක් වශයෙන් සහතික කර කළමනාකරණ සංස්ථාව විසින් පොදු පහසුකම් මණ්ඩලයේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

(9) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ට හෝ කළමනාකරණ සංස්ථාවට හෝ පරිපාලක හෝ අතුරු නියෝග වලට අනුකූල වීමට බැඳී සිටින යම් තැනැත්තෙකු විසින්,

(අ) යම් අතුරු නියෝගයක් ක්‍රියාත්මක වීම බලාත්මක කිරීම හෝ කඩ වීම වැළැක්වීම සඳහා; හෝ

(ආ) යම් අතුරු නියෝගයක් කඩ කිරීමෙන් පැනනගින, කිසියම් තැනැත්තකුට හෝ දේපළකට සිදුවන පාඩු හෝ හානි සඳහා අලාභ අය කර ගැනීම සඳහා,
වන නියෝගයක් කරන ලෙසට අධිකරණයෙන් ඉල්ලා සිටීමට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හෝ කළමනාකරණ සංස්ථාවට හෝ සහාධිපත්‍ය කොටසක කිසියම් අයිති

කරුවෙකුට හිමිකමක් තිබිය යුතු අතර කළමනාකරණ සංස්ථාව හෝ එහි සාමාජික මණ්ඩලය හෝ පරිපාලක යන එවැනි යම් තැනැත්තෙකුට එරෙහිව අධිකරණය විසින් අධිකරණයට සුදුසු යැයි හැඟී යන පරිදි එවැනි නියෝග කරනු ලැබිය හැකි ය.

(10) මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථා අතුරෙන් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන්නාවූ හෝ එකී අතුරු ව්‍යවස්ථා වල විධිවිධාන අනුව කටයුතු කිරීම පැහැර හරින්නාවූ හෝ සභාධිපත්‍ය කොටසක සෑම අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු ම සහ ඒ කඩ කිරීමට හෝ පැහැර හැරීමට දැන දැනම පාර්ශවකරුවකු වන්නාවූ සභාධිපත්‍ය කොටසක සෑම අයිතිකරුවකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

20. ඌ. (1) පොදු අංගෝපාංග, පාලනය කිරීමේ කළමනාකරණය කිරීමේ සහ පරිපාලනය කිරීමේ, ගෙවල් කුලී, වරිපනම් සහ රක්ෂණ වාරික ගෙවීමේ සහ කළමනාකරණ සංස්ථාවේ වෙනත් යම් බැඳීමක් නිදහස් ගැනීමේ කාර්යය සඳහා කළමනාකරණ සංස්ථාවේ මතය අනුව ප්‍රමාණවත් වන (මෙහි මින්මතු "කළමනාකරණ අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) පරිපාලන වියදම් සඳහා වූ අරමුදලක් කළමනාකරණ සංස්ථාව විසින් පිහිටවනු ලැබිය යුතු ය.

[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (33)]

(අ) අරමුදලට ගෙවීම සඳහා සංස්ථාව විසින් අයකරගත් සහ අයිතිකරුවන් විසින් ගෙවන ලද දායක මුදල්;

(ආ) අරමුදලට ගෙවීම් සඳහා සංස්ථාව විසින් අයකරගත් සහ අයිතිකරුවන් විසින් ගෙවන ලද දඩ, පොලී, දණ්ඩන ගාස්තු, වාරික ප්‍රතිසන්ධි ගාස්තු සහ තැන්පතු;

(ඇ) සංස්ථාවේ කිසියම් පුද්ගලික දේපලක් බැහැර කිරීමෙන් ලත් මුදල්;

(ඈ) සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාවට නැංවීම මගින් සංස්ථාව විසින් ලබාගත හැකි යම් මුදල් ප්රමාණයන් සියල්ල;

(ඉ) ශ්‍රී ලංකාව තුළදී හෝ ඉන් පිටතදී කවරාකාරයේ හෝ යම් මූලාශ්‍රයන්ගෙන් ණය, පරිත්‍යාග, තෑගි හෝ ප්‍රදාන ආකාරයෙන් සංස්ථාව විසින් ලබාගත හැකි යම් මුදල් ප්‍රමාණයන් සියල්ල;

බැර කළ යුතු ය.

(1) අ. මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති සීමාවන්ට යටත්ව, සංස්ථාව විසින් එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්, ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයන් සියල්ල සංස්ථාවේ කළමනාකරණ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

(2) ඒකමතික යෝජනා සම්මතයක් මගින් හෝ පොදු යෝජනා සම්මතයක් මගින්

සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ඇතිව කළමනාකරණ සංස්ථාව විසින් කළමනාකරණ අරමුදලින් මුදල් කිසිවක් එයට සුදුසු යැයි හැඟෙන පරිදි ආයෝජනය කරනු ලැබිය හැකිය;

එසේ වුවද එම යෝජනා සම්මතය සහ එකඟත්වය බලපත්‍රලාභී වාණිජ බැංකුවක, භාණ්ඩාගාර බිල්පත්වල, රාජ්‍ය උගස් සහ ආයෝජන බැංකුවක හෝ නිවාස සංවර්ධන සහ මූල්‍ය සංස්ථාවක (බැංකුවක) තිබෙන ස්ථාවර තැන්පතු ගිණුම් කිසිවකින් ආයෝජනය සඳහා අවශ්‍ය නොවිය යුතු ය;

(3) (1) උප වගන්තියේ සඳහන් කරන ලද අරමුණු සඳහා කළමනාකරණ අරමුදල පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා, කළමනාකරණ සංස්ථාව විසින්, මහා සභා වාරයකදී,

(අ) දායක මුදල් ලෙස කලින් කලට වැඩි කළ යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම;

(ආ) අදාළ සහාධිපත්‍ය කොටස් වලින් තමන්ගේ කොටස් පංගුවට ක්‍රමානුකූලව සහාධිපත්‍ය කොටස් සියල්ලේ අයිතිකරුවන්ගෙන් දායක මුදල් අයකර ගැනීමෙන් එසේ තීරණය කරන ලද මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) ප්‍රමාද වූ දායක මුදල් සම්බන්ධයෙන් සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු විසින් ගෙවිය හැකි පොලී ප්‍රමාණය තීරණය කිරීම;

(ඇ) අදාල සහ අධිපති කොටස් වලට සපයන ලද, ජලය, විදුලි බලය හෝ වෙනත් උපයෝගිතාව පිළිබඳ වූ සේවාවන් විසන්ධි කළ අවස්ථාවකදී, තැන්පතු හෝ දණ්ඩන ගාස්තු හෝ ප්‍රතිසන්ධි ගාස්තු සහ එම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ට ගෙවිය හැකි ප්‍රමාණයන් තීරණය කිරීම.

(3) අ. කළමනාකරණ සංස්ථාව විසින්, පොදු අංගෝපාංග වල මූලික අලුත්වැඩියා කිරීම් කිසිවක් හෝ සංස්ථාවෙන් වෙනත් යම් සමාන බැඳීම් කිසිවක් ඉටු කිරීම සඳහා වන හදිසි වියදම් සඳහා කළමනාකරණ අරමුදලේ කොටසක් ලෙස (මෙහි මින් මතු “නිදන් අරමුදල” යනුවෙන් සඳහන් කරනු ලබන) නිදන් අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

කළමනාකරණ සංස්ථාව විසින්:-

(අ) මහා සභා රැස්වීම රැස්වීමකදී නිදන් අරමුදල සඳහා කලින් කලට වෙන් කළ යුතු මුදල් ප්රමාණය තීරණය කිරීම;

(ආ) දැරිය යුතු යැයි නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වමින් කළමනාකරණ සංස්ථාව විසින්, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ එකඟත්වය ඇතිව විශේෂ යෝජනා සම්මතයක් හෝ පොදු යෝජනා සම්මතයක් සම්මත කරගෙන ඇත්නම් මිස, නිදන් අරමුදල කිසියම් වියදමක් දැරීමට ක්‍රියා නොකළ යුතු ය.

(4) සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු වන තැනැත්තෙකු විසින් හෝ ඔහු වෙනුවෙන්, නැතහොත් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සහාධිපත්‍ය කොටසක අපේක්ෂිත ගැනුම්කරු විසින් හෝ ඔහු වෙනුවෙන්, නැතහොත් සහාධිපත්‍ය කොටසක උකස් ලාභියා හෝ අපේක්ෂිත උකස් ලාභියා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, කළමනාකරණ සංස්ථාව විසින් ඒ තැනැත්තා වෙත:-

(අ) ඒ අයිතිකරුගේ දායක මුදල් වශයෙන් (3) වන උප වගන්තිය අනුව නිශ්චිත මුදල් ප්‍රමාණය;

(ආ) ඒ උප වගන්තියට අනුව නිශ්චිත මුදල් ප්‍රමාණය ගෙවිය යුතු කාලය සහ ආකාරය;

(ඇ) දායක මුදල් (ගෙවා තිබේ නම්) ගෙවා ඇති ප්‍රමාණය;

(ඈ) 20ඈ වගන්තියේ (5) වන උප වගන්තිය ප්‍රකාර සහාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාව විසින් එවකට අයකර ගනු ලැබිය යුතු වූ මුදල් ප්‍රමාණයක් වෙතොත් එය;

(ඉ) (1)වන උපවගන්තියට අනුව කළමනාකරණ සංස්ථාව විසින් තබන ලැබ, පවත්වා ගෙන යනු ලැබුවා වූ අරමුදල හෝ අරමුදල්වල බැරට තිබෙන මුදල හෝ ඒ ඒ මුදල් ප්‍රමාණ සහ කළමනාකරණ සංස්ථාව විසින් එවකටත් දරන ලද වියදම් කිසිවක් වෙනුවෙන් ඒ

අරමුදලින් හෝ අරමුදල්වලින් වැය කරනු ලැබූ හෝ වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණ; සහ

(ඊ) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ සහාධිපත්‍ය කොටසක අයිතිකරු විසින් දැරිය හැකි බැර කමක් ඇතිවන යම් වියදමක් කළ කළමනාකාර සංස්ථාව විසින් දරන ලද්දේ ද නැද්ද යන බව හෝ එසේ වූ යම් අලුත්වැඩියා කිරීම්, වැඩ හෝ ක්‍රියාවක් කරන ලද්දේ ද නැතහොත් කිරීමට ආසන්න ද යන බවද, එසේනම් ඇස්තමේන්තු කළ වියදම් ප්‍රමාණය හෝ ඒ අලුත්වැඩියා කිරීම්වල, වැඩවල ක්‍රියාවේ සාමාන්‍ය ස්වභාවය;

සහතික කරමින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ සහතිකය, ඒ මගින් සහතික කර ඇති කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාවට විරුද්ධව සහ ඒ සහතිකය මත සද්භාවයෙන් විශ්වාසය තබන (සාමාජිකයා ඇතුළු) යම් තැනැත්තකුගේ වාසියට තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

(5) සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් (3)වන උප වගන්තිය යටතේ අය කරනු ලබන යම් දායක මුදලක් කළමනාකරණ සංස්ථාව විසින් ඒ සඳහා වූ යෝජනා සම්මතයක් මගින් සම්මත කරනු ලැබූ විට සහ ඒ යෝජනා සම්මතයෙන් නියම වලට අනුකූලව අය විය යුතු අතර, එය එසේ ගෙවනු ලැබිය යුතු ය. තවද, සිවිල් ණයක් මෙන් එය, සහාධිපත්‍ය කොටසක අයිතිකරුගෙන් සහාධිපත්‍ය කොටසට හිමිකම් ලබන ඔහුගේ අනුප්‍රාප්තිකයා

ගෙන් අය කර ගනු ලැබිය හැක.

(6) (5)වන උප වගන්තියේ කාර්යය සඳහා "සහාධිපත්‍ය කොටසක අයිතිකරු" යන්නට, අනුයෝජිතයා හෝ භාරකරු හෝ භාරගැනුම්කරු වශයෙන් තත්කාලයේ ඒ ඒකකය භාර ගන්නා තැනැත්තා ද ඒ සහාධිපත්‍ය කොටස කුලී නිවැසි යෙකුට දුන්නේ නම් කුලිය ලැබිය යුතු වන තැනැත්තා ද ඇතුළත් වේ.

"දායක මුදල් ආපසු අය කර ගැනීම"
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (34)]

20. ඒ. (1) (අ). සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් 20ඌ වගන්තියේ (3)වන උප වගන්තිය යටතේ යම් දායක මුදලක් පනවා ඇත්තාවූ; හෝ

(ආ) 20ඇ වගන්තියේ 5වන උප වගන්තියට අනුව සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාව විසින් යම් මුදල් ප්‍රමාණයක් අයි කරගත යුතුව ඇත්තාවූ අවස්ථාවක, ඒ දායක මුදල හෝ මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා වූ ලිඛිත ඉල්ලීමක් කළමනාකරණ සංස්ථාව විසින් යවනු ලැබීමෙන් පසු දින 14 ක කාලසීමාවක් ඉකුත් වූ විටද ඒ දායක මුදල හෝ මුදල් ප්‍රමාණය නොගෙවා තිබෙන්නේ නම්, ඒ දායක මුදල හෝ මුදල් ප්‍රමාණය, ඒ මත වූ යම් පොලියක් ඇතොත් එයද ඇතුළුව, කළමනාකරණ සංස්ථාවේ වාසියට සහාධිපත්‍ය කොටස මතවූ ප්‍රථම වැය භාරයක් වන්නේ ය.

(2) කළමනාකරණ සංස්ථාව ලියාපදිංචි කරන ලද උසස් ලාභියකු වූ පරිද්දෙන් (3) වන උප වගන්තියේ විධිවිධාන වලට

යටත්ව, විකිනීමේ බලය සහ ඊට අදාළ වූ අනුශාංගික සියලු බලතල කළමනාකරණ සංස්ථාව ඇත්තේය. තවද, අය විය යුතු දායක මුදල් ප්‍රමාණය (ඒ පිළිබඳව වූ යම් පොළියක් ද ඇතුළුව) සභාධිපත්‍ය කොටස පිළිබඳව ආණ්ඩුවේ හෝ ව්‍යවස්ථාපිත යම් අධිකාරියක ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් වලට සහ අයකිරීම් වලට සහ එකී වැය භාර සාධන පත්‍රය තැන්පත් කළ දිනට පෙර ලියාපදිංචි කරන ලද හෝ දැනුම් දෙන ලද සියලු බැඳීම්වලට යටත් විය යුතු ය.

(3) (2)වන උප වගන්තිය යටතේ සභාධිපත්‍ය කොටස විකිණීම සඳහා කටයුතු කරගෙන යාමේදී:-

(අ). සභාධිපත්‍ය කොටස විකිණීමට කළමනාකරණ සංස්ථාව විසින් විශේෂ යෝජනාවක් සම්මත කරනු ලැබුවොත් මිස;

(ආ) අදහස් කරන ලද විකිණීම පිළිබඳ දැන්වීමක් දිනපතා පුවත්පත් එකක හෝ වැඩි ගණනක වරක් පළ කරනු ලැබුවොත් මිස;

(ඇ) ඒ පළකිරීමේ දිනයෙන් පසු සති හයක කාලසීමාවක් ඇතුළත, දායක මුදල මත වූ පොළිය සහ අවශ්‍ය වූ වෙනයම් අනුශාංගික ගාස්තු මෙන්ම (ආ) ඡේදයෙහි සඳහන් පල කිරීමේ ගාස්තු ද ඇතුළු දායක සඳහා කිසිම ගෙවීමක් නො කරනු ලැබුවහොත් මිස; සහ

(ඇ) විකිණීම කරගෙන යාමෙන් කළමනාකරණ සංස්ථාව වැළැක්වීම සඳහා කිසිම නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් අධිකරණය ඉදිරියේ නොවුණහොත් මිස
සභාධිපත්‍ය කොටස විකිණීම සඳහා කළමනාකරණ සංස්ථාව විසින් ක්‍රියාකරනු නොලැබිය යුතු ය.

(4) කළමනාකරණ සංස්ථාවේ විකිනීමේ බලය ක්‍රියාත්මක කෙරෙමින්, (3)වන උපවගන්තියේ විධිවිධානවලට අනුව වැය භාරයක් වශයෙන් කළමනාකරණ සංස්ථාව විසින් යම් සභාධිපත්‍ය කොටසක පැවරීමක් කරනු ලැබ, ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ටාර් වෙත තැන්පත් කරනු ලැබූ අවස්ථාවක:-

පහත දැක්වෙන ලේඛන, එනම්:-

(i) කළමනාකරණ සංස්ථාවේ සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේදී තබනලද කළමනාකරණ සංස්ථාවේ මුද්‍රාව සහිත කළමනාකරණ සංස්ථා විකුණුම් බලය ක්‍රියාත්මක කිරීමේ බලය දුන් කළමනාකරණ සංස්ථාවේ විශේෂ යෝජනා සම්මතයේ සහතික කරන ලද සත්‍ය පිටපතක්;

(ii) (3)වන උපවගන්තිය (ආ)ඡේදයේ සඳහන් පලකිරීම පිළිබඳව එක් එක් දැන්වීමේ පිටපතක්; සහ

(iii) අවශ්‍ය සියලු අනුශාංගික ගාස්තු ද

ඇතුළත් ඇතුළුව දායක මුදල සහ ඒ මත අයවියයුතු පොළිය නොගෙවූ බව සහ සහධිපත්‍ය කොටස විකිණීම කරගෙන යාමෙන් කළමනාකරණ සංස්ථාව වළක්වන කිසිම නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් අධිකරණ ඉදිරියේ නොපවතින බව එක්ව ප්‍රකාශ කරමින් මේ ඡේදයේ (1)වන අනුඡේදයේ සඳහන් කළමනාකරණ සංස්ථාවේ සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් කරන ලද ව්‍යවස්ථාපිත ප්‍රකාශයක්;

රෙජිස්ටාර් වෙත තැන්පත් කරනු ලබන්නේ නම් මිස ලියාපදිංචි කිරීම සඳහා භාර නොගත යුතු ය; තවද

(ආ) කළමනාකරණ සංස්ථාවෙන් සහාධිපත්‍ය කොටසක මිලට ගන්නා තැනැත්තා හෝ රෙජිස්ටාර් විසින් විකිණීමේ හෝ පැවරීමේ විධිමත් භාවය හෝ වලංගු භාවය පිළිබඳ විමසා බැලීම අවශ්‍ය නොවන්නේය.

(5) කළමනාකරණ සංස්ථාව විසින්, මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් ස්වකීය විකුණුම් බලය වැරැදි ලෙස හෝ අන්‍යාකාරයකින් ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක, විශේෂ යෝජනාව සම්මත කරගනු ලැබූ අවස්ථාවේදී පැමිණ සිටියා වූ හෝ සම්මත කරගනු ලැබූ සහ මේ වගන්තියේ (4) වන උප වගන්තියට අනුව පැවරීම සමග තැන්පත් කරනු ලැබූ විශේෂ යෝජනා සම්මතයේ සහතික කරන ලද සත්‍ය පිටපතට කළමනාකරණ සංස්ථාවේ මුද්‍රාව තබන අවස්ථාවේ එහි පැමිණ සිටියා වූ කළමනාකරණ සංස්ථාවේ සෑම

සාමාජිකයෙකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(6) දායක මුදල, ඒ මත වූ සියලු පොලිය සහ අවශ්‍ය වූ යම් අනුශාංගික ගාස්තු ද ඇතුළුව ගෙවනු ලැබූ විට, කළමනාකරණ සංස්ථාව විසින් ඒ ගෙවීම ලැබීමේදී සහාධිපත්‍ය කොටස නිදහස් කරනු ලැබිය යුතු ය.

(6) අ. මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීති එක විධිවිධාන වලින් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද කළමනාකරණ සංස්ථාව මගින් මේ පනතේ (20) ඌ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන වලට අනුව ඉල්ලා සිට ඇති මුදල් වලින් යම් මුදලක් ගෙවීම සහාධිපත්‍ය කොටසේ අයිතිකරු පැහැර හරින්නේ නම් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතනය වෙනත් යම් අධිකාරියක් හෝ බලපත්‍රලාභියා විසින් කළමනාකරණ සංස්ථාව හරහා පුද්ගල සහාධිපත්‍ය කොටසට සපයනු ලබන ජලය, විදුලිය හෝ වෙනත් යම් උපයෝගීතාවක් වැනි සේවා සැපයුම් විසන්ධි කිරීමට අදාල බලතල කළමනාකරණ සංස්ථාවට තිබිය යුතු ය.

(අ) එසේ විසන්ධි කිරීම සඳහා විශේෂයෙන්ම සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතයක් ඇත්නම් මිස;

(ආ) යෝජනා සම්මතයෙන් පිටපතක් සහිතව අපේක්ෂිත විසන්ධි කිරීම පිළිබඳ

දින දහ හතරකක දැනුම්දීමක් අදාල සභාධිපත්‍ය කොටසේ අයිතිකරුට ලියාපදිංචි තැපෑලෙන් යවා ඇත්නම් මිස,

කලමනාකරණ සංස්ථාව විසින් සැපයුම විසන්ධි නොකළ යුතු ය.

(7) දායක මුදල හෝ අයවිය යුතු මුදල් ප්‍රමාණය සහ යම් සභාධිපත්‍ය කොටසක අයිතිකරුගෙන් හෝ සභාධිපත්‍ය කොටසකට හිමිකම් ලබන ඔහුගේ අනුප්‍රාප්තිකයා ගෙන් සිවිල් ණයක් වශයෙන් යම් සභාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් වූ යම් දායක මුදලක් හෝ මුදල් ප්‍රමාණයක් අයකිරීම සඳහා අවශ්‍යයෙන්ම දරනලද නීති ගාස්තු සහ අනුශාංගික අය කිරීම් ද ඇතුළුව ඒ මත වූ සියලු පොලියද (20) ඇ වගන්තියේ (5) වන උපවගන්ති හෝ (20) ඌ වගන්තියේ (5) වන සහ (6) වන උපවගන්ති වලින් හෝ කළමනාකරණ සංස්ථාව මත පැවරුණු අයිතිවාසිකම් සහ බලතල වලට හානියක් නොමැතිව, අයකර ගැනීම සඳහා මේ වගන්තියෙන් විධිවිධාන සැලැසෙන්නේය.

(8) මේ වගන්තියෙහි “ආණ්ඩුවේ හෝ ව්‍යවස්ථාපිත අධිකාරිය” යන්නට, අනිවාර්යෙන් ඉඩම් තහනම් කිරීමට, විකිණීමට හෝ අත් කරගැනීමට යම් ලිඛිත නීතියකින් බලයලත් හෝ බලය පවරන ලද තැනැත්තෙක් සංස්ථාවක් හෝ මණ්ඩලයක් ඇතුළත් වේ.

20. ඔ. (1) කළමනාකරණ සංස්ථාව විසින්, එහි බලතල හෝ කර්තව්‍යය කිසිවක්

ක්‍රියාවේ යෙදවීමේදී හෝ එහි කාර්යය හෝ වගකීම් ඉටු කිරීමේදී හෝ කළමනාකරණ සංස්ථාව විසින් දරන ලද යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම, මේ වගන්තිය ප්‍රකාර කළමනාකරණ සංස්ථාවේ තත්කාලයේ සහ කලින් කළ සාමාජිකයන් වන තැනැත්තන් විසින් ඇප වී සහතික කරනු ලැබිය යුතු ය. එක් එක් සහාධිපත්‍ය කොටසේ අයිතිකරුවෝ අයිතිකරුවන් වන සාමාජිකයා වූ සාමාජිකයන් ඒ සහතිකවීම පිට වගකිවයුත්තේ ඒ සහාධිපත්‍ය කොටසේ, කොටස් හිමිකම, සියලු සහ සහාධිපත්‍ය කොටස්වල කොටස් හිමිකම් වල මුළු එකතුවට දරන අනුපාතයට අනුව පමණක් එම ඇපකරය යටතේ එක් එක් සහාධිපත්‍ය කොටස යටත් විය යුතු ය.

"කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයන්ගේ වගකීම."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (35)]

(2) අ. (1) වන වගන්තිය යටතේ කළමනාකරණ සංස්ථාවේ සාමාජිකයකුගේ හෝ කලින් සාමාජිකයකුගේ යම් වගකීමක් හේතුකොටගෙන යම් කරුණක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා හෝ ඒ කලින් සාමාජිකයා හෝ විසින් 20උෟ වගන්තියේ (3)වන උප වගන්තිය යටතේ ඒ කරුණ සම්බන්ධයෙන් ගෙවීමට බැඳී සිටින අනුපාතිකයට වැඩියෙන් ගෙවීමට බැඳී ඇත්තා වූ සහ ගෙවනු ලැබුවා වූ ද;

(ආ) කළමනාකරණ සංස්ථාවේ වෙනයම් සාමාජිකයෙකු හෝ සාමාජිකයන්, ඒ කරුණම සම්බන්ධයෙන් ඒ උප වගන්තිය යටතේ ඔහුගේ හෝ ඔවුන්ගේ වගකීම ඉටු නොකළා හෝ සම්පූර්ණයෙන් ඉටු නොකළා වූ ද;

අවස්ථාවක මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සාමාජිකයාට හෝ කලින් සාමාජිකයාට මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සාමාජිකයා ගෙන් හෝ සාමාජිකයන්ගෙන් ඒ කාරණය සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය 20ඌ වගන්තියේ (3)වන උපවගන්තිය යටතේ ඒ කරුණ සම්බන්ධයෙන් ඔහු ගෙවීමට යටත් වූ අනුපාතිකයේ මුදල් ප්‍රමාණය ඉක්මවන මුදල් ප්‍රමාණය ට නොවැඩි ගණනක් ඒ සාමාජිකයාගෙන් හෝ සාමාජිකයන්ගෙන් ඔහුට අයවිය යුතු ණයක් වශයෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයකදී ඒ සාමාජිකයාගෙන් හෝ ඒ සාමාජිකයන්ගෙන් අයකරගැනීමට හිමිකම ලැබිය යුතු ය. එහෙත්, මේ උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් කිසිම සාමාජිකයකු 20ඌ වගන්තියේ (3)වන උප වගන්තිය යටතේ ඒ කරුණ සම්බන්ධයෙන් ඔහුගේ වගකීමෙන් නිදහස් නොවී ඉතුරු මුදල් ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙවීමට නොබැඳිය යුතු ය.

"ස්වකීය දේපල පාලනය කල නොහැකි අයිතිකරුවන් ගේ ඡන්දය දීමේ බලතල."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (36)]

20. ඕ. (1) යම් හේතුවක් නිසා තමාගේ දේපළ පාලනය කිරීමට සහධිපත්‍ය කොටසක අයිති කරුවෙකුට නොහැකි වන අවස්ථාවක, මේ පනතේ පළමුවන උපලේඛනයෙන් ඔහු වෙත පැවරුණු ඡන්දය දීමේ බලතල, ඒ දේපළ පාලනය කිරීම සඳහා තත්කාලයේ නීතියෙන් බලය දෙන ලද තැනැත්තා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) අයිතිකරුගේ සම්බන්ධතාවය, ලියාපදිංචි කරන ලද එක් උකසකට හෝ වැඩි ගණනකට යටත් වන අවස්ථාවක, මේ පනතේ පළමුවන උපලේඛනය ඔහු වෙත පැවරුණු ඡන්දය දීමේ බලතල:-

(අ) ඒකමතික යෝජනා සම්මතයක් අවශ්‍ය වන යම් විටකදී, පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයකු මගින් ප්‍රමුඛතාවය අනුව පළමුව හිමිවූ උකස්ලාභියා විසින්, ඡන්දය දීමේ එකී බලතල ක්‍රියාත්මක කිරීමට ඔහු අදහස් නොකරන බව කළමනාකරණ සංස්ථාව වෙත මහා සභා රැස්වීම පෙරාතුව කවර වූ විටකදී ලිඛිතව දැනුම් දී ඇත්නම් මිස, ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ආ) වෙනත් යම් විටකදී, එකී ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කිරීම තමාගේ අදහස බව කළමනාකරණ සංස්ථාව වෙත ලිඛිත දැන්වීමකින් මහා සභා රැස්වීමට පෙරාතුව කවර හෝ විටදී ප්‍රමුඛතාවය අනුව පළමුව හිමිවූ උකස්ලාභියා විසින් දැනුම් දී ඇත්නම් මිස, අයිතිකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර එසේ දැනුම් දී ඇති අවස්ථාවක, මහා සභා රැස්වීමේදී උකස්ලාභියා පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයකු මගින් පෙනී සිටි විට ඡන්දය දීමේ බලතල උකස්ලාභියා විසින් ක්රියාත්මක කරනු ලැබිය යුතු ය. තවද, උකස්ලාභියා හෝ ඔහුගේ ප්‍රතියුක්තයා මහා සභා රැස්වීමේදී පෙනී නොසිටියේ නම්, ඡන්දය දීමේ බලතල (ඇ) ඡේදයේ විධිවිධාන වලට යටත්ව, අයිතිකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ඇ) යම් ප්‍රමුඛතාවකින් පළමුව හිමිකම ලැබූ උකස්ලාභියා, ඔහුගේ ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කිරීමට නො කැමැති විටෙක දී, ප්‍රමුඛතාවය අනුව ඊළඟ හිමිකම ලැබූ ලියා පදිංචි කරන ලද උකස්ලාභියා හෝ ඔහුගේ ප්‍රතියුක්තයා විසින්, ප්‍රමුඛතාවෙන් පළමුව හිමිකම ලැබූ උකස්ලාභියා මත පැවරුණු ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කළ හැකි අතර, ප්‍රමුඛතාවයට අනුව ඊළඟ හිමිකම ලැබූ ලියාපදිංචි කරන ලද උකස්ලාභියා හෝ ඔහුගේ ප්‍රතියුක්තයා එකී මහා සභා රැස්වීමේදී පැමිණ නොසිටී, නම් ඒ ඡන්දය දීමේ බලතල අයිතිකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කරන ලද උකස්ලාභියා ගේ සම්බන්ධතාවය කළමනාකරණ සංස්ථාව වෙත දැනුම් දෙනු ලැබුවහොත් මිස (2) වන උපවගන්තිය මගින් පැවරුණු ඔහුගේ ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඔහුට හිමිකම නොලැබිය යුතු ය.

"ඇතැම් අවස්ථාවලදී ඡන්දයදීමේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාරකාරවරයා පත් කිරීමට අධිකරණය සතු බලය."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (37)]

20. ක. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ කළමනාකරණ සංස්ථාවේ හෝ සභාධිපත්‍යය කොටසක අයිතිකරුගේ ඉල්ලීම මත, සභාධිපත්‍යය කොටසක් සම්බන්ධයෙන් ඡන්දය දීමට හැකි කිසිම තැනැත්තකු හෝ මණ්ඩලයක් නොමැති බවට අධිකරණය සෑහීමකට පත්වූ අවස්ථාවක, අධිකරණය විසින්:-

(අ) මේ පනතින් ඒකමතික සභා සම්මතයක් අවශ්‍ය අවස්ථාවලදී, මේ පනත

යටතේ සභාධිපත්‍ය කොටසට සම්බන්ධ, අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මහා භාරකාරවරයා හෝ, වෙනත් යම් සුදුසු සහ නිසි තැනැත්තෙකු හෝ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු අතර,

(ආ) වෙනත් යම් අවස්ථාවකදී මේ පනත යටතේ සභාධිපත්‍ය කොටසට සම්බන්ධ අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ඡන්දය දීමේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මහා භාරකාරවරයා හෝ වෙනත් යම් සුදුසු හා නිසි තැනැත්තෙකු හෝ මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි ය.

20. ග. (1) කළමනාකරණ සංස්ථාව විසින් සභාධිපත්‍ය දේපළෙහි අර්ධ සභාධිපත්‍ය දේපළ ඉදිරි ගොඩනැගිලි පේලියේ හෝ ඒ අසල:-

"දැන්වීම් සහ ලේඛණ භාරදීම."
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (38)]

(අ) කළමනාකරණ සංස්ථාවේ නම සහ ලේඛණ බාරදීම සඳහා ලියා පදිංචි සභාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා දක්වා ඇති ලිපිනය පෙන්නුම් කරන දැන්වීමක් නොකඩවා ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය; තවද

(ආ) ලේඛණ බාරදීම සඳහා ලියාපදිංචි සභධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරේ දක්වා ඇති ලිපිනය සභාධිපත්‍ය දේපල හෝ අර්ධ සභාධිපත්‍ය දේපල ඇතුළත ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි තැපැල් ලිපිනය වන අවස්ථාවක, තැපෑලෙන් එන භාණ්ඩ බහාලීමේ කාර්යය සඳහා සුදුසුවූද කළමනාකරණ

සංස්ථාවේ නම පැහැදිලිව දැක්වෙන්නා වූ ද බහලුවක් නොකඩවා තබා තිබිය යුතු ය.

(2) ලේඛන භාරදීම සඳහා වූ ලිපිනය වෙනස් කරන ලද අවස්ථාවක, කළමනාකරණ සංස්ථාව විසින් නොපමාවම ඒ වෙනස රෙජිස්ටාර්ට හා පොදු පහසුකම් මණ්ඩලයට දැනුම් දිය යුතු අතර රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි සභාධිපත්‍යය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ඒ අනුව සංශෝධනය කළ යුතු ය.

(3) ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරේ හෝ එහි යම් සංශෝධනයක දැක්වෙන කළමනාකරණ සංස්ථාවේ ලිපිනයට යොමු කර ලියා පදිංචි තැපෑලෙන් යැවීමෙන් යම් ලේඛනයක් කළමනාකරණ සංස්ථාව වෙත භාරදිය හැකි ය.

(4) කළමනාකරණ සංස්ථාවේ අන්තිමට සටහන්ව ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවන ලද යම් දැන්වීමක්, ලිපිය භාර දෙනු නොලැබ තැපැල් කාර්යාලය මඟින් ආපසු එවනු ලැබුව ද, සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් ලිපියක් භාර දෙනු ලබන කාලයේදී, කළමනාකරණ සංස්ථාව වෙත නිසි පරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා “ලේඛනය” යන්නට සිතාසියක්, දැන්වීමක්, ආඥාවක්, නියමයක් සහ වෙනත් නීත්‍යානුකූල කැඳවීම් නියෝගයක් ඇතුළත් වේ.

“අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ල කට හානි පැමිණි විට ගතයුතු ක්‍රියා මාර්ගය.”
[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (39)]

20. ජ. සභාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති ගොඩනැගිල්ලකට හානි පැමිණි නමුත් එය සම්පූර්ණයෙන්ම විනාශ වී නැති අවස්ථාවක කළමනාකරණ සංස්ථාව විසින් පහත දැක්වෙන කටයුතු ඒ ප්‍රමුඛත්ව අනුපිළිවෙළට කළ යුතු ය:-

(අ) සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට සහ රක්ෂකයාට වහාම දැනුම් දිය යුතු අතර බෙදා වෙන්කරන ලද ගොඩනැගිල්ලේ අලාභ සිදු වී ඇති කොටස අලුත්වැඩියා කොට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව එම බෙදා වෙන් කරන ලද ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් දිගටම ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු ය;

(ආ) අනුකොටස්වලට බෙදනලද ගොඩනැගිල්ලට සිදුවූ හානි වෙනුවෙන් කළමනාකරණ සංස්ථාවට ලැබුණු රක්ෂණ මුදල් (අ) ඡේදයේ සඳහන් වූ යථා තත්ත්වයට පත් කිරීමේ සහ අනු කොටස්වලට බෙදා ගොඩනැගිල්ල නොකඩවා පාවිච්චි කර ගෙන යාමේ වැඩපිළිවෙළ සඳහා යෙදිය යුතු ය;

(ඇ) කළමනාකරණ සංස්ථාව ලැබුණු රක්ෂණ මුදල් සභාධිපත්‍ය කොටස් වල අයිතිකරුවන්ට හෝ තමන්ගේ සභාධිපත්‍ය කොටස් හානියට පත් හෝ විනාශ වූ සමහර අයිතිකරුවන්ට හෝ එම අයිතිකරුවන් එක් කෙනෙකුට හෝ වැඩි

"අනු කොටස් වලට බෙදූ ගොඩනැගිලි විනාශ වීම."

[§ 1982 අංක 45, (11)]
[§ 2003 අංක 39, (40)]

දෙනෙකුට ගෙවීමට විධාන කළ යුතු ය.

20. ට. (1) සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කරන ලැබූ අනු කොටස් වලට බෙදනු ලැබූ ගොඩනැගිල්ලක සියලුම සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන් ඒ අනු කොටස්වලට බෙදා ගොඩනැගිල්ල විනාශ කළ යුතු බව ඒකමතිකව සම්මත කරන අවස්ථාවක, ඒ ගොඩනැගිල්ල විනාශ වී ඇති ලෙස මේ පනතේ කාර්යය සඳහා සැලකිය යුතු ය.

(2) අනුකොටස් වලට බෙදූ ගොඩනැගිල්ලක් විනාශ කරනු ලැබූ පසු නොපමාවම කළමනාකරණ සංස්ථාව විසින්, ඒ ගොඩනැගිල්ල විනාශ කරනු ලැබූ බවට දැන්වීමක් රෙජිස්ට්‍රාර්ට සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ට දැන්විය යුතු ය.

(3) එම දැන්වීම ලැබුණු විට රෙජිස්ට්‍රාර් විසින්, අනු කොටස් වලට බෙදූ ඒ ගොඩනැගිල්ල විනාශ කිරීම පිළිබඳව නිවේදනයක් සහ සහාධිපත්‍ය දේපල අයිතිකරුවන් වෙත පොදු කුලී නිවැසියන් වශයෙන් සතු කිරීම පිළිබඳ සඳහනක් ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරේ ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහාධිපත්‍ය දේපළ ඇතුළත් වෙළුමේ සහ පත්ඉරුවේද සටහන් කළ යුතු ය.

(4) එම සඳහන ඇතුළත් කළ පසු:-

(අ) එක් එක් අයිතිකරු සහාධිපත්‍ය කොටසේ අයිතිකරු වීම අවසාන විය යුතු

අතර ඔහු අනික් අයිතිකරුවන් සමග පොදු කුලී නිවැසියෙකු වශයෙන්, ඔහුගේ සහාධිපත්‍ය කොටස්වලට අනුපාතිකව ද ඔහුගේ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් ඔහු විසින් දරන ලද පදිංචියේ හිමිකමට සමාන හිමිකම් යටතේ ද සහාධිපත්‍ය දේපළ හිමිකම් ලැබිය යුතු ය;

(ආ) ඔහුගේ සහාධිපත්‍ය කොටස විෂයෙහි ලියා පදිංචි කරන ලදුව ඉතිරිව ඇති යම් බැඳීමක් සහාධිපත්‍ය දේපල සංයුක්ත වන ඉඩමෙහි ඔහුගේ කොටස විෂයෙහි බැඳීමක් විය යුතු ය. තවද එම ඉඩම ඇතුළත් ඉඩම් ලියාපදිංචි කිරීමේ ලේඛනයේ වෙලුමේ හා පත්‍ඉරුවේ සටහන් කරන ලද සඳහනක් හෝ නිවේදනයක් ඔහුගේ සහාධිපත්‍ය කොටස විෂයෙහි එම බැඳීම ලියා පදිංචි කරන ලද දිනයම දැරිය යුතු ය; තවද

(ඇ) පනත යටතේ ව්‍යංජිත වන සියලු ව්‍යවස්ථාපිත පරවශතා, සහාධිපත්‍ය දේපළ සංයුක්ත කරන දේපළ හෝ එහි යම් කොටසක් කෙරෙහි බලපෑම නතර විය යුතු ය.

(5) කලින් අයිතිකරුවන් විසින් ඒකමතික යෝජනා සම්මතයෙන් සහාධිපත්‍ය දේපළ හෝ ඉන් යම් කොටසක් පැවරීමට කළමනාකරණ සංස්ථාවට විධාන කළ හැකි ය.

(6) යෝජනා සම්මතය නිසි ලෙස සම්මත වූ බවටත් පැවිදි වීමට අදහස්

කරනු ලබන සහාධිපත්‍ය දේපළ හෝ එහි යම් කොටසක් විෂයෙහි වූ තම තමන්ගේ සම්බන්ධතා මුදාහැරීමට සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සම්බන්ධතා ඇති සියලු තැනැත්තන් ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කර ඇති බවටත් කළමනාකරණ සංස්ථාව සෑහීමකට පත් වුවහොත් කළමනාකරණ සංස්ථාව විසින් උචිත පැවරීම ලියා අත්සන් කළ යුතු අතර සහාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සම්බන්ධතාවයක් ඇති කිසිම තැනැත්තෙකු විසින් ලියා අත්සන් කිරීමක් නොමැතිව ඒ පැවරීම වලංගු සහ බල සහිත විය යුතු ය. පැවරීම යටතේ කළමනාකරණ සංස්ථාවට ගෙවිය යුතු කිසියම් මුදල් ප්‍රමාණ සඳහා කළමනාකරණ සංස්ථාව විසින් නිකුත් කරන ලද කුවිතාන්සිය ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු අතර එසේ ලබා ගන්නා ලදැයි ප්‍රකාශිත මුදල් ගැන වගබලා ගැනීමෙන් හෝ මුදල් නැති වීමක් හෝ අයථා ලෙස යෙදවීම සම්බන්ධයෙන් වගකීමෙන්, පැවරීම යටතේ ලබාගන්නා තැනැත්තා නිදහස් විය යුතු ය.

(7) කළමනාකරණ සංස්ථාව විසින් ඉහත අන්තිමටවූ උප වගන්තිය යටතේ ලියා අත්සන් කරන ලද පැවරීමක්, යෝජනා සම්මතය නිසිලෙස වූ බවට සහ සියලු අවශ්‍ය කැමැත්ත දීම් ලැබී ඇති බවට කළමනාකරණ සංස්ථාවේ මුද්‍රාව යටතේ වූ සහතිකයක් සමග ඇත්නම් මිස ලියාපදිංචි කිරීම සඳහා භාර නොගත යුතු ය. එවැනි සහතිකයක් සහාධිපත්‍ය දේපළ ගැණුම්කරුවෙකු ගේ වාසියට සහ රෙජිස්ට්‍රාර්ගේ වාසියටද එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක

සාක්ෂි විය යුතු ය.

(8) අනු කොටස්වලට බෙදූ ගොඩනැගිල්ලක් විනාශ කිරීම පිළිබඳ දැන්වීමක් රෙජිස්ට්‍රාර් වෙත යැවීමෙන් පසුව, කලින් අයිතිකරුවකු විසින් හෝ කළමනාකරණ සංස්ථාව විසින් ඉඩම හෝ එහි යම් කොටසක් පවරනු ලැබූ අවස්ථාවක:-

(අ) පැවරීම කරන්නේ කලින් අයිතිකරු නම් ඔහු ඔහුගේ සහාධිපත්‍ය කොටසට අදාළ හිමිකම් ඔප්පු රෙජිස්ට්‍රාර්ට භාරදිය යුතු ය.

(ආ) පැවරීම කරන්නේ, සියලු කලින් අයිතිකරුවන් වෙනුවෙන් කළමනාකරණ සංස්ථාව නම්, කළමනාකරණ සංස්ථාව සියලු කලින් අයිතිකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ හිමිකම් ඔප්පු රෙජිස්ට්‍රාර්ට භාර දිය යුතු ය; තවද

(ඇ) අවස්ථාවෝචිත පරිදි සහාධිපත්‍ය කොටසට හෝ සහාධිපත්‍ය කොටස් වලට අදාල සහාධිපත්‍ය හිමිකම් සහතික තමා වෙත ලැබීමේදී රෙජිස්ට්‍රාර් වරයා විසින් සහාධිපත්‍ය හිමිකම් සහතික අවලංගුකර සහාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සහාධිපත්‍ය දේපළෙහි සහාධිපත්‍ය කොටස් වලට අදාල ලේඛණ වල අවශ්‍ය සටහන් සිදුකළ යුතු අතර, ඉන් පසුව පැවරුම්ලාභියා විසින් ඉඩම් කොටස සම්බන්ධයෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු ය;

(9) මේ වගන්තිය යටතේ අනු කොටස්වලට බෙදීමක් අවසන් වීම ගැන නොතකා, සහාධිපත්‍ය දේපළ පිළිබඳ අතිරේක ලේඛනයෙහි අදාල සටහන කළමනාකරණ සංස්ථාව පවත්නා තාක් කල් එම අනු කොටස් වලට බෙදීම අවසාන වීමට පෙර තිබූ කරුණු පිළිබඳ සටහනක් ලෙස සාක්ෂියේලා භාවිත කළ හැකි ය.

(10) (5)වන උප වගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ හෝ පැවරීම සඳහා ඉල්ලීමක් සිදුකොට ඒ ඉල්ලීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර ඇති අවස්ථාවක සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කරන තුරු එම කළමනාකරණ සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය;

(11) අධිකරණය විසින් සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ කළමනාකරණ සංස්ථාව හෝ එහි පරිපාලක හෝ කලින් අයිතිකරුගේ හෝ කලින් උකස්ලාභියකු ගේ ඉල්ලීම මත, ආඥාවක් මගින්, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හෝ කළමනාකරණ සංස්ථාවේ කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා ද ගණන් බේරා වසා දැමීම ක්‍රියාත්මක කිරීම පිණිස ඇවර කරුවෙකු පත්කිරීම සඳහාද විධිවිධාන සැලැස්විය හැකි ය;

(12) කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීම සඳහා අධිකරණය විසින් ඈවර කරුවකු පත්කරන්නේනම් මිස, සහ එසේ පත්කරන තුරු සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීමේ කාර්යය සඳහා කළමනාකරණ සංස්ථාවේ සභාව විසින් දිගටම කටයුතු කරුන ලැබිය යුතු ය. ඈවරකරුවකු පත්කිරීමේදී කළමනාකරණ සංස්ථාවේ සභාවේ බලතල අවසන් විය යුතු අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධීක්ෂණයට යටත්ව, කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කිරීමේ කාර්යය සඳහා කළමනාකරණ සංස්ථාවේ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට ඈවරකරුට බලය තිබිය යුතු ය;

(13) කළමනාකරණ සංස්ථාව ගණන් බේරා වසා දමනු ලැබූ විට:-

(අ) සෑම අයිතිකරුවෙකුම කළමනාකරණ සංස්ථාවේ ණය හා බැරකම් සහ ගණන් බේරා වසා දැමීමේ පිරිවැය, ගාස්තු සහ වියදම් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදලක් 20අ වගන්තිය යටතේ ඒ කලින් අයිතිකරුවන් දායකවීමට යටත්වන අනුපාතයටම අනුව කළමනාකරණ සංස්ථාවේ වත්කම්වලින් වලට සැපයීමට යටත් විය යුතු ය; තව ද

(ආ) කළමනාකරණ සංස්ථාවේ යම් වත්කම ඇත්නම් ඒවා කලින් අයිතිකරුවන් අතර 20අ වගන්තිය යටතේ ඒ කලින් අයිතිකරුවන් දායක වීමට යටත් වන අනුපාතයට ම අනුව බෙදා දිය යුතු ය.

(14) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ හෝ කලින් අයිතිකරුවකු ගේ හෝ කලින් උකස්කරුවකුගේ හෝ ඇවරකරුවකුගේ ඉල්ලීම මත සහ කළමනාකරණ සංස්ථාවේ කටයුතු අවසන් කර ඇති බවට සෑහීමකට පත් වීමෙන් පසුව ඇවරකරු නිදහස් කරනු ලැබිය යුතු බවටත්, කළමනාකාරණය සංස්ථාව විසුරුවා හරිනු ලැබිය යුතු බවටත්, අධිකරණය විසින් ආඥාවක් කළ හැකි අතර ඒ ආඥාව මේ නීතිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කිරීමෙන් පසුව හිමිකම් රෙජිස්ට්‍රාර් වරයා විසින් සහාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළේ සහාධිපත්‍ය කොටස් සම්බන්ධයෙන් හිමිකම් නාමලේඛනයේ ඇති වාර්තා ලියාපදිංචිකර අවලංගු කරනු ලැබිය යුතු අතර එසේ අවලංගු කිරීම පිළිබඳව සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට දැනුම් දිය යුතු ය.

(15) මේ වගන්තියෙහි:-

(අ) **"කලින් උකස්හිමි"** යන්නෙන්, අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලක අනු කොටස් වලට බෙදීම මේ වගන්තිය යටතේ අවසාන වීමට පෙරාතුව ම, ඒ අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලේ කොටසක් හෝ සහාධිපත්‍ය කොටසක ලියාපදිංචි උගස් හිමියාව සිටි තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වෙයි.

(අ) **"කලින් අයිතිකරු"** යන්නෙන්, අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලක අනු කොටස් වලට බෙදීම මේ වගන්තිය යටතේ අවසාන වීමට පෙරාතුව ම, ඒ අනු කොටස් වලට බෙදන ලද ගොඩනැගිල්ලේ කොටසක් වූ සභාධිපත්‍ය කොටසක අයිතිකරුවකු සිටි තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"වැරදි හා දණ්ඩන."

21. (1) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යානුකූලව කරන ලද නියමයක් හෝ විධානයක් කඩ කරන හෝ ඒවා අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමෙන් පසු මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර ඒ වරද අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන වරදක් නම් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයක අතිරේක දඩයකටද යටත් විය යුතු ය.

(3) අන්කිසි නීතියකට පටහැනිව කුමක් සඳහන් වුවද මෙම පනත යටතේ වූ සෑම වරදක් ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූල ව හා එහි කාර්යයන් සඳහා සංඥේය වරදක් විය යුතු ය.

(4) සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකු ද සිටි සෑම තැනැත්තකුම, තමාගේ අනුමැතිය හෝ වරදෙහි නිසොල්මන්වීම නොමැතිව ඒ වරද කර ඇති බවත් තම කාර්යවල ස්වභාවය හා එළැඹ තිබූ සියලු කරුණු ගැන සැලකිලිමත් ව තමා විසින් කළ යුතු තිබූ පරිදි ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බවත් ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

"ඉවත් කිරීම."

22. 1970 අංක 12 දරන සභාධිපත්‍ය දේපළ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

"බෙදුම් නඩු පනතේ විධිවිධාන ඇතැම් අවස්ථාවන්හි දී අදාළ නොවීම."

23. ලියා පදිංචි කරන ලද යම් සභාධිපත්‍ය පිඹුරකට අඩංගු යම් ඉඩමකට හෝ ගොඩනැගිල්ලකට බෙදුම් නඩු පනත අදාළ නොවිය යුතු ය.

"නියෝග."

24. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක

කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඒ පළ කිරීමේ දිනයේ හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කෙරෙන යම් පසු දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමැතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ විට, එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බල පැවැත්විය යුතු ය. ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

“මේ පනත වෙනත් නීති අභිභවා බල පැවැත්විය යුතු බව.”

25. අන් කිසි ලිඛිත නීතියට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු ය. ඒ අනුව මේ පනතේ විධිවිධාන හා ඒ අන් නීතියේ විධිවිධාන අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවක මේ පනතේ විධිවිධාන ඒ අන් නීතිය අභිබවා බල පැවැත්විය යුතු ය.

“අර්ථ නිරූපණය.”
[§ 1982 අංක 45, (12)]
[§ 2003 අංක 39, (41)]

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි:-

“අතිරේක කොටස” යන්නෙන් වෙනම අයිතිය සඳහා අදහස් කරන ලද කොටසක් අදහස් වන අතර යම් කාර්යයක් සඳහා යම් නිශ්චිත සහාධිපත්‍ය කොටසක හෝ සහාධිපත්‍ය කොටස් වලට අදාල වේ;

“අනුකොටස් වලට බෙදූ ගොඩනැගිල්ල” යන්නෙන්, අනුමැතිය දීම සඳහා තත්කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක අඩංගු යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි වැඩි ගණනක් අදහස් වේ;

“අයිතිකරු” යන්නෙන් ඉඩම අනු කොටස්වලට බෙදීමට පෙරාතුව එහි අයිතිකරු ව සිටි තැනැත්තා අදහස් වේ;

“ඉඩම් කොටස” යන්නට, යම් බුක්තියක ඉඩම් කොටසක් යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් යම් අයිතිකරුවකු විසින් සාධාරණ ලෙස භුක්ති විඳිනු ලබන ඉහළ අවකාශයක් සහ (1973 අංක 4 දරණ පතල් සහ වනසම්පත් නීතියේ අර්ථානුකූල

වූ ඛනිජ සම්පත් හැර) පොළොව මතුපිටට යටින් ඇති සියලු ද්‍රව්‍ය පොළොවෙන් මතුපිටට රැගෙන එනු ලැබුව ද, එසේ නැති වුවද ද්‍රව්‍යය සහ යම් බුදලයක් හෝ එහි සම්බන්ධතාවයක් අදහස් වේ; [§ 2003 අංක 39, (41) 18]

~~**"ඒකකය"** යන්නෙන් තනි ඒකකයක් ලෙස සභාධිපත්‍ය පිඹුරක දක්වා ඇත්තාවූ ද එක් මහලක හෝ මහල් වැඩි ගණනක ගොඩනැගිල්ලක එක් මහලක් හෝ මහල් වැඩි ගණනක් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අඩංගු වුවද එක් කාමරයකින් හෝ කාමර වැඩි ගණනකින් යුක්තව තනි පාවිච්චිය සඳහා සැලසුම් කරන ලද්දාවූද සභාධිපත්‍ය පිඹුරක වෙනම ඒකකයක් වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද නිශ්චිත ඉඩ ප්‍රමාණයක් අදහස් වන අතර අතිරේකයක් ලෙස එවැනි පිඹුරක නිශ්චිතව දක්වා ඇති ඒකකයක් ඊට ඇතුළත් වේ.එහෙත් ඒ නිශ්චිත ඉඩ ප්‍රමාණය සිට මාර්ගයකට යා හැකි හෝ මාර්ගයකට යොමු වූ පොදු ප්‍රදේශයකට කෙලින්ම පිටවීමේ මඟක් තිබිය යුතු අතර ඒ ඉඩ ප්‍රමාණය ඔස්සේ ඒ ආකාරයෙන්ම වූ අන්කිසි අවෘත්ත ඉඩ ප්‍රමාණයකට යා නොහැකි විය යුතු ය;~~

"ඒකකයේ අයිතිකරු" යන්නෙන්, තත්කාලයේ ඒකකයක නිදහස් බුක්තියට අයිතියක් ඇති ඒකකයේ ලියාපදිංචි අයිතිකරු හෝ බදු අයිතියක් ඇති කර ඇති අවස්ථාවක දී එකී බදු අයිතිය ඇති කිරීම ලියාපදිංචි කිරීමේ දිනයේ සිට ගණන් බලනු ලැබිය යුතු අවුරුදු විස්සකට නොඅඩු ගතවූ කාලයක් ඇති, ඒ ඒකකයේ බදු අයිතිය ලියාපදිංචි අයිතියකරු අදහස්

වේ;

"ඒකමතික යෝජනා සම්මතය" යන්නෙන්, මේ පනතින් හෝ ඒ යටතේ පැවරුණු ඡන්දය පාවිච්චි කිරීමේ බලය පාවිච්චි කිරීමට හිමිකම් ඇති සියලු තැනැත්තන් යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේදී පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයන් මගින් පැමිණ සිටින කළමනාකරණ සංස්ථාවේ නිසි පරිදි කැඳවන ලද රැස්වීමකදී ඒකමතිකව සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් අදහස් වේ;

"අනවසර ඉදිකිරීම්" යන්නෙන්, ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමට නීතිය මගින් බලය පවරා ඇති බලධාරීන්ගෙන් වලංගු අවසර පත්‍රයක් නොමැතිව හෝ අදාළ සභාධිපත්‍ය දේපළ සඳහා අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්ම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයේ දක්වා ඇති යම් නියම හෝ කොන්දේසි වලට පටහැනිව, සභාධිපත්‍ය කොටසට හෝ ඒ සභාධිපත්‍ය කොටසේ යම් සහායක කොටසක කරන ලද යම් වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද පොදු අංගෝපාංග වලට කරන ලද යම් වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් ද සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ ඉදිකර ඇති ඉඩම් කොටසේ යම් කොටස් කිරීමක් හෝ නැවත බෙදීමක් ද, සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ ඉදිරි ඉදිකර ඇති ඉඩම් කොටස මත ව්‍යුහයන් හෝ වෙනත් තැනීම් කටයුතු ඉදිකිරීම්, ඒ ඉඩම් කොටසට ඉහලින් හෝ ඊට පහළින් ගොඩනැගිල්ලෙන් පිටතට ඉදිකිරීම් කටයුතු කිරීම හෝ ඉඩම් කොටස

හෝ යම් ගොඩනැගිල්ලක් හෝ යම් ව්‍යුහයක් භාවිතා කරනු ලබන පරමාර්ථය වෙනස් කිරීම අදහස් වේ;

“කළමනාකරණ සංස්ථාව” යන්නෙන්, සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති සම්පූර්ණ කළ සහ නැවත බෙදා වෙන්කළ ගොඩනැගිලි එකක් හෝ වැඩි ප්‍රමාණයකට අදාළව නැතහොත් අර්ධ සහාධිපත්‍ය පිඹුරක පෙන්නුම් කර ඇති අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි එකක් හෝ ඊට වැඩි ගණනකට අදාළව ඒගොඩනැගිලි සඳහා පිහිටවනු ලැබූ කළමනාකරණ සංස්ථාව අදහස් වේ; [§ 2003 අංක 39, (41) 15]

“කොටස් ඒකකය” යන්නෙන්, සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් වන විට ‘‘අයත් කොටසේ කොටස’’ යන්නෙන්, සහාධිපත්‍ය කොටසේ අගයට අනුව ඒ සහධිපත්‍ය කොටස සඳහා තීරණය කරනු ලැබුවා වූ ද සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ හෝ තාවකාලික සහධිපත්‍ය පිඹුරේ සටහන් කර ඇති උපලේඛනයේ කොටස ලෙස පෙන්නුම් කර ඇති වූ ද අයත් කොටසේ කොටසක් අදහස් වේ;

“ගොඩනැගිල්ල” යන්නට අඩ වශයෙන් සම්පූර්ණ කරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ, අදාළ වන අවස්ථාවකදී, අනුමැතිය දීම සඳහා තත්කාලයේ වගකිවයුතු අධිකාරිය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද යම් සහාධිපත්‍ය හෝ අර්ධ සහාධිපත්‍ය හෝ තාවකාලික සහාධිපත්‍ය අනු කොටස්වලට බෙදීමේ පිඹුරක

පෙන්නුම් කර හෝ නිශ්චිතව දක්වා ඇති මහලක් ඇතුළත ගොඩනැගීමට ඇති යම් ගොඩනැගිල්ලක් ඇතුළත් වේ;

"පොදු අංගෝපාංග" යන්න:-

(අ) අනුමතය දීම සඳහා තත්කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද යම් පිඹුරක අඩංගු යම් සභාධිපත්‍ය දේපළක් හෝ අර්ධ සභාධිපත්‍ය දේපළක් හෝ තාවකාලික සභාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වූ විට, තත්කාලයේ සභාධිපත්‍ය හෝ අර්ධ සභාධිපත්‍ය හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුරෙහි දක්වා ඇති යම් සභාධිපත්‍ය කොටසකට අඩංගු නොවන ඉඩම් කොටසේ ප්‍රමාණය එයින් අදහස් වේ; තවද

(ආ) සභාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුරක යම් සභාධිපත්‍ය කොටසක අඩංගු ලෙස නිශ්චිතවම අන්‍යාකාරයෙන් විස්තර කර සහ ඒසභාධිපත්‍ය කොටසට අඩංගු කළහැකි ලෙස දක්වා ඇත්නම් මිස, ඊට:-

(i) ගොඩනැගිල්ලේ හෝ ගොඩනැගිලිවල අත්තිවාරම්, කුළුණු, මහා බාල්ක, බාහිර බාල්ක, රුකුල්, ප්‍රධාන බිත්ති, පියසි, බිත්ති, ශාලා, කොරිඩෝර, තරප්පු, සෝපාන මාර්ග, ගිනි කපොලු, ඇතුල්වීමේ දොරටු හා පිටවීමේ දොරටු;

(ii) වා,හන නැවතුම් භූමි විනෝද හෝ ප්‍රජා පහසුකම්, උද්‍යාන, වාහන නතර

කිරීමේ භූමි, පියසි සහ ගබඩා භූමි;

(iii) බලය, ආලෝකය, ගෑස්, උණු සහ ඇල්වතුර, තාප සම්පාදනය, ශීතකරණ හා වායුසමීකරණ, දුරකථන, ගුවන්විදුලි, රෙඩිෆියුෂන්, කුණු කසළ ඉවත් කිරීම සහ වාෂ්පීකරන යන්ත්‍ර;

(iv) එස්කැලේටර්, ලිෆ්ට්, ටැංකි, පොම්ප, මෝටර්, පංකා, සම්පීඩක, ප්‍රණාල හා සාමාන්‍යයෙන් පොදු පාවිච්චිය සඳහා පවත්නා සියලු උපකරණ හා සවිකිරීම්;

(v) ආරක්ෂක භටයන්, ආරක්ෂකයන් සහ මුරකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වූ ස්ථාන;

(vi) අනුමැතිය දීම සඳහා තත්කාලයේ වගකිවයුතු අධිකාරිය විසින් අනුමත කරන ලද, සහාධිපත්‍ය අර්ධ සහාධිපත්‍ය හෝ තාවකාලික දේපල සංවර්ධනය සඳහා වූ යම් සැලැස්මක පොදු අංගෝපාංග වශයෙන් විස්තර කරනු ලැබ ඇති සියලු පහසුකම් සහ සහාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරේ හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරේ ලකුණු විස්තරයේ පොදු අංගෝපාංග වශයෙන් දක්වා ඇති සියලු පහසුකම්;

(vii) සහාධිපත්‍ය දේපල ට හෝ අර්ධ සහාධිපත්‍ය දේපලට හෝ තාවකාලික සහාධිපත්‍ය දේපල ට අනුබද්ධ මාර්ග හා ප්‍රවේශයන් ද, කාණු හා අගල් ද,

පටු මාර්ග ද, උද්‍යාන ද, ක්‍රීඩා භූමි සහ වෙනත් විවෘත භූමි ප්‍රදේශ ද ඇතුළුව පොදු අංගෝපාංග පැවැත්මට හා නඩත්තුවට සහ ඒවායේ සාධාරණ හා පොදු පාවිච්චියට හා ආරක්ෂාවට අවශ්‍ය වූ හෝ එය පහසු කරන්නාවූද යම් සභාධිපත්‍ය කොටසකට අඩංගු නොවන්නා වූ ද ඉඩම් කොටසේ සියලු වෙනත් කොටස් ඇතුළත් වේ.

"සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" යන්නෙන්, 1973 අංක 10 දරන සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අදහස් වේ;

"බැඳීම" යන්නට:-

(i) ඒ ඉඩමේ උකසක් හෝ පාර්ශවකරුවන්ගේ ක්‍රියාවෙන් හෝ නීතිය ක්රියාත්මක වීමෙන් පැනනගින එහි අසීමිත සම්බන්ධතාවක්;

(ii) ඉඩමේ බද්දක් හෝ එහි යම් සම්බන්ධතාවක්;

(iii) ඉඩමේ පරවශතාව හෝ එය බැඳෙන සීමා කිරීමේ කොන්දේසියක්; හා

(iv) ඉඩම පැවරීම හෝ ආපසු පැවරීම සඳහා වූ හෝ ඉඩම උගස් කිරීම හෝ බදු දීම සඳහා වූ එකඟවීමක්;

"මහල" යන්නෙන්, බිම මතුපිට හෝ ඉන් පහළ හෝ ඉහළ හෝ බිම මතුපිටින් අර්ධ

වශයෙන් පහළ හෝ ඉහළ හෝ යම් හැඩයක ඉඩ ප්‍රමාණයකින් යුක්ත වන්නාවූ ද, මිනුම් විස්තර කර ඇත්තා වූ ද යම් ඉඩම් ප්‍රමාණයක් අදහස්වේ;

"සහතිකවීම" යන්නට යම් පැවරීමක්, බද්දක්, බැඳීමක්, උගසක් හෝ මේ පනත යටතේ සතුකිරීම සඳහා වූ වෙනත් යම් ඉල්ලීමක් අදහස් වේ;

"සහාධිපත්‍ය අනු බෙදුම" යන්නට, යම් කොටසක් වෙනත් යම් කොටසක් ඇති මහලක වුවද නොවුවද ඒකක එකකට හෝ වැඩි ගණනකට අඩංගු ඉඩමේ අනු බෙදුමක් ද ඇතුළත් වේ;

"සහාධිපත්‍ය පිඹුර" යන්නෙන්:-

(අ) සහාධිපත්‍ය පිඹුරක් ලෙස නමේ හෝ ශීර්ෂයේ විස්තරකර ඇති;

(ආ) මහල් දෙකක් හෝ ඊට වැඩි ගණනක ට බෙදා වෙන්කර ඇති වූද, සහාධිපත්‍ය කොටස් දෙකක් හෝ ඊට වැඩි ගණනක ට බෙදා වෙන්කර ඇති වූද, සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් හෝ කොටස් වලට නැවත වෙන් කළ හැකි එක් මහලක් සහිත එක ගොඩනැගිල්ලකින් සමන්විත වන ඉඩම් කොටසක් සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පමණක් පෙන්නුම් කරන; සහ

(ඇ) (5)වන වගන්තියේ දක්වා ඇති තොරතුරු අන්තර්ගත, සහාධිපත්‍ය දේපළට.

"තාවකාලික සහාධිපත්‍ය පිඹුරක්" යන්නෙන්:-

(අ) තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් ලෙස නමේ හෝ ශීර්ෂයේ විස්තරකර ඇති;

(ආ) ඉඩම් කොටසක් සහ ඉදිකිරීමට යෝජිත සහ කොටස්වලට නැවත වෙන්කළ හැකි යම් ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් පෙන්නුම් කරන;

(ඇ) (5) අ.වන වගන්තියේ ඇති විස්තර ඇතුළත් වන තාවකාලික සහාධිපත්‍ය දේපළක පිඹුරක් අදහස් වේ.

"සහාධිපත්‍ය කොටස" යන්නෙන්, සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සහාධිපත්‍ය පිඹුරක ස්වාධීන කොටසක් ලෙස පෙන්නුම් කර ඇති වූද මහල් එකකට වැඩි ගණනකින් යුත් ගොඩනැගිල්ලක එක් මහලක හෝ එකකට වැඩිමහල් ගණනක හෝ පිහිටියාවූ ද කාමර එකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන්නා වූ ද වෙනම පාවිච්චි කිරීම සඳහා සැලසුම් කරනු ලැබුවා වූ ද වෙන් වශයෙන් වූ සහාධිපත්‍ය කොටසක් ලෙස පෙන්නුම් කර ඇත්තා වූ ද අර්ථකථනය කරන ලද ඉඩ ප්‍රමාණයන් අදහස් වේ;

"අපේක්ෂිත ගැනුම්කරුවකු" යන්නෙන්, සහාධිපත්‍ය දේපළක හෝ අර්ධ

සහාධිපත්‍ය දේපළක හෝ තාවකාලික සහාධිපත්‍ය දේපළක අයිතිකරුවකු ගෙන් සහාධිපත්‍ය කොටසක් හෝ තාවකාලික සහාධිපත්‍ය කොටසක් මිලදී ගැනීමට එකඟ වෙමින් විකිණීම සඳහා වූ ගිවිසුමකට පාර්ශවකරුවකු වන තැනැත්තෙක් අදහස් වේ;

"පිළිගත් මූල්‍ය ආයතන" යන්නෙන්:-

(අ) 1988 අංක 30 දරන බැංකු පනත අර්ථානුකූලවූ "බලපත්‍රලාභි වාණිජ බැංකුවක්" හෝ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්";

(ආ) අංක 78 දරණ මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති යම් මූල්‍ය සමාගමක්;

(ඇ) 401 වන පරිච්ඡේදය වන ජාතික නිවාස පනත යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි කර ඇති ගොඩනැගිලි සමිතියක්;

(ඈ) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; හෝ [§ 1982 අංක 45, (13)] [§ 2003 අංක 39, (41)]

(ඉ) වෙනත් යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටවනු ලැබූ යම් බැංකුවක් අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්" යන්නෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

යටතේ පත්කරනු ලැබුවා වූ ද සභාධිපත්‍ය දේපළ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළ හෝ තාවකාලික සභධිපත්‍ය දේපළ `පිහිටි ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කය විෂයෙහි බලය ඇති වූ ද හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

"අර්ධ සභාධිපත්‍ය පිඹුර" යන්නෙන්:-

(අ) එහි මාතෘකාවේ හෝ ශීර්ෂයේ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලෙස විස්තර කර ඇත්තා වූ ද;

(ආ) එයට ඇතුළත් ඉඩම් කොටසේ සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක, මහල් එකකින් යුක්ත අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද සභාධිපත්‍ය කොටස් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට නැවත බෙදනු ලැබිය හැකි වූ ද, අනාගතයේදී මහල් එකක් හෝ කීපයක් ඉදි කිරීම සඳහා ඉඩ සලසා ඇත්තාවූද, නැතහොත් කොටස්වලට වෙන් කළ හැකි මහලකින් සමන්විත අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් පෙන්නුම් කරන;

(ඇ) (5) ආ. වන වගන්තියේ දක්වා ඇති විස්තර අඩංගු වූ;

(ඈ) මනුෂ්‍ය වාසයට සුදුසු වූ ද සම්පූර්ණයෙන් සාදා නිම කරනු ලැබුවා වූ ද සභාධිපත්‍ය කොටස් එකකට වැඩි ප්‍රමාණයක් ඇත්තාවූද;

කොටසක් සම්පූර්ණ කරන ලද සභාධිපත්‍ය දේපළක පිඹුරක් අදහස් වේ.

27. 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන, අවස්ථාවෝචිත පරිදි යම් පළාතකට, පරිපාලන දිස්ත්‍රික්කයට, හෝ පරිපාලන කොට්ඨාශයකට අදාල වීම ව්‍යාප්ත කරමින් එකී පනතේ 1වන වගන්තිය යටතේ නියමයක් කරනතුරු, ඉහත කී එම පළාතක පරිපාලන දිස්ත්‍රික්කය හෝ පරිපාලන කොට්ඨාශය තුල පිහිටි අවස්ථාවෝචිත පරිදි යම් සහාධිපත්‍ය දේපළක්, තාවකාලික සහාධිපත්‍ය දේපළක් හා අර්ධ සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වූ:- **"සැක දුරුකිරීම."** [§ 2003 අංක 39, (44)]

(අ) සහාධිපත්‍ය පිඹුරක් තාවකාලික සහාධිපත්‍ය පිඹුරක් හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක්;

(ආ) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක, ලියාපදිංචි තාවකාලික සහාධිපත්‍ය පිඹුරක හෝ ලියා පදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක සංශෝධන පිඹුරක්;

(ඇ) ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක හෝ ලියා පදිංචි අර්ධ සහාධිපත්‍ය පිඹුරක නැවත බෙදීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිඹුරක්;

මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ලියාපදිංචි කිරීම සහ ඒ සම්බන්ධයෙන්, (117 අධිකාරිය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත අදාළ විය යුතු බව සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

"අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව."
[§ 2003 අංක 39, (45)]

28. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

[§ 1982 අංක 45, (13)]
[§ 2003 අංක 39, (42)]

පළමු වන උපලේඛනය
(20ආ සහ 20 ඕ වගන්ති)
කළමනාකරණ සංස්ථාව

1. යම් නිශ්චිත කළමනාකරණ සංස්ථාවකට මේ උපලේඛනය අදාල කිරීමේදී -

"සංස්ථාව" යන්නෙන් ප්‍රස්තුත කළමනාකරණ සංස්ථාව අදහස් වේ ;

"සභාව" යන්නෙන් සංස්ථාවේ සභාව අදහස් වේ ;

"මහ සභාව" යන්නෙන් සංස්ථාවේ මහ සභාව අදහස් වේ ;

"අයිතිකරු" යන්නෙන් සංස්ථාවේ සාමාජිකයකු වන සභාධිපත්‍ය කොටසක අයිතිකරු අදහස් වේ ;

2. සංස්ථාවේ සංස්ථා නාමය "අංක දරන සභාධිපත්‍ය පිඹුරේ හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරේ කළමනාකරණ සංස්ථාව" විය යුතු අතර මෙහි දැක්විය යුතු අංකය අදාල සභාධිපත්‍ය පිඹුරෙහි හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුරෙහි අනුක්‍රමික අංකය විය යුතු ය.

3. (1) මේ ඡේදයේ විධිවධාන වලට සහ පනත යටතේ සාදන ලද යම් නියෝග වලට යටත්ව, සභාව, එක් එක් වාර්ෂික මහසභා රැස්වීමේ දී තෝරා පත් කර ගනු ලැබිය යුතු වූ ද ඊළඟ වාර්ෂික මහ සභා රැස්වීමේදී ධූරය දැරීම නතර කළ යුතු වූ ද අයිතිකරුවන් තුන් දෙනෙකුට නො අඩු සහ දාහතර දෙනෙකුට නොවැඩි ගණනකින් යුක්ත විය යුතු ය.

(2) අයිතිකරුවන් තිදෙනෙකුට වැඩි නොවූ පිරිසක් ඇති අවස්ථාවක, සභාව සියළු අයිතිකරුවන්ගෙන් සමන්විත යුතු ය.

(3) සභාව සියළු අයිතිකරුවන්ගෙන් සමන්විත වන අවස්ථාවක හැර, සංස්ථාව විසින් කවර හෝ වෙලාවක අති විශේෂ මහ සභා රැස්වීමකදී යෝජනා සම්මතයක් මගින් සභාවේ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කර ඊළඟ වාර්ෂික මහ සභා රැස්වීම තෙක් ධූරය දැරීම සඳහා වෙනත් අයිතිකරුවකු පත් කළ හැකිය.

(4) සභාවේ සාමාජිකයකු විසින් ස්වකීය අත්සන යටතේ වූ ද සංස්ථාව අමතන්නා වූ ද ලියවිල්ලක් මගින් කවර හෝ වේලාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස් විය හැකිය ;

(5) මේ ඡේදයේ (1) වන හෝ (3) වන අනු ඡේද ක්‍රියාත්මක වීමෙන් හැර අන්‍යාකාරයකින් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවකදී ඉතිරි සාමාජිකයන් විසින් ඊළග වාර්ෂික මහ සභාව තෙක් සාමාජිකයකු වීම සඳහා තවත් අයිතිකරුවකු පත් කළ හැකිය.

(6) සභාවේ සාමාජිකයන් නැවත තෝරා පත් කර ගැනීම හෝ නැවත පත් වීම සඳහා සුදුස්සන් විය යුතු ය.

4. සභාව විසින් සුදුසු යයි අදහස් කරනු ලබන වේලාවක දී, ස්ථාන වල දී සහ කාල පරිච්ඡේද වලට වරක් රැස් විය යුතු ය.

එසේ වුවද රැස්වීම් සඳහා දිනයක් නියම කොට

එසේ නියම කරන ලද දිනය පිළිබඳ දින හතකට නොඅඩු කාලයක දැන්වීමක් අනෙකුත් සාමාජිකයන්ට දීමෙන් සභාවේ යම් සාමාජිකයකු විසින් සභාවේ රැස්වීමක් කැඳවිය හැකිය.

5. (1) එක් අයිති කරුවකු පමණක් සිටින අවස්ථාවකදි හැර, සභාවක රැස්වීමක් සඳහා වූ ගණපූරණය :-

(අ) සාමාජිකයන් හතර දෙනෙකුට නොවැඩි ගණනක් සිටින අවස්ථාවක දෙදෙනෙකු විය යුතු ය ;

(ආ) සාමාජිකයන් පස් දෙනෙකු හෝ හය දෙනෙකු සිටින අවස්ථාවක, තිදෙනෙකු විය යුතු ය ;

(ඇ) සාමාජිකයන් හත් දෙනෙකු හෝ අට දෙනෙකු සිටින අවස්ථාවක, හතරදෙනෙකු විය යුතු ය ;

(ඈ) සාමාජිකයන් නව දෙනෙකු හෝ දහ දෙනෙකු සිටින අවස්ථාවක, පස් දෙනෙකු විය යුතු ය ;

(ඉ) සාමාජිකයන් එකොළොස් දෙනෙකු හෝ දොළොස් දෙනෙකු සිටින අවස්ථාවක, හය දෙනෙකු විය යුතු ය ;

(ඊ) සාමාජිකයන් දහතුන් දෙනෙකු හෝ දාහතර දෙනෙකු සිටින අවස්ථාවක, හත් දෙනෙකු විය යුතු ය.

(2) රැස්වීම් වලදී මතු වන ප්‍රශ්න සාමාන්‍ය බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(3) සභාවක සෑම රැස්වීමකම මූලාසනය, සභාවේ රැස්වීමේ පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතරින් තෝරා පත්කර ගත යුතු සභාපති වරයෙකු විසින් දැරිය යුතු අතර ඔහුට ඔහුගේ මුල් ඡන්දය මෙන්ම තීරක ඡන්දයක්ද තිබිය යුතු ය.

(4) මේ ඡන්දයට යටත්ව, සභාව වසින් රැස්වීම් වලදී අනුගමන කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින්ම විධිමත් කර ගත හැකිය.

6. මහාසභා රැස්වීමකදී සංස්ථාව විසින් පනවන ලද සීමාවකට හෝ කරන ලද විධානයකට යටත්ව සභාව විසින්: -

(අ) එහි බලතල වලින් යමක් ක්‍රියාත්මක කිරීම හෝ එහි කාර්ය අතුරින් යමක් ඉටු කිරීම එහි එක් සාමාජිකයකුට හෝ සාමාජිකයන් වැඩි ගණනකට පැවරිය හැකිය;

(ආ) එම පැවරීම කවර හෝ වේලාවක ප්‍රත්‍යාදිෂ්ට කළ හැකිය.

7. සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් සුදුසු යැයි සභාව විසින් අදහස් කරනු ලබන අනුයෝජිතයන් සහ සේවකයන් සංස්ථාව වෙනුවෙන් සහ ඒ සඳහා සභාව විසින් සේවයේ නියුක්ත කර ගත හැකිය.

8. (1) සභාව විසින් එහි කටයුතු පිළිබඳ වාර්තා තැබිය යුතු අතර මහ සභා රැස්වීම් වල වාර්තා තැබීමට සැලැස්විය යුතු ය.

(2) සභාව විසින්: -

(අ) සභාවට ලැබුණු සහ සභාව විසින් වියදම් කරන ලද සියලු මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන්, එම ලැබීම සහ වියදම් සිදු වූයේ කවර කරුණු සම්බන්ධයෙන්ද යන වග සඳහන් කෙරෙන නිසි ගිණුම් පොත් තැබීමට සැලැස් විය යුතු ය; තවද

(ආ) සභාධිපත්‍ය කොටසක අයිතිකරුවකුගේ හෝ උකස් හිමියකුගේ (හෝ එහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකුගේ) ඉල්ලීම පිට, ගිණුම් පොත් සියළු සාධාරණ වේලා වලදී පරීක්ෂා කරනු ලැබීමට ඉඩ සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ සියළු මුදල් පිළිබඳව සංස්ථාවේ ආදායම හා වියදම පිළිබඳව ද නිසි ගිණුම් සභාව විසින් එක් එක් වාර්ෂික මහ සභා රැස්වීම සඳහා පිළියෙල කළ යුතු ය.

(4) සභාව විසින් පත් කරන ලද විගණකවරුන් විසින් වාර්ෂිකව සංස්ථාවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(5) සභාවේ මහ සභා රැස්වීමෙන් පසුව සභාව විසින්:-

(අ) මහ සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද සංස්ථාවේ විගණනය කරන ලද ගිණුම් වේ නම් ඒවායේ ;

(ආ) මහ සභා රැස්වීමේ දී සම්මත කරන ලද යෝජනා සම්මතයේ ; සහ

(ඇ) මහ සභා රැස්වීමේ වාර්තාවේ

සහතික කළ සත්‍ය පිටපත් පොදු පහසුකම් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

(6) පොදු පහසුකම් මණ්ඩලයට හෝ මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය දෙන ලද යම් තැනැත්තෙකුට, සංස්ථාවේ ගිණුම් පිළිබඳ සහ වෙනත් වාර්තා වලට සම්පූර්ණ හා නිදහස් ප්‍රවේශයත් එවැනි යම් ගිණුම් පිළිබඳව වූ හෝ වෙනත් වාර්තා වල පිටපත් හෝ උධෘත ලබා ගැනීමේ අවසරයක් සභාව විසින් දිය යුතු ය.

(7) පොදු පහසුකම් මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින්, යම් සාමාජිකයකුට, ඒ සාමාජිකයා සන්තකයේ ඇත්තා වු හෝ ඒ සාමාජිකයාට ප්‍රවේශය ඇත්තා වූද මේ පනත යටතේ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය විසින් හෝ එකී බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් අදහස් කරනු ලබන්නා වූ ද තොරතුරු මණ්ඩලයට ඉදිරිපත් කළ හැකිය.

9. (1) ගිණුම් සළකා බැලීම සඳහා, සභාව තෝරා පත් කර ගැනීම සඳහා සහ පැන නගින වෙනත් කටයුතු ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් වාර්ෂික මහ සභා රැස්වීමක් පැවැත්විය යුතු ය.

(2) පළමුවන වාර්ෂික මහ සභා රැස්වීම සභාධිපත්‍ය පිඹුර හෝ අර්ධ සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කිරීමෙන් හය මාසයකට පසු පැවැත්විය යුතු අතර, තදනත්තර වාර්ෂික මහා සභා රැස්වීම සෑම වර්ෂයකටම වරක් පැවැත්විය යුතු ය.

එසේ වුව ද එක් වාර්ෂික මහ සභා රැස්වීමක්

දිනයේ සිට ඊළඟ මහ සභා රැස්වීමේ දිනය දක්වා මාස පහළොවකට වඩා ගත නොවිය යුතු ය.

10. (1) වාර්ෂික මහ සභා රැස්වීම නොවන මහ සභා රැස්වීමක් අති විශේෂ මහ සභා රැස්වීමක් යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(2) සභාව විසින් :-

(අ) කොටස් වලින් යටත් පිරිසෙයින් සියයට විසි පහකට එක්ව හිමිකම ඇති අයිතිකරුවන් විසින් කරන ලද අධියාචනයක් මත අති විශේෂ මහ සභා රැස්වීමක් කැඳවිය යුතු ය;

(ආ) සුදුසු යයි එය විසින් අදහස් කරනු ලබන වෙනත් අවස්ථා වල අති විශේෂ මහ සභා රැස්වීමක් කැඳවිය හැකිය.

11. යම් මහ සභා රැස්වීමක් පිළිබඳව, එම රැස්වීම පවත්වන ස්ථානය, දිනය සහ වේලාව ද එහිදී ඉටු කිරීමට අදහස් කෙරෙන කටයුතු ද දැක්වෙන දින හතක දැන්වීමක් සෑම අයිතිකරුවකුට ද අනුකොටස් වලට බෙදූ ගොඩනැගිල්ලේ සභාධිපත්‍ය කොටසක (තමාගේ සම්බන්ධතාවය සංස්ථාවට දැනුම් දුනු ලියාපදිංචි උකස් හිමියකු වන) සෑම ප්‍රථම උකස්කරුවකුටද දිය යුතු ය;

එසේ වුවද, අයිතිකරුවකු හෝ උකස් හිමියකු සම්බන්ධයෙන් මේ ඡේදය අනුව ක්‍රියා කිරීම අහම්බෙන් අත් හැරීමක් නිසා රැස්වීමේ කටයුතු අවලංගු නොවිය යුතු ය.

12. (1) ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති තැනැත්තන් සංඛ්‍යාවේ අර්ධය, මහ සභා රැස්වීමක ගණපූර්ණය විය යුතු ය.

(2) මහ සභා රැස්වීමක් සඳහා නියම කරන ලද වේලාවෙන් පසු, පැය භාගයක් ඇතුළත ගණපූරණයක් නොමැති වුවහොත් රැස්වීම ඊ ළඟ සතියේ එම දිනයේම එම වේලාවේදී සහ ස්ථානයේදී පැවැත්වීම සඳහා අඩාලව කල් තැබුවා විය යුතු ය; තවද අඩාලව කල් තබන ලද රැස්වීමට නියම කරන ලද රැස්වීමෙන් පසු පැය භාගයක් ඇතුළත ඒ රැස්වීම සඳහා ගණපූරණයක් නොවුවහොත් ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම ඇති පැමිණ සිටින තැනැත්තන්ගෙන් ගණපූරණය විය යුතු ය.

13. සෑම මහ සභා රැස්වීමකම මූලාසනය පැමිණ සිටින ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම ඇති අය විසින් ඔවුන් අතුරෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු සභාපති වරයෙකු විසින් දැරිය යුතු ය.

14. (1) ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති තැනැත්තෙකු විසින් ඡන්දය විමසීමක් ඉල්ලා සිටිනු ලැබුවහොත් මිස, මහ සභා රැස්වීමක දී ඉදිරිපත් වන යෝජනා සම්මතයක් අත් එසවීමෙන් තීරණය කළ යුතු ය.

(2) ඡන්දය විමසීමක් ඉල්ලා සිටිනු ලැබුවහොත් මිස, යෝජනා සම්මතයක් අත් එසවීමෙන් සම්මත කරනු ලැබූ බවට සභාපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයක් යෝජනා සම්මතයට පක්ෂව හෝ විපක්ෂව සටහන් කරන ලද ඡන්ද සංඛ්‍යාව හෝ අනුපාතය ඔප්පු කිරීමක් නොමැතිව, ඒ සම්මත වීම පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(3) ඡන්ද විමසීම සඳහා වූ ඉල්ලීමක් ඉල්ලා අස්කර ගත හැකිය.

(4) ඡන්දය විමසීමක් කරනු ලබන අවස්ථාවකදී එය සභාපතිවරයා විසින් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයකින් කළ යුතු අතර එම ඡන්ද විමසීමේ ප්‍රතිඵලය, එම ඡන්ද විමසීම ඉල්ලා සිටිනු ලැබුවේ යම් රැස්වීමකදී ද ඒ රැස්වීමේ යෝජනා සම්මතය ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) (අත් එසවීමෙන් ඡන්දය විමසීමකදී) දෙන ලද ඡන්ද ගණන සමාන වූ අවස්ථාවක දී සභාපතිවරයාට, ඔහුගේ මුල් ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයකට ද හිමිකම් තිබිය යුතු ය.

15. (1) අත් එසවීමකදී හෝ ඡන්දය විමසීමකදී ඡන්දය දීම පෞද්ගලිකව හෝ අත් එසවීමෙන් මගින් කළ හැකිය.

(2) ප්‍රතියුක්තයකු (ඔහු අයිතිකරුවකු වීම අවශ්‍ය නැත) පත් කරන සාධන පත්‍රයක් ඒ පත් කිරීම කරන තැනැත්තාගේ හෝ ඔහුගේ ඇටෝර්නි බල කරුගේ අත්සන යටතේ වූ ලියවිල්කින් විය යුතු අතර එම පත් කිරීම මහ සභා රැස්වීමක් හෝ යම් නිශ්චිත රැස්වීමක් සඳහා විය හැකිය.

16. හවුල් අයිතිකරුවකු නොවන සෑම අයිතිකරුවකුටම අත් එසවීමක දී එක් ඡන්දයක් ද ඡන්දය විමසීමක දී ඔහුගේ සභාධිපත්‍ය කොටසට හෝ අර්ධ සභාධිපත්‍ය කොටසට අනුයුක්ත කොටස් ඒකක ගණනට අනුරූප වන ඡන්ද ගණන ද තිබිය යුතු ය.

එසේ වුවද ඒකමතික යෝජනා සම්මතයක් අවශ්‍ය අවස්ථාවක දී හැර අන් අවස්ථාවකදී කිසිම අයිතිකරුවකු, ඔහුගේ සහාධිපත්‍ය කොටසහෝ අර්ධ සහාධිපත්‍ය කොටස වෙනුවෙන් සංස්ථාවේ කළමනාකරණ අරමුදලට ඔහු විසින් ගෙවිය යුතු සියලු දායක මුදල් ගෙවා ඇත්නම් මිස මහ සභා රැස්වීමකදී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

17. (1) හවුලේ පත් කරන ලද ප්‍රතියුක්තයකුගේ මාර්ගයෙන්, හවුල් අයිතිකරුවන් විසින් ඡන්දය දිය හැකිය.

(2) ප්‍රතියුක්තයකු නොමැති විට ඒකමතික යෝජනා සම්මතයක් අවශ්‍ය වූ අවස්ථාවකදී හැර, හවුල් අයිතිකරුවන් ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

එසේ වුවද යම් හවුල් අයිතිකරුවකු විසින් ඡන්දය විමසීමක් ඉල්ලා සිටිය හැකිය.

(3) ඡන්දය විමසීමකදී එක් එක් හවුල් අයිති කරුවකු ඔහුගේ සහාධිපත්‍ය කොටසට හෝ අර්ධ සහාධිපත්‍ය කොටසට අනුයුක්ත, ඔහුගේ එකී සහාධිපත්‍ය කොටසෙහි හෝ අර්ධ සහාධිපත්‍ය කොටසෙහි ඇති සම්බන්ධතාතවට අනුපාතික වන ඡන්ද සංඛ්‍යාවට හිමිකම් ලැබිය යුතු ය. (භාග ගණන් නොසලකා හැරිය යුතු ය)

18. සංස්ථාවේ පොදු මුද්‍රාව, කලින් දෙන ලද සභාවේ බලය ඇතිවද සභාවේ සාමාජිකයන්ට යටත්පිරිසෙයින් දෙදෙනෙකු ඉදිරියේද හැර භාවිතා නොකළ යුතු ය. එම සාමාජිකයන් දෙදෙනා ඒ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍රයට අත්සන් කළ යුතු ය;

එසේ වුවද සංස්ථාවේ සාමාජිකයන් එක්කෙනෙකු පමණක් වන අවස්ථාවක ඔහු පැමිණ සිටීම සහ ඔහුගේ අත්සන පමණක් ප්‍රමාණවත් විය යුතු ය.

දෙවන උපලේඛනය
(20ඇ සහ 20 උ වගන්ති)
ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක අනුකොටස් වලට බෙදූ ගොඩනැගිලි සම්බන්ධ අතුරු ව්‍යවස්ථා
1 වන කොටස

[§ 1982 අංක 45, (13)]
[§ 2003 අංක 39, (43)]

1. (1) අනු කොටස් වලට බෙදන ලද යම් ගොඩනැගිල්ලකට මේ අතුරු ව්‍යවස්ථා අදාළ කිරීමේදී -

"අයිතිකරු" යන්නෙන් ගොඩනැගිල්ලේ වූ සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු අදහස් වේ;

"සහාධිපත්‍ය කොටස" යන්නෙන් ගොඩනැගිල්ලේ ඒකකයක් අදහස් වේ;

"ගොඩනැගිල්ල" යන්නෙන් ලියාපදිංචි සහාධිපත්‍ය පිඹුරක හෝ අර්ධ සහාධිපත්‍ය පිඹුරක අනු කොටස් වලට බෙදන ලද ප්‍රස්තුත ගොඩනැගිල්ල අදහස් වේ;

"සංස්ථාව" යන්නෙන් ගොඩනැගිල්ලේ කළමනාකරණ සංස්ථාව අදහස් වේ;

(2) මේ අතුරු ව්‍යවස්ථාවල දෙවන අතුරු ව්‍යවස්ථාවේ (උ) ඡේදය හැර, (කෙසේ ප්‍රකාශිතව ඇතත්) ඒ සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු ගැන මේ අතුරු ව්‍යවස්ථාවල කර ඇති සඳහනකට සහාධිපත්‍ය කොටසක අයිතිකරුවකු නොවන තැනැත්තෙකු පදිංචිව සිටින සහාධිපත්‍ය කොටසක් සම්බන්ධයෙන් වූ විට එම සහාධිපත්‍ය කොටසේ පදිංචිකරු

ඇතුළත් බව පද සම්බන්ධයෙන් පිළිගැනෙන අවස්ථාවක, ඔහු එසේ ඇතුළත් විය යුතු ය.

2. අයිතිකරුවකු විසින්:-

(අ) පහත සඳහන් කාර්යය සඳහා ඔහුගේ සභාධිපත්‍ය කොටසට සියලු සාධාරණ වේලාවල් තුළදී සහ (දැන්වීමක් කිරීම අවශ්‍ය නොවිය යුතු හදිසි අවස්ථාවකදී හැර) සාධාරණ දැන්වීමක් කිරීමෙන් පසු ඇතුළු වීමට සංස්ථාව සහ එහි අනුයෝජිතයන්ට අවසර දිය යුතු ය :-

I. සභාධිපත්‍ය කොටස පරීක්ෂා කිරීම;
II. වෙනත් යම් සභාධිපත්‍ය කොටසක් හෝ පොදු අංගෝපාංග බුක්ති විදීම සම්බන්ධයෙන් භාවිත වන හෝ භාවිත කළ හැකි මළ නල, පයිප්ප, වයර්, කේබල් සහ ප්‍රණාල නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීම;
III. පොදු අංගෝපාංග නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ අලුත් කිරීම; හෝ
IV. සංස්ථාවේ කාර්ය ඉටු කිරීම හෝ මේ අතුරු ව්‍යවස්ථා හෝ ගොඩනැගිල්ලට බලපාන වෙනත් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම සඳහා හෝ සම්බන්ධයෙන් සාධාරණව අවශ්‍ය විය හැකි යම් වැඩක් හෝ ක්‍රියාවක් කිරීම ;

(ආ) ගොඩනැගිල්ලේ පොදු යහපත තකා වූ වැඩ හැර ඔහුගේ සභාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් කළ යුතු යැයි යම් ආණ්ඩුවේ, මහජන හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් විසින් නියම කරනු ලබන සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ඇතුළු සියලුම වැඩ නොපමාව

කළ යුතු අතර ඔහුගේ සභාධිපත්‍ය කොටස වෙනුවෙන් ගෙවිය යුතු සියලු වරිපනම් සහ වියදම් ගෙවිය යුතු ය ;

(ඇ) තම සභාධිපත්‍ය කොටස අලුත්වැඩියා කර නඩත්තු කළ යුතුවාක් මෙන්ම යුක්ති සහගත දිරායාම් සහ ගෙවීයාම් හා ගින්නෙන්, කුණාටුවෙන්, චන්ඩ මාරුතයෙන් හා ස්වභාවධර්මයේ විපත් වලින් සිදු වන හානි හැර යහපත් අලුත්වැඩියා තත්වයකින් තබා ගත යුතු ය ;

(ඈ) අනෙක් අයිතිකරුවන් හෝ ඔවුන්ගේ පවුල්වල අය හෝ ඔවුන්ගේ අමුත්තන් විසින් පොදු අංගෝපාංග පාවිච්චි කිරීම හා බුක්ති විදීම කෙරෙහි අයුතු ලෙස බලනොපාන ආකාරයෙන් පොදු අංගෝපාංග පාවිච්චි කිරීම සහ බුක්ති විදීම කළ යුතු ය;

(ඉ) වෙනත් යම් සභාධිපත්‍ය කොටසක අයිතිකරුට හෝ ඒ අයිතිකරුගේ පවුලේ අයට පීඩාවක් හෝ අනතුරු දායක තත්වයක් ඇති වන යම් ආකාරයකින් හෝ යම් කාර්යයක් සඳහා තම සභාධිපත්‍ය කොටස පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩ දීම නොකළ යුතු ය ;

(ඊ) සැලසුම අනුමත කිරීම සඳහා තත් කාලයේ වග කිව යුතු අධිකාරිය විසින් අනුමත කරන ලද සැලසුමේ, දක්වා ඇති තම සභාධිපත්‍ය කොටස භාවිත කිරීම පිළිබඳ නියමයන්ට පටහැනි යම් කාර්යයක් සඳහා තමාගේ සභාධිපත්‍ය කොටස පාවිච්චි නොකළ යුතු ය.

(උ) තමාගේ සභාධිපත්‍ය කොටසේ අයිතියේ වෙනසක් හෝ තමාගේ සභාධිපත්‍ය කොටස සම්බන්ධයෙන් වූ තමා දන්නා වෙනත් යම්

ගනුදෙනුවක් සම්බන්ධයෙන් සංස්ථාවට නොපමාව දැනුම් දිය යුතු ය ;

(ඌ) සංස්ථාවේ කළමනාකරණ අරමුදලට ඔහුගේ දායක මුදල් ගෙවීම;

(එ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතනය හෝ වෙනත් යම් අධිකාරියක් හෝ බලපත්‍රලාභියා විසින් සංස්ථාව හරහා සපයනු ලබන ජල සේවා, විදුලි බලය සහ වෙනත් උපයෝගී සේවා විසන්ධි කරනු ලබන විටක, සේවය ඇති කිරීමේ ගාස්තු සහ නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු ඇතුළු සංස්ථාව හරහා සපයනු ලබන ජල සේවා, විදුලි බලය සහ වෙනත් උපයෝගී සේවා වැනි සේවා පරිභෝජනය කිරීම සඳහා සියලු මාසික ගාස්තු ගෙවීම;

3. සංස්ථාව විසින්, සියලුම අයිතිකරුවන්ගේ යහපත සැලසෙන ආකාරයකින්, පොදු අංගෝපාංග පාලනය කිරීම හා පරිපාලනය කිරීම ද ඒවායේ කළමනාකරණය කිරීම ද කළ යුතු ය ;

එසේ වුවද සංස්ථාව විසින්, යම් නිශ්චිත අයිතිකරුවකු සමඟ එකඟත්වයක් ඇති කරගෙන පොදු අංගෝපාංග වල යම් කොටසක් පාවිච්චි කිරීමේ හෝ බුක්ති විඳීමේ තනි අයිතිය හෝ පොදු අංගෝපාංග හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් වූ විශේෂ වරප්‍රසාද ඒ අයිතිකරුට දිය හැකිය.

4. යම් නිශ්චිත අයිතිකරුවකුගේ සහාධිපත්‍ය කොටසට හෝ ඒ සම්බන්ධයෙන් සංස්ථාව විසින් පහසුකම් හා සේවා සැපයීම සඳහා

සංස්ථාව විසින් ඒ අයිතිකරු සමඟ එකඟ වීමකට එළඹිය හැකිය.

5. සංස්ථාව විසින් :-

(අ) සහාධිපත්‍ය දේපලෙහි ඇත්තා වූ ද සහාධිපත්‍ය කොටස් එකකට වැඩි ගණනක් හෝ පොදු අංගෝපාංග බුක්ති විදීම සම්බන්ධයෙන් පාවිච්චි කළ හැකි වූ ද (විදුලි සෝපාන ඇතුලු) උපකරණ සහ සවිකිරීම්, යහපත් වූ ද සේවය සැලැස්විය හැකි වූ ද අලුත්වැඩියා තත්වයකින් නඩත්තු කළ යුතු ය ;

(අඅ) සහාධිපත්‍ය දේපළ හෝ අර්ධ සහාධිපත්‍ය දේපළ සඳහා අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මට පටහැනිව සහාධිපත්‍ය කොටස්වල යම් තනි අයිතිකරුවන් විසින් යම් අනවසර ඉදිකිරීම් සිදුකිරීම වැලැක්වීම;

(අආ) අනුමත ගොඩනැගිලි සැලැස්මට පටහැනිව සහාධිපත්‍ය දේපල ට හෝ අර්ධ සහාධිපත්‍ය දේපල ට සිදු කරන ලද සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් හෝ නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ පළාත් පාලන ආයතනයෙන් ඉල්ලා සිටීම හා එම ආයතනවලට සහාය වීම;

(ආ) හැකි අවස්ථාවලදී, පොදු අංගෝපාංග මත සුදුසු තණ මලු සහ උද්‍යාන පිහිටුවා නඩත්තු කළ යුතු ය ;

(ඇ) සහාධිපත්‍ය කොටස් එකකට වැඩි ගණනක් හෝ පොදු අංගෝපාංග බුක්ති විදීම සම්බන්ධයෙන් භාවිත කරනු ලැබිය හැකි, මළ නල, පයිප්ප, සහ වයර් නඩත්තු කිරීම,

අලුත්වැඩියා කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල) අලුත් කිරීම කළ යුතු ය ;

(ඈ) අයිතිකරුවකුගේ හෝ ඔහුගේ සහාධිපත්‍ය කොටසේ ලියාපදිංචි උකස් හිමියකුගේ ලිඛිත ඉල්ලීම මත, අවස්ථාවෝචිත පරිදි, ඒ අයිතිකරුට හෝ උකස් හිමියාට (හෝ අයිතිකරු හෝ උකස් හිමියා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද තැනැත්තෙකුට) සංස්ථාව විසින් ඇති කරන ලද සියලු රක්‍ෂණ ඔප්පු සහ ඒ ඔප්පු වෙනුවෙන් ගෙවන ලද වාර මුදල් සඳහා වූ අන්තිම කුවිතාන්සි සැපයිය යුතු ය ;

(ඉ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය, පළාත් පාලන ආයතනය, වෙනත් යම් ආයතනයක් හෝ බලපත්‍රලාභියා වැනි සේවා සපයන නියෝජිත ආයතන වෙනුවෙන් අනුයෝජිත ලෙස ක්‍රියාකරමින් සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ට ජල සේවා, විදුලි බලය සහ වෙනත් මහජන උපයෝගීතා සැපයීම සහ එම සේවා පරිභෝජනය කිරීම වෙනුවෙන් ගාස්තු සඳහා හිමිකම් පාමින් මාසික වාර බිල්පත් යැවීම සහ එම ගාස්තු අදාල සහාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගෙන් අයකර ගැනීම සහ එම ගාස්තු අදාල සේවා නියෝජිත ආයතන වෙත යැවීම.

2 වන කොටස

6. අයිතිකරුවකු විසින් :-

(අ) ගොඩනැගිල්ලේ හොඳ නමට හානිකර විය හැකි (නීතිවිරෝධි වන හෝ නොවන) කිසිම කාර්යයක් සඳහා තමාගේ සහාධිපත්‍ය කොටස පාවිච්චි නොකළ යුතු ය;

(ආ) දුම් හෝ දුමාරය හෝ දුර්ගන්ධය ඇති කරන කිසිම ද්‍රව්‍යක් හෝ දෙයක් ඉන්ධන වශයෙන් පාවිච්චි නොකළ යුතු ය;

(ආආ) සභාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි අනුමත ගොඩනැගිලි සැලැස්මට පටහැනිව තම සභාධිපත්‍ය කොටසට යම් වෙනස් කිරීමක් සිදුකිරීම;

(ඇ) අයිතිකරු විසින් තබා ගන්නා ලද කසල භාජන වලට හෝ ගොඩනැගිල්ල සඳහා සපයා ඇති කසල ලිං වලට හැර, පොදු අංගෝපාංග හෝ ඒවායේ යම් කොටසක් මතට යම් කුණු කසල විසි කිරීම හෝ වැටීමට ඉඩ හැරීම නොකළ යුතු ය;

(ඈ) වෙනත් යම් අයිතිකරුවකුට කරදරයක් ඇති කර හැකි යම් සතෙකු ඔහුගේ සභාධිපත්‍ය කොටස තුළ හෝ පොදු අංගෝපාංගවල තබා නොගත යුතු ය.

<u>සටහන්</u>

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2018 අගෝස්තු මස 15 වන දින]

2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2018 අගෝස්තු මස 15 වන දින]

රජයට හෝ රජයේ නියෝජ්‍යායතනයකට අයිති ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට අනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මේ පනත බල පවත්නා කාලසීමාව

2. මේ පනතේ විධිවිධාන මේ පනත ආරම්භ වන දින සිට වසර පහක කාල සීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු ය.

ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම

3. (1) 2009 දෙසැම්බර් 31 වන දිනට පෙරාතුව ඉදිකරන ලද්දා වූද:-

(අ) ජාතික නිවාස කොමසාරිස්වරයා;

(ආ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය;

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය;

(ඈ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව; හෝ

(ඉ) සුනාමි නැවත ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ රජයට අයිති ඉඩම්වල සහාධිපත්‍ය දේපළ ඉදිකරනු ලැබ ඇති රජයේ හෝ වෙනත් යම් නියෝජ්‍යායතනයක්,

විසින් අයිතිය දරනු ලබන්නාවූද විකිණීමෙන්, බදු දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කරයට දීමෙන් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට සන්තකය පවරා දී ඇත්තාවූද සහාධිපත්‍ය දේපළ:-

(i) පළාත් පාලන ආයතන විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් නොමැතිවීම;

(ii) පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් නොමැතිවීම;

(iii) එක් එක් සහාධිපත්‍ය කොටස සඳහා වරිපණම් අංකයක් හෝ වෙනත් සංකේතයක් නොමැතිවීම;

(iv) එම සහාධිපත්‍ය දේපල පළාත් පාලන ආයතනයක් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් වලට අනුකූල නොවීම;

(v) පවතින නීතියට අනුකූලව ඉදිකරනු ලැබ නොමැති

සභාධිපත්‍ය දේපලක් වීම;

(vi) සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබ නොතිබීම.

නොතකා එවැනි සියලු සභධිපත්‍ය දේපලවල පිඹුරු රෙජිස්ටාර්වරයා විසින් 1973 අංක 11 දරණ නිවාස අයිතිකම් පනතේ 6 වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1)වන උප වගන්තිය යටතේ කරන ලද යම් ලියාපදිංචි කිරීමක් සියළු කාර්යන් සඳහා මේ පනතේ විධිවිධාන යටතේ සිදුකරනු ලැබ ඇති ලියාපදිංචිකිරීම ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2)වන උපවගන්තියේ සඳහන් කරන ලද සභාධිපත්‍ය දේපළක අයිතිකරු විසින් සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශයක්, එම සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේ දී රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(4) යම් විශේෂිත සභාධිපත්‍ය දේපළ අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල (එම ඡේද දෙක ද ඇතුළත්ව) නිශ්චිතව සඳහන් කරන ලද ආයතන

වලට අයිති බවටද 2009 දෙසැම්බර් මස 31 දිනට පෙර ඉදිකරනු ලැබ ඇති බවට ද විකිණීමෙන්, බදු දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කරය දීමෙන් යම් තැනැත්තෙකුට සන්තකය පවරා දී ඇති බවටද, ජාතික නිවාස කොමසාරිස්වරයාගේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාගේ, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපතිවරයාගේ, හෝ සහ ඉඩම් සහ ඉඩම් සංවර්ධන විෂය පවරා ඇත්තාවූ අමාත්‍යයවරයාගේ හෝ රජයේ සුනාමි නැවත පදිංචි කරවීමේ වැඩසටහන යටතේ රජයේ ඉඩම් වල යම් සහාධිපත්‍ය දේපළක් ඉදිකිරීම සඳහා වගකිව යුතු වෙනත් යම් රාජ්‍ය නියෝජ්‍ය ආයතනයක ප්‍රධානියකු ගේ අත්සනින් නිකුත් කළ සහතිකයක්, එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂි විය යුතු ය.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි:- **අර්ථ නිරූපණය**

"ජාතික නිවාස කොමසාරිස්වරයා" යන්නෙන් 401ක් වන අධිකාරය වූ ජාතික නිවාස පනත යටතේ පත් කරන ලද ජාතික නිවාස කොමසාරිස්වරයා අදහස්වේ.

"සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" හෝ **"අධිකාරිය"** යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පනත යටතේ පිහිටවන ලද සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අදහස් වේ.

"සහාධිපත්‍ය දේපළ" යන්නෙන් 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අදහස් වන පරිදි සහාධිපත්‍ය දේපල අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වගන්තිය යටතේ නිවාස විෂය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.

"ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" යන්නෙන් 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් ලියා පදිංචි කළ යුතු සහාධිපත්‍ය දේපළ පිහිටා ඇති ලියාපදිංචි දිස්ත්‍රික්කය තුළ අධිකරණ බලය දරන (117 වන අධිකාරිය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ පත්කරන ලද ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා අදහස් වේ.

"ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන්නෙන් 1968 අංක 15 දරණ ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත යටතේ පිහිටවන ලද ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව අදහස් වේ.

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂාව පාඨය බලපැවැත්විය යුතු බව.

5. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.